

# පාවචන න්‍යාය

කොළඹ

ප්‍රාචීන භාෂෝපකාර සමිතිය

විසින්

පණ්ඩිතොපාධි ප්‍රදානයෙන්

පිළිගන්නා ලදී.

අලව්වේ ශ්‍රී රාහුල පරිවෙන්හි

උප ප්‍රධානාචාර්ය

පණ්ඩිත මඩබාවිට ඤාණාවාස

ස්ථවිරයන් විසින්

රචනා කරන ලදී.

කොළඹ

ඇෆ්. ආර්. සේනානායක මැතිනිය

විසින්

පුස්තකාලයන්හි ප්‍රයෝජනය සඳහා

පරිත්‍යාග කිරීම පිණිස

මුද්‍රණය කරවනලදී.

# සංඥාපනය

ප්‍රාචීන භාෂෝපකාර සමිතිය මඟින් පවත්වනු ලබන අවසාන පරීක්ෂණයෙන් එතෙර වන්නන් විසින් පණ්ඩිතෝපාධිය පිණිස පොතක් ලිය යුතුයයි පැණවුණු ව්‍යවස්ථාව අනුව **ත්‍රිපිටක ධර්මය** නිසියාකාර තේරුම් ගැනීමේ පහසුව සලකා **නෙත්තිප්පකරණය** හා එහි අටුවාව ආශ්‍රයකොට ගෙන **"පාවචන න්‍යාය"** නමින් මේ ග්‍රන්ථය නිපදවන ලදී. එසේම මේ පොත **පණ්ඩිතෝපාධි** ප්‍රදානයට සුදුසුයයි සම්මත කරණ ලදී.

එබැවින් මාගේ විශේෂාශීර්වාදය එම **ප්‍රාචීන භාෂෝපකාර** සමිතියට හිමිවිය යුතු බැව් සාතිශය ප්‍රීතියෙන් පළමුකොට සඳහන් කෙරෙමි.

ත්‍රිපිටක දෙශනාව පිළිබඳ මේ **නෙත්ති න්‍යායය** පළමුකොට ප්‍රකාශ කරණ ලද්දේ තථාගතයන් වහන්සේ සැකෙවින් වදාරණ ලද්ද විස්තර වශයෙන් බෙදාලන්නවුන් අතුරෙන් අග තැන්පත් වූවකු හැටියට ජීවමාන බුදුරජාණන් වහන්සේ කෙරෙන් අග තනතුරු ලත් සිවුපිළිසිඹියාපත් **මහාකාත්‍යායන** මහරහතුන් වහන්සේ විසිනි. උන්වහන්සේ විසින් රචනා කරණ ලද ග්‍රන්ථය **"පෙටකොපදෙශය"** සිද **නෙත්තිප්පකරණය** ඉන්පසු යම්කිසි ත්‍රිපිටකධාරි බුද්ධිමතෙකු විසින් **පෙටකොපදෙශය** ආශ්‍රයකොටගෙන රචනාකරණ ලද්දකැයිද සමහරු කියති. **"මහා කච්චානෙන නිද්දිට්ඨා"** යනාදී **නෙත්තිප්පකරණ පාඨ** ඊට සාක්ෂිකොටද දක්වති. එය උන්වහන්සේගේම කෘතියක් විනම් **"මයා නිද්දිට්ඨා"** යි පැවසීම වඩා උචිත වන බැවින් අපිදු ඒ කියමන පිළිගනිමු.

බුද්ධ වචනය නිසිසේ අවබොධ කරගනු කැමැත්තී සියල්ලන් විසින් **නෙත්ති න්‍යාය** සම්බන්ධ පටුතර ඥානයක් ඇතිකර ගතයුත්තේය. බුද්ධ වචනය පිළිබඳ ගැඹුරු ඥානය ඇතිකර ගැනීමට උපකාරවූ න්‍යායය මෙයින් ප්‍රකාශ වන බැවින් මෙය **ධර්ම සඞ්ග්‍රහයක්ම** වන්නේය.

**නෙත්තිප්පකරණය** ළඟ අතීතයෙහි **ත්‍රිපිටකය** හදාරන්නන් කෙරෙන් තරමක් ඈත්ව තිබුණේය. **ප්‍රාචීන භාෂෝපකාර** සමිතියේ අවසාන විභාගයට එය නියමකොට තිබීම එය හදාරන්නවුන් බහුලවීමට අනුබලයක් විය.

බුද්ධ ශාසන මහා ධූර සෙනාපති යන උපාධි නාමයන්ගෙන් විශිෂ්ටවූ **ඇම්. ධර්මරත්න ලක්මිණි පහන් කතුතුමා** විසින් ප්‍රණීතවූ නෙත්ති ප්‍රදීපයද පිටකත්‍රයෙහි සුනිපුණ ඥාණයක් ඇතිව විසූ අසමදර්මාචාර්‍ය පානදුරේ වලපොල ශ්‍රී සද්ධම්මෝදය පරිවෙණාධිපතිව වැඩ විසූ **ත්‍රිපිටක වාගීශ්වරාචාර්‍ය සෝදගොඩ උපසේන** මහා නායක ස්ථවිර ස්වාමීන් වහන්සේ විසින් නෙත්ති න්‍යායය සූත්‍ර වෘත්ති උදාහරණ ක්‍රමයෙන් දක්වා විරචිතවූ **"නෙත්ති රත්නාකර"** නම් ග්‍රන්ථයද උන්වහන්සේ විසින්ම කරණ ලද නෙත්ති සන්නයද මෙය උගනු කැමැත්තවුන්ගේ පහසුව පිණිස මෑත කාලයෙහි විරචිතවූ ග්‍රන්ථයෝය.

යශෝකාන්ත අසමදර්මාචාර්‍ය **සෝදගොඩ උපසේන** මහා නායක ස්වාමීන් වහන්සේද උන්වහන්සේගේ අග්‍ර ශිෂ්‍යව සිටි **පඹුරණුවේ බුද්ධදත්ත** ස්වාමීන් වහන්සේද කෘතගුණ පූජාව මෙහි ලා අනුස්මරණය කෙරෙමි.

එසේම යශෝකාන්ත මහා නායක ස්වාමීන් වහන්සේගේ ශිෂ්‍යයෙකු වූද පානදුරේ ගොරකපොල **විද්‍යාරාජ පිරිවෙන්** අග්‍රශිෂ්‍යයාවූද දැනට මාතම්මන **ජයවර්ධනාරාමාධිපතිව** වැඩ වසන **කාලවානේ සිරි ධම්මාලෝක** පණ්ඩිත ස්ථවිර ස්වාමීන් වහන්සේ මේ කෘතිය සඳහා ගුරූපදේශ දීමෙන්ද මුද්‍රණයෙහිදී ශෝධ්‍ය පත්‍ර බලා දීමෙන්ද කරණ ලද උපකාරය ගෞරවයෙන් සිහිපත් කෙරෙමි.

තවද මෙබඳු ග්‍රන්ථ රචනාවක් කිරීමේ භාග්‍යය ලබාදුන් මාගේ ආචාර්‍යවරයාණන් මේ අවස්ථාවේදී සිහිකිරීම මගේ යුතුකමකි. **ශාසනාභිවෘද්ධිය අපේක්ෂාකොටගෙන** මා පැවිදි කිරීමෙන් **ධර්ම විනයෙහි** හා ශබ්ද ශාස්ත්‍රයෙහි මා හික්මවූ **අලව්වේ ශ්‍රී රාහුල පරිවෙණාධිපති සංඝ ලේඛකාචාර්‍ය සද්ධර්මකීර්ති පූජ්‍ය පණ්ඩිත ශ්‍රී රතනාලංකාර** මහා ස්ථවිරස්වාමීන් වහන්සේ අත්‍යන්ත ගුරු ගෞරවයෙන් ස්මරණය කෙරෙමි. දැනට මෙම රාහුල පිරිවෙන්හි උපාචාර්‍ය පණ්ඩිත **උපාලි ස්ථවිරයන් වහන්සේද** ගල්පොත්තේපොල **සාසනවංශ ස්ථවිරයන්** වහන්සේද උපකෘති පූර්වකව සිහිකෙරෙමි.

මේ පොත රචනාකොට කලක් ගතවුවද මුද්‍රණයෙන් ප්‍රකාශයට නොපමුණුවන ලද්දේ ඒ සඳහා වියදම් කිරීමට ත්‍යාගශීලි උතුමෙකු ඉදිරිපත් කරගැනීමේ පමාව නිසාය.

(මඩබාවිට අපගේ **කණිෂ්ඨ සහෝදරයා** හා ඩී. පී. **ඇල්. අතුකෝරළ මහත්මයා** ඇතුළු හිතවත් කීප පලකගේම අයදුම **පරිදි ඩී. ඇස්. සේනානායක** අග මැතිතුමාගේ කණිෂ්ඨ පුත්‍ර **ආර්.** පී. **සේනානායක** මැතිතුමා වෙත මෙය මුද්‍රණය **කරවීම** සඳහා පවරණ ලදින් එය ප්‍රීති

යෙන් භාරගෙන එතුමාගේ ලොකු මැණියන් වන ඇෆ්. ආර්. සේනානායක මැතිණිය වෙත බාර කරණ ලදුව එතුමිය විසින් මෙයින් පිට පත් 1000 මුද්‍රණය කරවා පුස්තකාලයන්හි ප්‍රයොජනය සඳහා පරිත්‍යාග කිරීමට ඉදිරිපත් වූ බැව් ප්‍රීතියෙන් සඳහන් කෙරෙමි. මෙය අන්‍යයන්ටද ආදර්ශයක් වේවා !

තවද මාගේ දියුණුව සඳහා මුල පටන් ආධාර කාරිවූ අලව්වේ ඇම්. පුංචිබණ්ඩා රාලහාමි ප්‍රධාන සහෝදර මහතුන් ඇතුළු ශ්‍රී රාහුල පරිවෙණස්ථ දායක සභාව හා විශෙෂයෙන් පී. ඇම්. පී. රත්නායක නීතිඥතුමන්ද මෙය මුද්‍රණයෙහිදී විශෙෂ උනන්දුවෙන් ක්‍රියා කළ කොළඹ ඊවර්ඩ් සහ සමාගමේ මහතුන්ද සතුති පූර්වකව සිහි කෙරෙමි.

තවද මේ සත්කෘතියෙන් ජනිත පුණ්‍යය අපවත්වූ මාගේ මව් පියා බන්ධු මිත්‍රාදීන්ට හා සියළු සත්ව සමූහයාටද සැප පිණිස පවතීවායි සමාසංශනය කෙරෙමි. මෙය සර්ව නිර්දොෂවූ කෘතියෙකැයි අපි නොකියමු. මෙහි යම්කිසි ඌනාතිරික්තතාදී දෙෂයක් වේනම් සුධීහු අනුකම්පාවෙන් එය ප්‍රකාශ කිරීමෙන් ධර්ම සඞ්ග්‍රහය කෙරෙත්වා !

නැවත මුද්‍රණය කිරීමේදී මෙය වඩා පිරිසිදුලෙස හා විස්තර ලෙසත් සකස්කොට ප්‍රකාශ කිරීමට බලාපොරොත්තුවෙමි.

මීට,

මඩබාවිට, ඤාණාවාස ස්ථවිර.

ශ්‍රී: බු: ව: 2494 බිනර පුරපසළොස්වක් ලත් සඳු දින
අලව්වේ ශ්‍රී රාහුල පිරිවෙනෝදීය.

# කත්තු සන්දස්සනං.

---

1 ලංකාපර දිසාභාගෙ දිසත්‍රිංසෙකක මීගමුවහයෙ
රම්මෙ හාමිටිගාමාකෙක කෝරලෙ සුප්පතිට්ඨිතෙ

2 සනනීර නාලිකෙරාදි ආරාමුය්‍යාන පන්තිහි
ඛෙත්ත වත්ථූහි නෙකෙහි පුණ්ණ සිත්ථ රාසිහි

3 කූප පොක්ඛරණාදිහි සජ්ජිතො සජ්ජනාකුලො
කුලීනෙහි සසංසග්ගො සුභාසිත රසාකරො

4 මඩබාවිට විඛ්‍යාතො ගාමො සංවිජ්ජතෙවරො
තහිංචම්පසා ආරච්චි මහාසය කුලෙදිතෙ

5 ජාතොවාදස වස්සාහං අගාරස්මානගාරියං
මාතා පිතූ හනුඤ්ඤාතො පබ්බජිං සරණප්පිනො

6 තිජංවනයනං මඤ්ඤූ ආබාල්‍යා අභිපාලසි
සව්‍යාකරණ පාල්‍යාදී භාසාසත්ථෙසු සික්ඛසී

7. සිරි රාහුල විඛ්‍යාත පරිවෙණාධි වාසිනො
තස්ස මාවෙර භූතස්ස පණ්ඩිතොපාධි ධාරිනො

8 ථෙරස්ස සමනුඤ්ඤාය පුරෙ පාණදූරවහයෙ
සිරි සද්ධම්මොදයාඛ්‍ය පරිවෙණාධි වාසිනො

9 වාගීස්සරස්සාපසෙන මහානායක සාමිනො
බුද්ධදත්ත මහා ථෙර සාමිපාදස්ස වන්තිකෙ

10 තත්‍රඞ්ගං ධම්ම විනයං සමුග්ගණ්හිය සාධුකං
මමාචරිය ථෙරස්ස ගරු ගාරවභත්තියා

11 සරණඞ්කර මහාථෙර පාදමාරඤ්ඤ වාසිනං
මහොපජ්ඣාය තම්පත්තං ධුතඞ්ග ගුණ ධාරිනං

12 උපසන්ත මහා ථෙර පාදං ධීරං මහා ගුණං
විමල ධම්ම මහාථෙර සාමිනංච උපාසිතො

13 ජයවඩ්ඪනා රාමස්ස ගාමෙ මාතම්මතාවහයෙ
බහුස්සුතෙ නාධිපෙත පණ්ඩිතොපාධි ධාරිනා

14 ධම්මාලොකාභි ථෙරෙන කතමත්‍රමනුග්ගහං
සුමරන්තා සදනෙදු කතඤ්ඤූ කතවෙදිනො

15 සම්මෙයෙසු අනෙකෙසු සවුයසාමො තතොපරං
ප්‍රාචීන නාගසාගසාර සඞ්ඝාන්‍යා අනුගායතං

16 කාරපන විහාරගසු සාමස්සියමපාපුණිං
සතතබ්බං ගන්ථමේකාංති පණ්ඩිතොපාධිවිඡතා

17 අනුලෝධිකිය මාණන්තිං තස්සා සම්බුද්ධ භාගතෙ
සච්චවාරස්සුගණ්ඨිකි මිතෙ සද්ධම්ම මාමකො

18 පරිවෙණෙ යථාවුත්තෙ ආවෙරනහමුපාගතො
කල්‍යාණාවාස ථෙරෙහං ගසෝදම්කාරිංමුද

19 මමාචරිය පාචෙරා පිතා මතා පිතා මහා
සන්දිඨා චෙව සම්භත්තා මිත්තාමච්චාච බන්ධවා

20 දෙවතා ලොකපාලාච පුඤ්ඤංලද්ධිදංමයා
සම්මදෙවානු මොදිත්වා බුජ්ඣන්තු අමතං පදං

21 දුඃඛකරවිඝ්නමාදි දෙසෙසනිය පණ්ඩිතා
ධම්මතෙඤ්චතාදිසෙකිංචෙව දුක්කරත්තාච බොධකා'ති

සිවම්.

නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස.

---

# පාවචන න්‍යාය

සද්ධම්මං සඞ්ඝං සම්බුද්ධං
වන්දිත්වා තස්ස භාසිතෙ
න්‍යායං සීහල භාසාය
පවක්ඛාමි සමාසතො

## පාවචන විභාගය

මනුෂ්‍ය ලොකයෙහි කලින්කල ශාස්තෘවරයෝ පහළ වෙති. තියුණු කළහැකි මනෙන්ද්‍රිය ඇති මනුෂ්‍යයන් නිසිමග යැවීම පිණිස මොවුහු ලොකයාට අනුශාසනා කෙරෙති.

සමහරු ඔවුන්ගේ අනුශාසනා අසා පැහැද ඔවුන්ගේ ශ්‍රාවක බවට පැමිණ ඒ අනුශාසනා පිළිපදිති තියුණු නුවණැති සමහරු ඔවුන්ගේ අනුශාසනාවන් විවෙචනයද කෙරෙති.

ශාස්තෘවරයාගේ කරුණාව හා නුවණ උසස්වූ තරමට අනුශාසනාව ලොවට පිහිට පිණිස පවතී, උතුම් අනුශාසනාවක් වීනම් එයින් ඇතිවන විශෙෂ පිහිට සලකා ගෙන එය කණින් අසාගෙන සිතින් දරාගෙන අනුනටද උගන්වමින් පර පුරෙන් පර පුරට එය පවත්වා ගෙනයනු ලැබේ. නොනැසී පැවැත්වීම පිණිස පත්වල ලියා පොත් කොට සුරකිනුද ලැබේ.

මනුෂ්‍යයන් අතර දුක නැතිකර දැමීම පිණිසත් සැප ඇති කරලීම පිණිසත් පිළිපැදිය යුතු මග මේයයි ඔවුනට වැටහුණු පරිදි ශාස්තෘවරයෝ ලොවට දෙශනා කෙරෙති.

එහෙත් දුක හා සැප පිළිබඳ තීරණාත්මක අවබොධය සියළු ශාස්තෘවරයන් හටම එක සමානව නොපවතී.

මින් අවුරුදු දෙදහස් පන්සිය තිස් පහකට පමණ පෙර ලොව පහළවූ ගෞතම බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව සර්වතො භද්‍ර වශයෙන් එදා පටන් අද දක්වා සියළු ලෝකයා විසින් පිළිගනු ලබන්නීය.

උන් වහන්සේ සතළිස් පස් වසක් පමණ කාලයක් තුළ ස්වාත්ම සැප විහරණය නොතකා මහා කරුණාවෙන් ලෝකයාට දෙශනා කොට වදාළ උත්තම වචන සමූහයේ සාරාංශය අද දක්වා ඇදුරු පරපුරෙන් නොනැසී පවත්වා ගෙන එනු ලැබේ. මෙය මෙහි පාවචන නමින් අදහස් කරනු ලැබේ. බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය දක්වන වචන පා වචන යයි දත යුත්තේය.

## පාවචනය

පිටක වශයෙන් සූත්‍ර අභිධර්ම විනයයි තුන් **ආ**කාරවේ-**පි**ටක ශබ්දය භාජන පර්‍යායයේ. යම්සේ කපු එම නූල් කපුරෙදි යනමේ කපු වෙසෙස් තුන වෙන වෙන භාජන තුනක අසුරා තැන්පත් කරණ ලදද එපරිද්දෙන්ම බුදුරජාණන් වහන්සේගේ පිරිසිදු වචන සමූහය කොටස් තුන කට බෙදා සූත්‍රාභිධර්ම විනය නාමයෙන් සංග්‍රහ කොට ලොකයාහට හිත පිණිස චිරස්ථායි කොට පවත්වනු ලැබේ.

## සූත්‍ර පිටකය

එයින්. සූත්‍ර ධර්ම දෙශනාවට හේතු හතරක් වූහ. එනම්. **අත්තජ්ඣාසය පරජ්ඣාසය අට්ඨුප්පත්තික පුච්ඡාවාසික යනුයි.** භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන සිව් පිරිස හෝ ක්‍ෂත්‍රිය බ්‍රාහ්මණ ගෘහපති ශ්‍රමණ චාතුර්මහාරාජික තාවතිංස මාර බ්‍රහ්ම යන අටපිරිස හෝ රැස්වූ තැනෙක බුදුරජාණන් වහන්සේ ඒ පිරිස අතුරෙහි නුවණ මුහුකුරා ගිය ජනයාගේ අවබොධය පිණිස යම් යම් ධර්ම ක්‍රමයක් තමන් වහන්සේ විසින් අදහස්කොට දෙශනා කරණලද්ද එය අත්තජ්ඣාසය දෙශනා නම්.

**අත්තජ්ඣාසය** යනු තමන්ගේ අදහස් වශයෙන් පැවතියා යන අර්ථයි.

ඇතැම් විට ශ්‍රාවක පිරිසෙහි වූ ජනයා විසින් දැන ගැනීමට අදහස් කරණ ලද කරුණු බුදුරජාණන් වහන්සේ නුවණින් දැන ඒවා පැහැදිලි කොට දෙශනා කරණ සේක. **එය පරජ්ඣාසය** දෙශනා නම්.

**පරජ්ඣාසය** යනු අනුන්ගේ අදහස් වශයෙන් පැවැතියා යනුයි.

යම් කිසි විවාදාදි කරුණක් පහළවූ විට එය සංසිඳවීමට නැතහොත් යථා තත්වය පැහැදිලි කර දීම පිණිස එය කරුණු කොට ගෙන වදාරණ ලද්දී **අට්ඨුප්පත්තික** දෙශනා නම්. අට්ඨුප්පත්තික යනු උපන් කරුණ මුල්කොට පැවැතියා යනුයි.

බුදුරජාණන් වහන්සේ කරා එළඹ දෙව් මිනිසුන් විසින් විචාළ ප්‍රශ්න යන්ට පිළිතුරු වශයෙන් වදාළ ධර්මය පුච්ඡාවාසික දෙශනා නම්.

ප්‍රශ්නය **අදිට්ඨජොතනා දිට්ඨසංසන්දනා විමති ච්ඡෙදනා අනුමති කථෙතු කම්‍යතා යි**, පස් වැදෑරුම්වේ.

නුදුටු නොදත් දෙය දැන ගැනීම පිණිස හෝ තීරණය කරගැනීම පිණිස කරුණු ලබනුයේ අදිට්ඨජෝතනා ප්‍රශ්නයයි.

තමා විසින් දුටු දැන ගත් දෙය අන්‍ය පඬිවරුන් ගේ මතය සමග සසඳා බැලීම පිණිස කරනු ලබනුයේ දිට්ඨසංසන්දනා ප්‍රශ්නයයි

තමහට උපන් සැකය පසිඳ ගැනීම පිණිස කරනු ලබනුයේ විමතිච්ඡේදනා ප්‍රශ්නයයි

තමාගේ අදහස අනුමත කරවා ගැනීම පිණිස කරණු ලබනුයේ අනුමති ප්‍රශ්නයයි.

තමා දැනගත් දෙය අනුනට කියාදීම පිණිස කරණු ලබනුයේ කථෙතු කම්‍යතා ප්‍රශ්නයයි.

මේ කොයි අන්දමේ හෝ විචාල ප්‍රශ්නයට පිළිතුරුවශයෙන් වදාළ ධර්මය පුච්ඡාවසික දේශනාවයි.

## සූත්‍ර ධර්මයෙහි ලක්ෂණ

අත්ථානං සූචනතො සුවුත්තතො සවනතොථ සූදනතො
සුත්තාණා සුත්ත සභාගතොච සුත්තං සුත්තං ති අක්ඛාතං.

ආත්මාර්ථ පරාර්ථයන් සූචනය කරනහෙයින් (හඟවන හෙයින්) ද මැනවින් කියන ලද හෙයින්ද, ශස්‍යය ඵල ප්‍රසවය කරන්නාක් මෙන් අර්ථයන් ප්‍රසවය (පහළ කිරීම) කරණ හෙයින්ද දෙනු කිරි වගුරු වන්නාක් මෙන් අර්ථයන් වගුරුවන හෙයින්ද අර්ථයන් ත්‍රායනය (රැකීම) කරණ හෙයින්ද සූත්‍රයක් (නූලක්) හා සමාන හෙයින්ද මේ ධර්මය සූත්‍රයයි කියනු ලැබේ.

සූත්‍ර පිටක යට අයත් ධර්මය උගැනීමෙන් දැරීමෙන් විමසීමෙන් මෙලෝ වැඩ පරලෝ වැඩ අත් වැඩ පර වැඩ මේ මේයයි මැනැවින් හැඟේ මෙය අර්ථ සූචනය කරණ බවයි.

එසේම මේ ධර්මය ඒ ඒ කරුණට ගැළපෙන පරිදි නා නා චරිත ඇති ඒ ඒ පුද්ගලයනට ගැළපෙන පරිදි ඒ ඒ අවස්ථාවට ගැළපෙන පරිදි අවබොධ කරන්නවුන්ගේ අදහසට අනුව දෙශනා කරණ ලද්දෙකි. මේ මැනැවින් කියන ලද බවයි.

ගොවියෝ ගොයම් කොට අස්වැන්න කපා පාගා ගෙන ගොස් අටු කොටු පුරවා ගෙන සාගිනි ඇතිවූවිට ඉන් ආහාර පිළියෙල කොට ගෙන කා බී සැනසෙති.

එසේම සූත්‍ර ධර්මය දන්නෝ අර්ථය උගෙන තමන්ගේ විපත් සම්පත් දෙකෙහිදීම සිත සනසා ගෙන ක්‍රියා කිරීමට සමර්ථයෝ වෙති. මේ අර්ථයන් පහළ කරණ බවයි.

දෙනගේ තනයෙන් දෙවාගත් කිරි බී ගව හිමියෝ හෝ ධනවත්තු කාය පිනවා ගනිති. එසේම සූත්‍ර උගත්තෝ හෝ සූත්‍ර ධර්මධරයන් ඇසුරු කරන්නෝ සූත්‍රයන් උගන්වනු ලබන අර්ථයන් දැන ඊට අනුව හැසිර ධ්‍යානාදී සැපයට පැමිණෙති. මේ අර්ථයන් වගුරුවන බවයි.

දෙව් මිනිසුන් හට හිතවූ අර්ථයන් මෙහි සංග්‍රහ කොට තිබේ. එසේම එය දන්නාහට පාපයෙන් ආරක්‍ෂාවද ඇතිවේ. මේ මැනවින් **තායනය** කිරීමයි.

වඩුවෝ ලී ඉරණ විට නූල් ගසා නූලට ඉරා ලීයෙන් ප්‍රයෝජන ගනිති. එසේම නුවණැත්තන්ගේ ක්‍රියාව සූත්‍ර ධර්මයෙහි උගන්වන ලද්දට අනුව වේ

මල් දම් ගොතන්නෝ නූලෙහි මල් අවුණත් එසේම දත යුතුවූ අර්ථයන් මේ ධර්ම චක්‍රයෙහි නොවිසිරී ඇවිණී ඇත. මේ නූලක් හා සමාන බවයි;

## අභිධර්ම පිටකය

අභිධර්ම දෙශනාවට හේතු; අභිධර්මය පිළිබඳවූ ලේශ මාත්‍ර අවබෝධයක් පවා අප බුදුන් සමයෙහි සිටි සෙසු ශාස්තෘවරයන් හට තිබුණේයයි සිතීමට කරුණු නැත. අප බුදුරජාණන් වහන්සේ බෝධිද්‍රැමමූලයෙහිදී මාර පරාජය කොට සර්වඥ බවට පැමිණීමෙන්ම මේ ගැඹුරු ධර්ම න්‍යායය අවබෝධ කළසේක. බෝධිද්‍රැමමූලයෙන් නැගී සිටි සතරවන සතියෙහි බෝධිද්‍රැමයට වයඹ දිග රතන ගෘහයෙහි වැඩ හිඳ මේ ධර්මය සමමර්ශනය කරන්ම සූවිසි ප්‍රත්‍යයෙන් සමන්විතවූ සමන්ත පට්ඨාන නයට පැමිණි කල උන්වහන්සේගේ ශ්‍රී ශරීරයෙන් සවණක් රැස් නික්මුණු සේක බුදුවූ සත්වන වර්ෂයෙහි තිර්ථක මර්දනය කොට ගණ්ඩම්බ නම් වෘක්‍ෂමූලයෙහි යමක ප්‍රාතිහාර්ය දක්වා ත්‍රිපද වික්‍රමයෙන් තව්තිසා දෙව්ලොව වැඩ නඳන.වනොද්‍යානයෙහි පරසතුරුකමුල පණ්ඩුකම්බල ශෛලාසනයෙහි වැඩ හිඳ පූර්ව බුදුවරයන්ගේ චරිතයට අනුකූලව මාතෘ දිව්‍ය රාජයා ප්‍රමුඛ තව්තිසා වැසි දෙවියනට තෙමසක් මුළුල්ලෙහි නිරතුරුව මේ අභිධර්ම පිටකය දෙශනා කර වදාළ සේක.

මෙසේ, තෙමසක් මුළුල්ලෙහි නිරතුරුව ධර්ම දෙශනා කරන්නාවූ සර්වඥයන් වහන්සේ මිනිස් ලොව කාල වේලා බලා භික්‍ෂාචාර වේලාව සලකා බුදුනෙකු එහි මවා ඒ නිර්මිත බුදුන්ගේ සියළු ආකල්පය මෙබඳු වේවා මෙපමණ කාලයක් මෙපමණ ධර්මයක් දෙශනා කෙරේවායි; අධිෂ්ඨාන කොට පා සිවුරු ගෙන අනවතප්ත විලට බැස සිවුරු පිළි දැග උතුරුකුරු දිවයිනට වැඩ පිඬු සිඟාගෙන අවුත් එම විල් තෙර හිඳ වළඳා ඒ සමීප සඳුන් වනයට දිවා විහාර පිණිස වඩනා සේක. එවිට දම්සෙනවි

සැරියුත් මහ තෙරුන් වහන්සේ එතනට වැඩ තථාගතයන් වහන්සේට වත් පිළිවෙත් කොට **එකත්පසෙක** හිඳිනා සේක; ඉක්බිති තථාගතයන් වහන්සේ **සාරිපුත්‍රය!** මෙපමණ ධර්මයක් අද මා විසින් දෙශනා කරණ ලද්දේයයි අභිධර්මයෙහි නය ක්‍රමය දෙවා වදාරණ සේක; **සාරිපුත්‍ර ස්ථවිර යන්** වහන්සේ ඒ උගත් ධර්මය **දරාගෙන අවුත් තමන්** වහන්සේගේ පන්සියයක් **සද්ධි** විහාරික **භික්ෂූන්** වහන්සේට උගන්වනසේක; මෙසේ බුදුරජාණන් වහන්සේ දෙවියන්ට දෙශනා කර වදාළ අභිධර්මය **සාරිපුත්‍ර** ස්ථවිරයන් වහන්සේගේ මාර්ගයෙන් සිවු පිරිසට අගත් ශ්‍රාවකයන්ගේ ග්‍රහණ ධාරණයට පැමිණියේය. මෙසේ නිපුණ බුද්ධිමත් දෙවි මිනිසුන්ගේ ධර්මඥානය විශද වීමෙන් නිර්වාණාවබොධයට උපකාරවනු පිණිස බුදුරජාණන් වහන්සේ **චිත්ත, චෛතසික, රූප නිර්වාණ** යන සතර ධර්මයන් ගේ විස්තර විභාගයවූ **අභිධර්ම පිටකය** දෙශනා කාර වදාළසේක.

ඒ ධර්මය ගැඹුරු **නුවණ** ඇත්තවුන් හටම විෂයවේ; "කුසලා කුසල" ධර්මයන් විවෙචනය කරගැනීමට උපකාරිවන බැවින් මෙය **පරමාර්ථ** ධර්ම යයිද කියනු ලැබේ;

එබැවින් **අභිධර්මය** දන්නෝම ඒකාන්තයෙන් ධර්මධරයෝ නම් වෙතියි කියනු ලබේ. මෙය සූත්‍ර ධර්මයේ මාතෘකාවද වෙයි;

## අභිධර්මයෙහි ලක්ෂණ

යං එත්ථ වුඩ්ඪිමන්තො සලක්ඛණා පූජිතා පරිච්ඡින්නා
වුත්තාධිකා ච ධම්මා – අභිධම්මො තෙන අක්ඛාතො.

වැඩීම් සහිත ධර්මයක් හෙයින්ද පිරිසිඳින ලද ධර්මයක් හෙයින්ද අධික ධර්මයක් හෙයින්ද මෙය අභිධර්මයයි කියනු ලැබේ. මනුෂ්‍ය ධර්මයවූ **දශ කුසල** ධර්මයට වඩා උසස් බවට යන්නාවූ **ධර්මය** අභිධර්මයෙහි ඇතුලත්වේ. මේ වැඩීම් සහිත ධර්මයක් බවයි;

**රූපාරම්මණංවා සද්දාරම්මණංවා** යනාදී වශයෙන් අරමුණු ආදීන් විසින් සලකුණු කොට දක්වන ලද ධර්මය අභිධර්මයෙහි ඇතුලත්වේ මේ **ලක්ෂණ** සහිත ධර්මයක් බවයි. **සෙඛධම්ම අසෙඛධම්ම ලොකුත්තර ධම්ම** යනාදී වශයෙන් දක්වන ලද්දාහු පූජිත ධර්මයෝය; ස්පර්ශය වෙයි වෙදනාව වෙයි යනාදී වශයෙන් ඒ ඒ ධර්මයෝ මෙතෙක් මෙතෙක් පහළ වෙත්යයි ගණන් නියම කොට දක්වන ලද බව පිරිසිඳිනා ලද ධර්ම ඇති බවයි.

**මහග්ගතධම්ම අප්පමාණධම්ම අනුත්තරධම්ම** යනාදී වශයෙන් බොහෝ ධර්මයන් දක්වා තිබීම අධික ධර්මයක් බවයි;

## විනය දෙශනාවට හේතු;

බුඬත්වයට පැමිණ විසි අවුරුද්දක් ගතවනතුරු ප්‍රථම බුඬ කාලයෙහි ශික්‍ෂාපද පැණවීමක් නොකළ සේක එකල භික්‍ෂු පිරිස විශාල නොවූ හෙයින් අධ්‍යාචාරයක් පහළ නොවූ හෙයින්ම ශික්‍ෂාපද පැණවීමද අවශ්‍ය නොවීය. ඉන්පසු තථාගතයන් වහන්සේගේ ධර්මය ලොව පැතිරෙත්ම මහා ධනෙශ්වරයන්ගේ වස්තු පරිත්‍යාගයෙන් විශාල විහාර ආරාම ගොඩනගන ලදහ චීවරාදි ප්‍රත්‍යය බහුලවිය. නොයෙක් ජාතිවලින් නොයෙක් කුලවලින් කුලපුත්‍රයෝ අවුත් ශාසනයෙහි පැවිදි වන්නට වූහ. නොයෙක් ගති සිරිත් ඇති ඔවුන් අතර පිරිසේ විශාලත්වයද නිසා නොයෙක් අධ්‍යාචාරයෝ පහළ වූහ එකල්හි බුදුරජාණන් වහන්සේ කාරුණු දශයක් මුල්කොට ගෙන භික්‍ෂුන් වහන්සේටද ශික්‍ෂාපද පණවා වදාළ සේක; එනම්. 1 සඬඝයාගේ මනා පැවැත්ම පිණිසද, 2 සඬඝයාගේ සම්ගි සැප විහරණය පිණිසද 3 දුස්සීල පුද්ගලයන්ට නිග්‍රහ පිණිසද 4 එසිත්ම පෙසල භික්‍ෂුන්ගේ උපොසථ පවාරණදී කටයුතු පහසුවෙන් කර ගැනීම පිණිසද 5 ඉහාත්මයෙහි වන්නාවූ නින්‍දා පරිභව විපිළිසර ආදී ආශ්‍රවයන් වැළැක්ම පිණිසද 6 පරලොව නිරය දුක් ආදී ආශ්‍රවයන් වැළැක්ම පිණිසද 7 නොපැහැදුන වුන්ගේ පැහැදීම පිණිසද 8 පැහැදුණ වුන්ගේ ප්‍රසාදය වැඩීම පිණිසද 9 පයතිපත්ති ප්‍රතිපත්ති ප්‍රතිවෙධ යන ත්‍රිවිධ ශාසන ධර්මය බොහෝ කලක් පැවැත්ම පිණිසද 10 සංවර ප්‍රහාන සම්ථ ප්‍රඥප්ති යන චතුර්විධ විනයට අනුග්‍රහ පිණිසද යන කාරුණු දසයයි;

භික්‍ෂු භික්‍ෂුණී දෙපිරිසෙහි අධ්‍යාචාරයන් පහළවත් වත්ම පණවන ලද ශික්‍ෂා පදයන් පිළිබඳ නීති වාක්‍ය හා එහි අර්ථ කථනයද විනය පිටකය නමින් සඬගෘහිත විය. උපාලි මහා ස්ථවිරයන් විසින් එය උගෙන උන්වහන්සේගේ සද්ධි විහාරිකයන්හට උගන්වන ලදින් ශ්‍රාවක පරම්පරාවෙන් පැවත එන්නේය;

## විනය පිටකය

බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයන් අතුරෙන් විශෙෂයෙන් සනාතිකා චවර භාවයට පැමිණි භික්‍ෂු භික්‍ෂුණී යන දෙපක්‍ෂයෙහි අභි සමාචරය උදෙසා දෙශනා කොට වදාළ නීති සමූහය විනය පිටකයයි කියනු ලැබේ;

## විනයෙහි ලක්ෂණ

විවිධ විසෙස නයත්තා විනයනතො චෙව කාය වාචානං
විනයත්ථ විදූහි අයං – විනයො විනයොති අක්ඛාතො

විවිධ නය ඇති හෙයින්ද විශේෂ නය ඇති හෙයින්ද කාය වචන යන් විනය නය (හික්මවීම) කරණ හෙයින්ද විනයාර්ථ දන්නවුන් විසින් විනයයයි කියනලදී.

අධ්‍යාචාර සඞ්ඛ්‍යාත ආපත්තීන්ගේ **පාරාජිකා සඞ්ඝාදිසෙස නිස්සග්ගිය පාචිත්තිය පාටිදෙසනිය දුක්කට දුබ්භාසිත** වශයෙන් නොයෙක් ක්‍රමයේ නීති ඇති බැවින් විනය දෙශනාව විවිධ **නය** ඇත්තීය.

ඒ විනය නීති දැඩි කිරීම් ලිහිල් කිරීම් ආදි වශයෙන් පැවති අනු ප්‍රඥප්ති ක්‍රම ඇති බැවින් විසෙස **නය** ඇත්තීය.

**කාය වචන** දෙකින් සිදුවන වරද නැති කොටලන කායවාක් සංවරය නොහොත් ශීලය වූකලි, පාරිශුද්ධිය ඇති කිරීම සඳහා දෙශනා කරණ ලද බැවින් විනය වනාහි කය වචන හික්මවන්නේවේ.

**පාවචනය** පිටක වශයෙන් මෙසේ තුන් ආකාර වේ.

තුන් පිටකය පිළිවෙළින් වොහාර දෙසනා, පරමත්ථ දෙසනා, ආණා දෙසනා, නම් වෙති. ව්‍යවහාරයෙහි දක්ෂවූ භාග්‍යවතුන් වහන්සේ විසින් ලොක සම්මුතිය හෙවත් ව්‍යවහාරය බහුල කොට වදාළ බැවින් **සූත්‍ර පිටකය වොහාර** දෙශනා නම් වෙයි.[1]

පරමාර්ථයෙහි හෙවත් නොවෙනස් වන ධර්මයෙහි දක්ෂවූ භාග්‍ය වතුන් වහන්සේ විසින් එම පරමාර්ථය බහුල කොට දෙශනා කොට වදාළ බැවින් **අභිධර්ම** පිටකය **පරමත්ථ** දෙශනා නම් වෙයි.[2]

අණ කිරීමට සුදුසු භාග්‍යවතුන් වහන්සේ විසින් අණ බහුල කොට **දෙසනා කොට** වදාළ බැවින් **විනය** පිටකය **ආණා දෙසනා** නම් වෙයි.[3]

එසේම තුන් පිටකය පිළිවෙළින් යථානුලොමසාසන යථා ධම්ම සාසන යථා පරාධ සාසන නම්ද වෙති.

නොයෙක් අදහස් අනුසය චරිත අධිමුක්ති ඇති සත්ත්වයන් සූත්‍ර දෙශනා මගින් හික්මවන ලද හෙයින් සූත්‍ර පිටකය **යථානුලොම සාසන** නම් වේ

ධර්ම පිණ්ඩ මාත්‍රයෙහි මමය මාගේ යයි, හැඟුම් ඇති සත්ත්වයන් අභිධර්ම දෙසනාවෙන් හික්මවන ලද හෙයින් අභිධර්ම පිටකය **යථා ධම්ම සාසන** නම් වෙයි.

බොහෝ වරද ඇති සත්වයන් වරදට අනුව විනය දෙශනාවෙන් හික්මවන ලද හෙයින් විනය පිටකය **යථා පරාධ ශාසන** නම් වෙයි.

**එසේම තුන් පිටකය** පිළිවෙළින් **දිට්ඨිවිනිවෙඨන** කථා **නාම රූප පරිච්ඡෙද** කථා, **සංවරා සංවර** කථා, නම්ද වෙති

දෙසැට මිස දිටුවලට විරුඬව සූත්‍රදෙශනාව පවත්වන ලද බැවින් සූත්‍රපිටකය **දිට්ඨිවිනිවෙඨන** (මිසදිටු අවුල හැරීමේ) කථා නම් වෙයි.

රාගාදී ධර්මයන්හට විරුඬව නාම රූප ධර්මයන් පිරිසිඳීම් වශයෙන් **අභිධර්මය** දෙසා වදාළ බැවින් අභිධර්ම පිටකය **නාම රූප පරිච්ඡේද** කථා නම් වෙයි.

වැරදි හැසිරීම් වලට විරුඬව **විනය** ධර්මය දෙසනා කරණ ලද බැවින් විනය පිටකය **සංවරා සංවර** කථා නම් වෙයි.

මූළ ශාස්තෲ ශාසනයට අයත්වූ **ශික්ෂා** තුන මේ තුන් **පිටකයෙහි** ඇතුළත් වේ.

**විනය පිටකයෙන්** උසස්වූ **ශීලය** උගන්වනු ලබන බැවින් එය **අධිශීල** ශික්ෂාවයි.

සූත්‍ර පිටකයෙන් සිත උසස් බවට පැමිණ වීම උගන්වනු ලබන හෙයින් එය **අධිචිත්ත** ශික්ෂාවයි.

අභිධර්ම පිටකයෙන් උසස්වූ ප්‍රඥාව ලැබීම උගන්වනු ලබන හෙයින් එය අධිප්‍රඥා ශික්ෂාවයි.

තවද මේ තුන්පිටකයෙන් ත්‍රිවිධ ප්‍රහාණයද දක්වනු ලැබේ. පුහුදුන් සිතෙහි කෙලෙසුන්ගේ පැවැත්ම තුන් ආකාරයෙනි. **ව්‍යතික්‍රම පර්‍යවස්ථාන අනුශය** වශයෙනි.

යම් කිසි වරදක් කයින් හෝ වචයෙන් හෝ සිදුකරණ විට කෙලෙශ බලයෙන්ම එසේ කෙරෙණ නිසා එය කෙලෙශයන්ගේ ව්‍යතික්‍රම අවස්ථාවයි.

විනය පිටකය **එය පහ කිරීමට** දෙශනාකොට වදාළ බැවින් ඉන් ව්‍යතික්‍රම ප්‍රහාණය සිදුවේ.

වැරද්දක් කයින් හෝ වචනයෙන් හෝ නොකරතත් රාගාදී සිතිවිල්ලකින් වැසී සිටින විට සිතේ කෙලෙශයන් නැගී සිටි බවක් ඇති හෙයින් ඒ කෙලෙශයන්ගේ **පර්‍යවස්ථාන** යයි. එය පහ කිරීමට දෙශනා කොට වදාළ බැවින් සූත්‍ර පිටකයෙන් පර්‍යවස්ථාන ප්‍රහාණය සිදුවේ.

වරදක් නොකරතත් රාගාදී සිතිවිල්ලක් නැතත් යම් විටකදී අරමුණු ඇතිවූ පරිද්දෙන් සිත දූසිත කිරීමටද කය වචනයන් වරදට යොමු කිරීමටද බල ඇතිව යටපත්වී තිබෙන කෙලෙශයන්ගේ පැවතීම අනුශය අවස්ථාවයි. **එය පහකිරීමට** දෙශනා කොට වදාළ බැවින් **අභිධර්ම පිටකයෙන් අනුශය ප්‍රහාණය** සිදුවේ.

## පාවචනය

ප්‍රථම බුද්ධ වචනය මධ්‍යම බුද්ධ වචනය පශ්චිම බුද්ධ වචනයයි තුනකටද බෙදනු ලැබේ.

මාර පරාජය කොට සම්‍යක් සම්බොධියට පැමිණ පළමු කොට වදාල උදාන ගාථාවෝ ප්‍රථම බුද්ධ වචන යයි කියනු ලැබේ.

එනම්:-

අනෙක ජාති සංසාරං සන්ධා විස්සං අනිබ්බිසං
ගහ කාරකං ගවෙසන්තො දුක්ඛා ජාති පුනප්පුනං
ගහ කාරක දිට්ඨොසි පුන ගෙහං න කාහසි
සබ්බා තෙ ඵාසුකා භග්ගා ගහකූටං විසඞ්ඛිතං
විසඞ්ඛාර ගතං චිත්තං තණ්හානං ඛයමජ්ඣගාති--

යනුයි.

පිරිනිවන් පානා සමයෙහි අවසාන කොට වදාල

**හන්දදානි භික්ඛවෙ ආමන්තයාමි වො**
**වයධම්මා සංඛාරා අප්පමාදෙන සම්පාදෙථ**

යනු පශ්චිම බුද්ධ වචනයයි. මේ අතරතුර වදාල තාක් සියළු ධර්මය මධ්‍යම බුද්ධ වචනයයි කියනු ලැබේ.

**පිටක විභාගය නිමි**

## ශාස්තෘ ශාසනයේ නවාඞ්ගය

සියළු පාවචනය ශාස්තෘ ශාසනයේ අඞ්ග වශයෙන් නව වැදෑරුම් වේ.

එනම්:- සූත්‍රය ගෙය්‍යය වෙය්‍යාකරණය ගාථාය උදානය ඉතිවුත්තකය ජාතකය අබ්භූතධම්මය වෙදල්ලය යනුයි.

**“ සූත්‍රය ”**

මූළ විනය පිටකයද මඞ්ගල සූත්‍ර රතන සූත්‍ර නාලක සූත්‍ර තුවටක සූත්‍රාදී සූත්‍ර නාමයෙන් ප්‍රකටවූ තථාගත වචනයද සූත්‍රාඞ්ගයෙහි ඇතුලත් වේ.

**“ ගෙය්‍යය ”**

ගාථා සහිත සියළු සූත්‍ර ගෙය්‍ය නම් වේ. සංයුත්ත නිකායෙහි මුළු සගාථක වර්ගය විශෙෂයෙන් ගෙය්‍යාඞ්ගයෙහි ඇතුලත් වේ.

**“ වෙය්‍යාකරණ ”**

මුළු අභිධර්ම පිටකයද ගාථා නැති සූත්‍රද අනිත් අඞ්ග අටට ඇතුලත් නොවූ සියළු බුද්ධ වචනයද වෙය්‍යාකරණ අඞ්ගයෙහි ඇතුලත් වේ.

"ගාථා"

ධම්මපද ථෙර ගාථා ථෙරී ගාථා යන මොහුද සූත්‍ර නිපාතයෙහි සූත්‍ර නමින් නොදක්වන ලද නනි ගාථාද ගාථාඞ්ගයෙහි ඇතුලත් වේ.

"උදානය"

සොම්නස්ස සහගත ඤාණයෙන් දෙශනාකොට වදාල ගාථාවන් ගෙන් යුක්තවූ අසූ දෙකක් පමණ සූත්‍රාන්තයෝ උදාන නම් වෙති.

"ඉතිවුත්තකය"

වුත්තම්දං භගවතා වුත්තමරහතා යනුවෙන් ධර්ම සඞ්ගායනා වෙහිදී දක්වන ලද්දවූ එහෙයින්ම විශෙෂ නිදාන රහිතවූ එකසිය දසයක් පමණ සූත්‍රාන්තයෝ ඉතිවුත්තක නම් වෙති.

"ජාතකය"

අපණ්ණක ජාතකය ආදිකොට ඇති පන්සිය පණසක් පමණ බොධි සත්ත්ව චරිත නිරූපිත දෙශනාවෝ ජාතක නම් වෙති.

"අබ්භූත ධර්මය"

ආශ්චර්ය්‍ය අද්භූත ධර්මයන්ගෙන් යුක්තකොට දෙශනාකොට වදාළ සියළු සූත්‍රාන්තයෝ අබ්භූත ධර්ම නම් වෙති.

"වෙදල්ලය"

චුල්ල වෙදල්ල මහා වෙදල්ල සම්මාදිට්ඨි සක්කපඤ්හ සඞ්ඛාර භාජනීය මහාපුණ්ණම් ආදිවූ ඤාණයත් සතුටත් ලැබ ලැබ විචාරා වදාළ සියළු සූත්‍රාන්තයෝ වෙදනිඃශ්‍රිත (සතුට ඇසුරුකොට ඇති) හෙයින් වෙදල්ල නම් වෙති.

මෙසේ පාවචනය අඞ්ග වශයෙන් නවයකට බෙදේ.

සූත්‍රය පාවචනයේ එක් කොටසක් වන අතරම සුත්ත නාමයෙන් මුළු පාවචනයමත් කියැවේ.

"එය මෙසේ දතයුත්තේය"

**සුත්තන්ති සාමඤ්ඤවිධි විසෙස විධයො පරෙ**
**සනිමිත්තා නිරූළ්හත්තා සහතාඤ්ඤත නාමතො.**

සූත්‍රය යනු මුළු බුඩ වචනයට සාධාරණ නමෙකි. මේ සාමාන්‍ය විධියයි.

**ඡන්නකං තස්ස භගවතො සුත්තාගතං සුත්ත පරියාපන්නං** යන තැන සුත්ත ශබ්දයෙන් විනය පිටකය කියැවේ.

**සකවාදෙ පඤ්ච සුත්තානි පරවාදෙ පඤ්චසුත්තානි** යන ආදී තැන සුත්ත ශබ්දයෙන් අභිධර්ම පිටකය කියැවේ.

සූත්‍ර සඞ්ඛ්‍යාතවූ පාවචනයට ඇතුළත් ඇතැම් කොටස් ඒ ඒ නිමිත් තෙන් ගෙය්‍යාදි විශෙෂ නම්වලින් ව්‍යවහාර කරනු ලැබෙත්.

ගාථා සහිත බව විශෙෂයෙන් නිමිති කොටගෙන ගෙය්‍ය අඞ්ගය වෙන්වේ.

ගාථා නැති තැන විචාරා විසඳන ලද බව නිමිති කොට ගෙන වෙය්‍යා කරණ අඞ්ගය වෙන්වේ

ප්‍රශ්න විසර්ජනය වෙය්‍යා කරණයයි කියනු ලැබේ. ප්‍රශ්න විසර්ජනය ඇතද ගාථා ඇතහොත් එය ගෙය්‍ය අඞ්ගයෙහිම ඇතුළත් වේ. විශෙෂ විධියක්වූ ගාථා සහිත බව බලවත් වන හෙයිනි. ධම්මපද ආදී බන්ධනයන්හි කෙවල ගාථා නිමිත්තෙන් ගාථා අඞ්ගය වෙන් වේ

ගාථා වුවත් සොම්නස් නුවණින් දෙසන ලද බව නිමිති කොටගෙන උදාන අඞ්ගය වෙන්වේ.

ගාථා ඇති නැති බව කෙසේ වුවත් වුත්තං හෙතං යනාදි වචන සම්බන්ධය ඇති තන්හි ඒ නිමිත්තෙන් ඉතිවුත්තක අඞ්ගය වෙන්වේ.

අද්භූත ධර්මයන්ගෙන් යුක්තවූ තැන්හි ඒ බැව් නිමිති කොටගෙන අබ්භූත ධම්මාඞ්ගය වෙන්වේ.

ගාථා බන්ධනයන් වතුදු බුදුන්ගේ අතිත ජාති චරිතයන් පැවසීම නිමිති කොට ගෙන ජාතක අඞ්ගය වෙන්වේ.

ප්‍රශ්න විසර්ජනයක් වුවත් ගාථා සහිත වූවත් වෙදතීඃශ්‍රිත බව නිමිති කොට ගෙන වෙදල්ලාඞ්ගය වෙන්වේ.

මෙසේ විශෙෂ විධි ඇත්තාවූ සූත්‍රයෝ ගෙය්‍යාදී නමින් ව්‍යවහාර කරනු ලැබෙත්.

විශෙෂ නිමිත්තක් නොලැබෙන තැන සියළු බුද්ධ වචන සූත්‍ර නාම යෙන්ම සෙසව සිටිත්.

නිරූඪ බැවින් හෝ ඒ ඒ අඞ්ගයන්හි ඇතුළත් වෙති.

මඞ්ගල සූත්‍ර රතන සූත්‍රාදීහු කෙවල ගාථාවකුදු ගාථාඞ්ගයෙහි නොව සූත්‍රාඞ්ගයෙහිම ඇතුළත් වෙති. මොහු සූත්‍ර නාමයෙන් නිරූඪ හෙයිනි. ගෙය්‍යාඞ්ගයෙහි ඇතුළත් නොවෙති.

ගාථා සහිත වීමට ගාථා නිර්මුක්ත ප්‍රදෙශයක් තිබිය යුතුය. එය නැති හෙයිනි: සඟාතවීම නම් අතිකාක් හා සම්ගය.

උභතො විභඞ්ග ආදියෙහි ගාථා සහිත ප්‍රදෙශයක් වුවත් ඒ ගාථා ජාතකාදි අඞ්ගයකට ඇතුළත් වූමවෝ නම් අතිකාක්ම වන හෙයින් ගෙය්‍යාඞ්ගයට ඇතුළත් නොවේ. විශෙෂ නාමයක් නොලත් ගාථා සහිත වූයේම ගෙය්‍ය නම් වන්නේය.

**නවාඞ්ග ශාසන ශාඛා විභාගය නමි.**

සියළු පාවචනය සූත්‍රාධිෂ්ඨාන විශේෂයන් (ප්‍රත්‍යාධ ආධාරසූ කාරණා වලින්) යුක්ත ආකාර වේ.

එනම්:-

රාගාධිට්ඨානං දෝසාධිට්ඨානං මෝහාධිට්ඨානං අලෝභාධිට්ඨානං අදෝසාධිට්ඨානං අමෝහාධිට්ඨානං කායකම්මාධිට්ඨානං වචීකම්මාධිට්ඨානං මනෝකම්මාධිට්ඨානං සද්ධින්ද්‍රියාධිට්ඨානං විරියින්ද්‍රියාධිට්ඨානං සතින්ද්‍රියාධිට්ඨානං සමාධින්ද්‍රියාධිට්ඨානං පඤ්ඤින්ද්‍රියාධිට්ඨානං යනුයි.

විතක්ක පමථිතස්ස ජන්තුනො තිබ්බරාගස්ස සුභානු පස්සිනො භිය්‍යො තණ්හා පවඩ්ඪති එසබො දළ්හං කරොති බන්ධනං ති ...

විතර්කයෙන් මඩනාලද තියුණු රාග ඇති සුබ අරමුණු අනුව බලන් නාවූ පුද්ගලයාහට බොහෝ සෙයින් තෘෂ්ණාව වැඩේ. මෙබඳු පුද්ගල තෙමේ සංසාර බන්ධනය දැඩිකරන්නේය. මෙය රාගාධිෂ්ඨාන සූත්‍රයයි.

භාග්‍යවතුන් වහන්සේ එක් ධර්මයක් අරභයා අනේක ධර්ම පදයන් දෙසනසේක.

යම් ධර්මයක් මුල්කොට දක්වන ලද්දේද එයම නොයෙක් අයුරින් මතුකොට දක්වනසේක.

විතර්කයෙන් මඩනා ලද යන්නෙන් කාමරාගය දක්වන ලදී. රාගයට හේතු බැවින් කාම විතර්කයම මෙහි ගනුලැබේ.

සුබ අරමුණු අනුව බලන යනුවෙන් කාමරාගයට වස්තුව දක්වන ලදී.

තියුණු රාග ඇති යනුවෙන් විතර්කයට වස්තුව දක්වන ලදී.

බොහෝ සෙයින් තෘෂ්ණාව වැඩේ යනුවෙන් එම රාගය කාම තෘෂ්ණාව යයි දක්වන ලදී.

මේ තෙමේ බන්ධනය දැඩි කෙරේ යනුවෙන් තෘෂ්ණා සංයොජනය දක්වන ලදී.

මෙසේ සියළු තැනම මුල්කොට දක්වන ලද කාරුණින් අධිෂ්ඨානය අනුමානයෙන් සලකා ගන්නේය. භාග්‍යවතුන් වහන්සේ විසින් එක් ධර්මයක් හෙතුනිස්සඳ ඵල වශයෙන් තුන් අයුරකින් දක්වනු ලැබේ.

ඉහත සඳහන් ගාථාවෙහි තියුණු රාගය හේතුවයි තෘෂ්ණාව වැඩීම නිස්සන්දයයි බන්ධනය දැඩිවීම ඵලයයි.

මෙසේ සියළු සූත්‍රාන්තහිම හේතු නිස්සන්ද ඵල යන් සැලකිය යුත්තේය.

මෙසේ යම් සූත්‍රයක රාගය (ඇලීම) මුල්කොට දක්වන ලද්දේනම් එය රාගාධිෂ්ඨාන සූත්‍ර වශයෙන් දත්තේය.

2 යො පාණමතිපාතෙති මුසාවාදඤ්ච භාසති
ලොකෙ අදින්නං ආදියති පරදාරඤ්ච ගච්ඡති
සුරාමෙරය පානඤ්ච යො නරො අභිගිජ්ඣති
අප්පහාය පඤ්ච වෙරානි දුස්සීලො ඉති වුච්චති.
කායස්ස භෙදා දුප්පඤ්ඤො නිරයං සොප පජ්ජති.

(අංගුත්තරනිකාය)

යමෙක් ප්‍රාණඝාතය කරයිද මුසාවාද කියයි ද ලොකයෙහි නුදුන් දෙය ගනීද. පරදාරාවන්කරා යාද රහමෙර පානයෙහි ඇලේද යන මේ පංච වෛරයන් අත් නොහල තැනැත්තේ දුස්සීලයකැයි කියනු ලැබේ. ඒ අනුවණ පුද්ගල තෙමේ කාය භෙදයෙන් නිරයෙහි උපදී.

මෙය දෙෂාධිෂ්ඨාන සූත්‍රයයි.

ප්‍රාණඝාතාදී පඤ්ච පාපයෝ දෙෂයෝ වෙති. මේ පඤ්ච පාපයන්ට හේතුව සිත දූෂ්‍යවීම් සඞ්ඛ්‍යාත දෙෂයයි පඤ්චවෛරයෝ නිස්සන්ද යයි නිරයොත්පත්තිය ඵලයයි.

මෙසේ යම් සූත්‍රයක චිත්ත දූෂණය මුල්කොට දක්වන ලද්දේනම් එය දෙෂාධිෂ්ඨාන සූත්‍ර වශයෙන් දත්තේය.

3 සහස්සඤ්ච සහස්සානං කප්පානං සංසරිස්සති
අථවාපි තතොභීයො ගබ්භා ගබ්භං ගමිස්සථ

අනුපාදය බුද්ධ වචනං සඞ්ඛාරෙ අත්තතො උපාදය දුක්ඛස්සන්තං කරිස්සංති ඨාන මෙතං නවිජ්ජති.

කල්ප ලක්ෂයක් හෝ ඊටත් වඩා සැරිසරන්නේය මවු ගැබෙන් මවු ගැබට යන්නේය.

බුද්ධ වචනය නොගෙන සංස්කාරයන් ආත්ම වශයෙන් ගෙන දුක් කෙළවර කරන්නේය. යන කරුණ සිදු නොවන්නේය.

මෙය මොහාධිෂ්ඨාන සූත්‍රයයි.

සංසරණයට හේතුව අවිද්‍යාවයි- බුද්ධ වචනය නොගැනීමට හා සංස්කාරයන් මමය මගේ යයි ගැනීමටද හේතුව අවිද්‍යාවයි අවිද්‍යාව නම් මොහයයි.

මෙහි අවිද්‍යාව හෙතුවයි. සංස්කාරයන්ගේ ආත්ම වශයෙන් ගැනීම නිස්සන්දයයි පුනර්භවය ඵලයයි.

මෙසේ යම් සූත්‍රයක අවිද්‍යාව (මොහය) මුල්කොට දක්වන ලද්දේ නම් එය මොහාධිෂ්ඨාන සූත්‍ර වශයෙන් දතයුත්තේය.

4 අසුභානුපස්සිංවිහරන්තං ඉන්ද්‍රියෙසු සුසං වුතං
භොජනම්හි ච මත්තඤ්ඤුං සද්ධං ආරද්ධ විරියං
තංවෙනප්පසහති මාරො වාතොසෙලංව පබ්බතං ති.

(ධම්මපදය)

අසුභය අනුව බලමින් වසන්නාවූ ඉන්ද්‍රියයන්හි මැනවින් සංවරවූ භොජනයෙහි පමණ දන්නාවූ ශ්‍රද්ධා ඇති පටන්ගත් වීය්‍ය ඇති ඒ පුද්ගලයා වාතය ශෛල පර්වතයක් සෙලවිය නොහැක්කාසේ මාර තෙමේ මැඩලිය නොහැකි වෙයි.

අසුභය අනුව දැකීම නම් කාමයෙහි ආලය හැරීමයි ඉන්ද්‍රිය සංවර යද අරමුණෙහි ලොභය හැරීමයි. භොජනයෙහි පමණ දැනීමද රස දුරු කිරීමයි.

ශ්‍රද්ධා වීය්‍යයෝ තදුපකාර ධර්මයෝයැ.

අසුභය අනුව බැලීම යනු අලොභය වස්තු වශයෙන් දැරීමයි.

ඉන්ද්‍රිය සංවරය යනු අලොභය ගොචර වශයෙන් දැරීමයි භොජන යෙහි පමණ දැනීම යනු අලොභය බාහිර වශයෙන් දැරීමයි.

මෙහි අලොභය හෙතුවයි. අසුභානු දර්ශනාදිය නිස්සන්දයයි, මාර යාට වසඟ නොවීම ඵලයයි.

මේ අලොභාධිෂ්ඨාන සූත්‍රයයි

මෙසේ යම් සූත්‍රයක ආලොභය හැරපීම මුල්කොට දක්වන ලද්දේ නම් එය අලොභාධිෂ්ඨාන සූත්‍ර වශයෙන් දතයුත්තේයැ.

5 එකම්පි චෙ පාණ මිදුට්ඨ චිත්තො
මෙත්තායතෙ කුසලො තෙන හොති
සබ්බෙච පාණෙ අනුකම්ප මානො
අනන්ත වරියො සකරොති පුඤ්ඤං ති.

අදුෂ්ට සිත් ඇත්තේ එකම ප්‍රාණියෙකුටවත් මෛත්‍රී කෙරේද, ඉන් හෙතෙම යහපත් වේ. සියළු ප්‍රාණීන්ට අනුකම්පා කරන්නාවූ ඒ ආය්‍ය තෙමේ අනන්ත පින් රැස් කෙරේ.

මේ අද්වෙෂාධිෂ්ඨාන සූත්‍රයයි

මෛත්‍රී කිරීම නම් අද්වෙෂයයි අද්වෙෂය මෙහි හේතුවයි. ඉන් කුසල් ඇත්තෙකුවීම නිස්සන්දයයි අව්‍යාපාද භූමිය දක්වා පින් රැස් කිරීම ඵලයයි.

මෙසේ යම් සූත්‍රයක අව්‍යාපාදය මුල්කොට දක්වන ලද්දේ නම් එය අද්වෙෂාධිෂ්ඨාන සූත්‍ර වශයෙන් දතයුත්තේය.

6 මුහුත්තමපි චෙ විඤ්ඤූ පණ්ඩිතං පයිරුපාසති
ඛිප්පං ධම්මං විජානාති ජිව්හා සූපරසං යථා ති.

(ධම්මපදය)

නුවණ ඇත්තේ මොහොතකුත් පණ්ඩිතයකු පයිර්‍යුපාසනය කෙරේ ද හෙතෙම දිව සූපරසය දැනගන්නාක් මෙන් වහාම ධර්මය දැනගනියි.

**මේ අමොහාධිෂ්ඨාන සූත්‍රයයි.**

මෙහි විජානන සංඛ්‍යාත අමොහය හේතුවයි. පණ්ඩිත පයිර්‍යුපාසනය **නිස්සන්දයයි** ධර්මඥනය **ඵලයයි.**

මෙසේ යම් සූත්‍රයක නුවණ මුල්කොට දක්වන ලද්දේ නම් එය **අමොහාධිෂ්ඨාන** සූත්‍ර වශයෙන් දතයුත්තේයැ.

7 කායෙන කුසලං කරෙ අස්ස කායෙන සංවුතො
කාය දුච්චරිතං හිත්වා කායෙන සුචරිතං චරෙ ති.

කයින් කුසල් කරන්නේය. කයින් සංවර වන්නේය කාය දුශ්චරිතය හැර කාය සුචරිතය කරන්නේය.

**මේ කායකර්මාධිෂ්ඨාන සූත්‍රයයි.**

කාය කර්මය මෙහි හෙතුවයි. කාය සංවරය **නිස්සන්දයයි** කාය සුචරිතය **ඵලයයි.**

මෙසේ යම් සූත්‍රයක කායික ක්‍රියාව මුල්කොට දක්වන ලද්දේ නම් එය **කායකර්මාධිෂ්ඨාන** සූත්‍ර වශයෙන් දතයුත්තේය.

8 සුභාසිතං උත්තමමාහු සන්තො
ධම්මං භණෙ නාධම්මං තං දුතියං
පියං භණෙ නාපියං තං තතියං
සච්චං භණෙ නාලිකං තං චතුත්‍ථං

සුභාසිතය උතුම් යයි සත්පුරුෂයෝ කියත් ධර්මයම කියන්නේය. අධර්මය නොකියන්නේය. මේ දෙවෙනි කරුණයි. පිය තෙපුල් බණන්නේය නොපිය තෙපුල් නොබණන්නේය. මේ තුන්වන කරුණයි. සැබව කියන්නේය බොරු නොකියන්නේය මේ සතරවන කරුණයි.

**මේ වාක්කර්මාධිෂ්ඨාන සූත්‍රයයි.**

වචී කර්මය මෙහි හේතුවයි. ධර්ම්‍ය ප්‍රිය වචනය හා සැබව **නිස්සන්දයයි** උතුම් බව **ඵලයයි** මෙසේ යම් සූත්‍රයක වාචසික කර්මය මුල්කොට දක්වන ලද්දේ නම් එය වාක්කර්මාධිෂ්ඨාන සූත්‍ර වශයෙන් දතයුත්තේය.

9 මනසා කුසලං කම්මං මනසා සංවුතො භවෙ
මනො දුච්චරිතං හිත්වා මනසා සුචරිතං චරෙති.

සිතින් කුසල කර්මය වඩන්නේය. සිතින් සංවර වන්නේය. චේතනා දුශ්චරිතය හැර චේතනා සුචරිතය වඩන්නේය.

**මේ මනඃ කර්මාධිෂ්ඨාන සූත්‍රයයි.**

මෙහි මනෝකර්මය හේතුවයි මනෝසංවරය **නිස්සන්දයයි** මනෝ සුචරිතය **ඵලයයි.**

මෙසේ යම් තැනක මනඃ කර්මය මුල්කොට දක්වන ලද්දේ නම් එය මනඃ කර්මාධිෂ්ඨාන සූත්‍ර වශයෙන් දතයුත්තේය.

10 යස්ස සද්ධා තථාගතෙ අචලා සුප්පතිට්ඨිතා
සීලංච යස්ස කල්‍යාණං අරියකන්තං පසංසිතං
සඞ්ඝෙ පසාදො යස්සාත්ථි උජුභූතඤ්ච දස්සනං
අදලිද්දොති තං ආහු අමොඝං තස්ස ජීවිතං ති.

(අඞ්ගුත්තර නිකාය)

යමෙකුට තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව නොසැලී ස්ථිරව පිහිටියාද ආර්‍යයන් විසින් කැමතිවූ පසස්නාලද යහපත් සීලය ඇත්තේද සඞ්ඝයා කෙරෙහි පැහැදීම ඇත්තේද දර්ශනය ඍජු වූයේ ද ඔහු නොදිළින් දෙනැයි කියත් ඔහුගේ ජීවිතය නොසිස් වේ.

**මේ ශ්‍රද්ධෙන්ද්‍රියාධිෂ්ඨාන සූත්‍රයයි.**

මෙහි ශ්‍රද්ධාව හෙවත් තථාගතයන් වහන්සේගේ ගුණ ඇදහීම හේතුවයි.

යහපත් සීලය සඞ්ඝයා කෙරෙහි ප්‍රසාදය හා ඍජු දර්ශනය **නිස්සන්ද** යයි නොසිස් ජීවිතය **ඵලයයි.**

මෙසේ යම් සූත්‍රයක ශ්‍රද්ධාව ප්‍රධානකොට දක්වන ලද්දේ නම් එය ශ්‍රද්ධෙන්ද්‍රියාධිෂ්ඨාන සූත්‍ර වශයෙන් දතයුත්තේය.

11 අරභථ නික්ඛමථ යුඤ්ජථ බුද්ධ සාසනෙ
ධුනාථ මච්චුනො සෙනං නළාගාරංව කුඤ්ජරො ති.

(සංයුත්ත නිකාය)

අරඹවු! කුසීතකමින් නික්මෙවු! බුදුසසුනෙහි යෙදෙවු! ඇතෙක් බටදඬු ගෙයක් පෙරළා හරින්නාක් මෙන් මරසෙනඟ පලවා හරිවු!
මේ **වීර්‍යෙන්ද්‍රියාධිෂ්ඨාන** සූත්‍රයයි.

මෙහි ආරම්භය සහද නිෂ්ක්‍රමණය සහද වීර්‍යයයි. **ඒ** හේතුවයි. බුදු සසුනෙහි යෙදීම **නිස්සන්දයයි** මරසෙනඟ බිඳ හැරීම **ඵලයයි.**

මෙසේ යම් සූත්‍රයක වීර්‍යය හේතු නිස්සන්ද ඵල වශයෙන් ප්‍රධාන කොට දක්වන ලද්දේ නම් එය වීර්‍යෙන්ද්‍රියාධිෂ්ඨාන සූත්‍රයයි දතයුත්තේය.

12 සතිමතො සද භද්දං භද්දමත්ථු සතිමතො
සතිමතො සද සෙය්‍යො සතිමා සුඛ මෙධති ති
(සංයුත්තනිකාය)

සිහි ඇත්තහුට සදම යහපතක් වේ. සිහි ඇත්තහුට යහපතක් වේවා සිහි ඇත්තහුට සදම උසස් බවක් වන්නේය. සිහි ඇති තැනැත්තේ සැපසේ වැඩෙන්නේය

**මේ ස්මෘතින්ද්‍රියාධිෂ්ඨාන සූත්‍රයයි.**

මෙහි ස්මෘතිය **හේතුවයි** යහපත **නිස්සන්ද** යයි සැපය **ඵලයයි**
මෙසේ යම් සූත්‍රයක **හෙතු නිස්සන්ද ඵල** වශයෙන් ස්මෘතිය ප්‍රධාන කොට දක්වන ලද්දේ නම් එය ස්මෘතින්ද්‍රියාධිෂ්ඨාන සූත්‍ර වශයෙන් දත යුත්තේය.

13 ආකඞ්ඛතො තෙ නරදම්ම සාරථි දෙවා මනුස්සා මනසා විචින්තිතං
සබ්බෙ න ජඤ්ඤා කසිණාපි පාණිනො
සන්තං සමාධිං අරණං නිසෙවතො.

දමනය කළ යුතු මිනිසුන් දමනය කරන්නාණෙනි, ශාන්තවූ නිකෙලෙසිවූ සමාධිය සේවනය කරන්නාවූ ඔබවහන්සේට කැමති වීනම් දෙවිමිනිස් ආදී සියලු සත්වයන් විසින් සිතන ලද්ද සියළු ආකාරයෙන් දැනගත හැක්කේය.

**මේ සමාධින්ද්‍රියාධිෂ්ඨාන සූත්‍රයයි.**

මෙහි පරසිත් දතහැකි සමාධිය **හේතුවයි** සියළු සතුන්ගේ සිත් දැනගැනීම **නිස්සන්ද** යයි ශාන්ත භාවය **ඵලයයි**.

මෙසේ යම් සූත්‍රයක සමාධිය ප්‍රධාන කොට දක්වන ලද්දේ නම් එය සමාධින්ද්‍රියාධිෂ්ඨාන සූත්‍ර වශයෙන් දතයුත්තේය.

14 පඤ්ඤාහි සෙට්ඨා ලොකස්මිං යායං නිබ්බෙධගාමිනී
යාය සම්මා පජානාති ජාති මරණ සඞ්ඛයං ති.

යමක් නිර්වේදය භජනය කරන්නීද යමකින් ජාති මරණයන්ගේ ගෙවීම මැනවින් දැනගනීද එබඳු ප්‍රඥාව ලොකයෙහි ශ්‍රේෂ්ඨ වන්නීය.

**මේ ප්‍රඥෙන්ද්‍රියාධිෂ්ඨාන සූත්‍රයයි.**

මෙහි ප්‍රඥාව **හෙතුවයි** ජාති මරණ සඞ්ඛය දැනීම **නිස්සන්ද** යයි ජාති මරණ සඞ්ඛයෙන් ලත් විමුක්තිය **ඵලයයි**

මෙසේ යම් සූත්‍රයක ප්‍රඥාව ප්‍රධානකොට දක්වන ලද්දේ නම් එය ප්‍රඥෙන්ද්‍රියාධිෂ්ඨාන සූත්‍ර වශයෙන් දත යුත්තේය.

මේ දක්වන ලද්දේ අසාධාරණ සත්‍රාධිෂ්ඨානයයි සමහර සත්‍රයක් අධිෂ්ඨාන තිපයකටද සාධාරණ වන්නේය ඒ මෙසේයි.

"තීණි මානි භික්ඛවෙ නිදානානි කම්මානං සමුදයාය කතමානි තීණි? ලොභො නිදානං කම්මානං සමුදයාය දොසො නිදානං කම්මානං සමුදයාය මොහො නිදානං කම්මානං සමුදයාය"

මහණෙනි, කමියන්ගේ රැස්වීමට නිදාන තුනක් ඇත කවර තුනක් ද යත්? ලොභය කමියාගේ රැස්වීමට නිදානයකි. දෙසය කමියාගේ රැස්වීමට නිදානයකි. මොහොය කමියාගේ රැස්වීමට නිදානයකි. –පෙ– අඞ්ගුත්තර නිකාය,

මෙය **රාගාධිෂ්ඨාන, දෙසාධිෂ්ඨාන, මොහාධිෂ්ඨාන** යන තුනටම සාධාරණ වේ.

**රාගය** ලොභයෙහිම ඇතුළත් වේ.

මෙහි ලොභ දෙෂ මොහ යන තුන **හෙතුවයි**. කම් රැස්කිරීම **නිස්සන්දයයි** විපාක විඳීම **ඵලයයි**

තීණි මානි භික්ඛවෙ නිදානානි කම්මානං සමුදයාය කතමානි තීණි අලොභො නිදානං කම්මානං සමුදයාය අදොසො නිදානං කම්මානං සමුදයාය අමොහො නිදානං කම්මානං සමුදයාය. –පෙ–

මහණෙනි, කමියන්ගේ රැස්වීමට මේ නිදාන තුනක් වෙති කවර තුනක්ද යත් අලොභය කමියාගේ රැස්වීමට නිදානයකි අදෙෂය කමියාගේ රැස්වීමට නිදානයකි අමොහය කමියාගේ රැස්වීමට නිදානයකි –පෙ– (අඞ්ගුත්තර නිකායෙ)

මෙය **අලොභාධිෂ්ඨාන, අදෙෂාධිෂ්ඨාන, අමොහාධිෂ්ඨාන** යන තුනටම සාධාරණ වේ.

මෙහි අලොභාදෙෂා මොහයෝ **හෙතුවයි**. කම් රැස්කිරීම **නිස්සන්දයයි** කම්ප්‍රහානය **ඵලයයි**.

වාචානුරක්ඛී මනසාසුසංවුතො කායෙනච අකුසලංනකයිරා එතෙ තයොකම්මපථෙ විසොධයෙ ආරාධයෙ මග්ගං ඉසිප්පවෙදිතං (ධම්මපදෙ)

වචනය පාපයෙන් ආරක්ෂා කරන්නාවූ මනසින් සංවරවූ තැනැත්තේ කයින්ද අකුසල් නොකරන්නේය මේ කම්පථ තුන පිරිසිදු කරන්නේය. හෙතෙම බුඩාදී මහර්ෂින් විසින් ප්‍රකාශ කරන ලද මාර්ගය අයිතිකර ගන්නේය.

මෙය කාය කම්ාධිෂ්ඨාන වාක් කම්ාධිෂ්ඨාන මනඃ කම්ාධිෂ්ඨාන යන තුනට සාධාරණ වන්නේය.

මෙහි කාය වාඞ්මනඃ කර්මයන්ගේ පාපයෙන් සංවර කරගැනීම හේතුවයි.

ඒ ත්‍රිවිධ කර්ම පථයන්ගේ පිරිසිදු බව නිස්සන්දයයි සෘෂි ප්‍රවේදිත මාර්ගීය ආරාධනය කරගැනීම ඵලයයි.

අස්සො යථා භද්‍රො කසා නිවිට්ඨො
ආතාපිනො සංවෙගිනො භවාථ
සද්ධාය සීලෙන ච විරියෙන ච
සමාධිනා ධම්මවිනිච්ඡයෙන ච
සම්පන්නවිජ්ජාචරණා පතිස්සතා
පහස්සථ දුක්ඛමිදං අනප්පකං ති.

(ධම්මපදෙ)

කස පහර ලත් අශ්වයෙක් මා වැන්නෙක් කස පහර ලදිම්දැයි නොපමා වන්නාක් මෙන් කෙලෙස් තවන වීර්‍යයෙන් යුක්ත වවු! සංවෙගයට පැමිණියෝවවු! ශ්‍රද්ධාවෙන්ද ශීලයෙන්ද වීර්‍යයෙන්ද සමාධියෙන්ද ධර්ම විනිශ්චයෙන්ද යුක්තව විද්‍යාචරණ ධර්මයන්ගෙන් සම්පන්නව එළඹ සිටි සිහි ඇතිව මේ අනල්පවූ දුක පහකරවු!

මේ– ශ්‍රද්ධෙන්ද්‍රියාධිෂ්ඨාන
වීර්‍යෙන්ද්‍රියාධිෂ්ඨාන
සමාධීන්ද්‍රියාධිෂ්ඨාන
ප්‍රඥෙන්ද්‍රියාධිෂ්ඨාන
ස්මෘතීන්ද්‍රියාධිෂ්ඨාන

යන පසටම සාධාරණ වේ. මෙහි ධර්ම විනිශ්චය යනුවෙන් ප්‍රඥෙන්ද්‍රියද පතිස්සතා යන්නෙන් ස්මෘතීන්ද්‍රියද දක්වන ලදී.

ශ්‍රද්ධාදී පඤ්චෙන්ද්‍රිය හේතුවයි. විජ්ජාචරණ සම්පන්නත්වය නිස්සන්දයයි අනල්ප දුක්ඛයාගේ ප්‍රහාණය ඵලයයි.

මෙසේ සමහර සූත්‍රයක් අධිෂ්ඨාන පසකට සාධාරණ වන අයුරු දතයුත්තේය.

යම් යම් සූත්‍රයකින් රාගාදී යමක් යමක් මුල්කොට දක්වන ලද්දේද ඒ ඒ සූත්‍රය එම අධිෂ්ඨානය හා සම්බන්ධකොට දතයුත්තේය.

මෙසේ පාවචනය අසාධාරණාධිෂ්ඨාන වශයෙන් තුදුස් වැදෑරුම්ද සාධාරණ අධිෂ්ඨාන වශයෙන් නොයෙක් වැදෑරුම්ද වන්නේය.

**සූත්‍රාධිෂ්ඨාන විභාගය නිමි.**

පාවචනය මෙසේ සූත්‍රාධිෂ්ඨාන වශයෙන් විභාගකොට දක්වා ඉක්බිති ශාසන පට්ඨාන ප්‍රභෙද වශයෙන්ද විභාගකොට දක්වනු ලැබේ.

ශාස්තෲන් වහන්සේගේ අනුශාසනාව නානා චරිතාධි මුක්ති ඇති උද්ඝටිතඥාදී වෛනෙය ජනයන්ගේ අදහසට අනුකූලව සත්‍යාව බොධය වන පරිද්දෙන් මැනවින් පිහිටුවීම ශාසන පට්ඨාන නම් වන්නේය.

එය සොළොස් වැදෑරුම් කොටද අටවිසි වැදෑරුම් කොටද ආචාර්‍ය්‍යවරයෝ දක්වති.

එහි සොළස විධ ශාසන පට්ඨානය නම් කවරේද යත්?

ඉහත දක්වන ලද ගෙය්‍යාදී නවාඞ්ග ශාස්තෘ ශාසන සඞ්ඛ්‍යාත සකල පාවචනය

සඞ්කිලෙස භාගිය සූත්‍රය
වාසනා භාගිය සූත්‍රය
නිබ්බෙධ භාගිය සූත්‍රය
අසෙක්ඛ භාගිය සූත්‍රයයි.

ශුඞ්ක නය වශයෙන් සතරකට බෙදනු ලැබේ. නැවත වොමිස්සක නයෙහි දුක වශයෙන් සයකට බෙදනු ලැබේ.

එනම්:–

සඞ්කිලෙස භාගිය හා වාසනා භාගිය සූත්‍රය
සඞ්කිලෙස භාගිය හා නිබ්බෙධ භාගිය සූත්‍රය
සඞ්කිලෙස භාගිය හා අසෙක්ඛ භාගිය සූත්‍රය
වාසනා භාගිය හා නිබ්බෙධ භාගිය සූත්‍රය
වාසනා භාගිය හා අසෙක්ඛ භාගිය සූත්‍රය
නිබ්බෙධ භාගිය හා අසෙක්ඛ භාගිය සූත්‍රය යන සයයි.

තව දුරටත් වොමිස්සක නයෙහි තික වශයෙන් සතරකට බෙදනු ලැබේ.

සඞ්කිලෙස භාගිය වාසනා භාගිය හා නිබ්බෙධ භාගිය සූත්‍රය
සඞ්කිලෙස භාගිය වාසනා භාගිය හා අසෙක්ඛ භාගිය සූත්‍රය
සඞ්කිලෙස භාගිය නිබ්බෙධ භාගිය හා අසෙක්ඛ භාගිය සූත්‍රය
වාසනා භාගිය නිබ්බෙධ භාගිය හා අසෙක්ඛ භාගිය සූතය යන මේ සතරයි.

තව දුරටත් වොමිස්සක නයෙහි චතුෂ්ක වශයෙන් දෙකකට බෙදනු ලැබේ.

එනම්:-

සඞ්කිලෙස භාගිය වාසනා භාගිය නිබ්බෙධ භාගිය හා අසෙක්ඛ භාගිය සූත්‍රය නොව සඞ්කිලෙස භාගිය න වාසනා භාගිය න නිබ්බෙධ භාගිය න අසෙක්ඛ භාගිය සූත්‍රය යන දෙකයි.

| | | |
|---|---|---|
| අසාධාරණ සූත්‍ර | 4 | යි |
| සාධාරණ වීමෙන් දුක | 6 | යි |
| තික | 4 | යි |
| චතුෂ්ක | 2 | $4+6+4+2=16$ යි |

පාවචනයෙහි සූත්‍ර ගෙය්‍යාදී එක් එක් අඞ්ගයක් මෙසේ සොළොස් අයුරෙන් ප්‍රභෙද වීමෙන් $9 \times 16=144$ එක්සිය සුසලිසක් සූත්‍රයෝ වෙත් මෙයින් පිටත් බුඩ වචනයක් නැත්තේයයි දත යුත්තේය. මේ සියළු ප්‍රභෙදයනටම එක එකක් පාසා නිදසුන් පෙටකොපදෙශ නෙත්තිප්පකරණආදි ග්‍රන්ථයන්හි පවා නොදක්වන ලදහ.

වැඩි හරියකට නිදසුන් දී සෙස්ස කියන ලද අනුසාරයෙන් අනුමානයෙන් සලකා ගන්නටයයි උපදෙස් දෙන ලද්දේය.

අප විසින් මෙහිදී සොළස විධ සාසන පට්ඨානය පිළිබඳ සාමාන්‍යාවබොධයට ඉවහල් වන පමණින් යථොක්ත ග්‍රන්ථයන්ගෙන්ම උපුටා උදාහරණ කීපයක් දක්වනු ලැබේ.

### පාවචනය සොළොසට බෙදීමේ හේතුව

සඞ්කිලෙසය නම් සත්වයන් කිළුටු කරන්නාවූ ධර්මයයි.

එය භජනය කරන්නාවූ හෙවත් එම කොටසෙහි පැවතියාවූ සූත්‍රය සඞ්කිලෙස භාගිය සූත්‍රයයි.

සඞ්කිලෙසය වනාහි -

තණ්හා සඞ්කිලෙසය
දිට්ඨි සඞ්කිලෙසය
දුච්චරිත සඞ්කිලෙසයයි තුන් ආකාර වේ.

තණ්හා සඞ්කිලෙසයාගේ විශුඩිය සමථයෙන්ද
දිට්ඨි සඞ්කිලෙසයාගේ විශුඩිය විදර්ශනාවෙන්ද
දුච්චරිත සඞ්කිලෙසයාගේ විශුඩිය සුචරිතයෙන්ද සිදුවන්නේය.

සමථය නම් සමාධියයි
විදර්ශනා නම් ප්‍රඥාවයි
සුචරිතය නම් සීලයයි

සීල සමාධි ප්‍රඥා යන තුන මූළ සාසනයයි.

යම් සූත්‍රයෙක තණ්හාදි සඞ්කිලෙසය බෙද දක්වන ලද්දේද ඒ **සඞ්කිලෙස** භාගිය සූත්‍රයයි.

මාර්ග නියාමයට නොපත් හෙවත් අපරිවර්ජිත භව සංසාර ඇති පුද්ගලයෙකුගේ සඞ්කිලෙස චොදනයවූ සීල සමාධි ප්‍රඥා යන ත්‍රිවිධ ශික්ෂාව යම් සූත්‍රයක බෙද දක්වන ලද්දේද එය **වාසනා භාගිය සූත්‍රයයි**

වාසනා නම් සසර ඉපදී සැපලැබීමට හේතුවූ පුණ්‍ය ක්‍රියා වස්තුවයි එම භාගයෙහි පැවතියේ වාසනා භාගිය සූත්‍ර නම් වන්නේය.

සොවාන් මාර්ගස්ථාදී සප්තවිධ ශෛක්ෂ්‍ය පුද්ගලයන් කෙරෙහි පවත්නා යථෝක්ත ත්‍රිවිධ ශික්ෂා සඞ්ඛ්‍යාත විශුද්ධිය යම් සූත්‍රයක බෙද දක්වන ලද්දේද එය **නිබ්බෙධ භාගිය** සූත්‍රයයි.

නිර්වේදය නම් කෙලෙසයන් බිඳ හැරීම යි. ශෛක්ෂ්‍ය පුද්ගලයන් ඒ ඥානයෙන් කෙලෙසයන් බිඳහරිණ හෙයින් ඔවුන් අයත් ත්‍රි ශික්ෂා භාගයෙහි පැවතියේ නිබ්බෙධ භාගිය සූත්‍ර නම් වන්නේය.

අශෛක්ෂ්‍යවූ රහතුන් වහන්සේගේ ත්‍රිශික්ෂා සඞ්ඛ්‍යාත විශුද්ධිය යම් සූත්‍රයක බෙද දක්වන ලද්දේද එය අසෙඛ භාගිය සූත්‍රයයි. අසෙඛ නම් නැවත හික්මීමක් නැති හික්මීමේ ඵලපත් රහතුන් වහන්සේය. උන් වහන්සේ පිළිබඳ ත්‍රි ශික්ෂා භාගයෙහි පැවතියේ **අසෙඛ භාගිය** සූත්‍ර නම් වන්නේය.

සඞ්කිලෙසය **තෘෂ්ණා දෘෂ්ටි දුශ්චරිත** වශයෙන් තෙවැදෑරුම් බව යට කියන ලද්දේය.

එහි **තෘෂ්ණා සඞ්කිලෙසය** තෘෂ්ණා පක්ෂයෙන්ම දක්විය යුත්තේය තෘෂ්ණාව නම් රාගයෙන් බැස ගැනීමයි. එය **කාම තෘෂ්ණා** භව **තෘෂ්ණා** විභව**තෘෂ්ණා** යයි ත්‍රිවිධවේ.

තෘෂ්ණාවට අරමුණු වන්නාවූ වස්තූහු **රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ ධර්මයයි** සවැදෑරුම් වෙත්.

ඔහු නැවත **අධ්‍යාත්මික බාහිර** වශයෙන් විගුණ වීමෙන් දොළසක් වෙත්. නැවත **අතීත, වර්තමාන, අනාගත** යන කාලත්‍රය භේදයෙන් සතිසක් වෙත්.

මේ එක එකක් ශුභයයි කැමති වීම් වශයෙන් ඇලෙන කල, **කාම තෘෂ්ණාව** වේ. එය සදාකාලිකය භවාන්තරයෙහිදු ලබා ගන්නෙමියි ඇලෙන කල භව **තෘෂ්ණාව** වේ.

එය මේ අත්බැව්හිදීම මා විසින් ලැබිය යුත්තේය. මරණින් මතු ලැබීමක් නොවන්නේ යයි ඇලෙන කල **විභව තෘෂ්ණාව** වේ. මෙසේ තෘෂ්ණා භෙදයෙන් ත්‍රිගුණ වීමෙන් එකසිය අටක් තෘෂ්ණා විචරිතයෝ වන්නාහ.

• තෘෂ්ණා වස්තු 6 × **අධ්‍යාත්මික** බාහිර වශයෙන් 2 × 12 අතීතාදි කාල භෙදයෙන් 3 × 36 කාමාදි තෘෂ්ණා භෙදයෙන් 3 × 108 යි.

මෙසින් යම්කිසි තෘෂ්ණා විචරිතයක් දක්වන්නාවූ සූත්‍රය **තෘෂ්ණා සංක්ලේශ භාගිය** සූත්‍රයයි දතයුත්තේය

**දෘෂ්ටි සංක්ලේශය** දෘෂ්ටි **පක්ෂයෙන්ම** දත්විය යුත්තේය දෘෂ්ටිය නම් මෙයම් සැබව සෙස්ස හිස්යයි අදහා ගැනීමෙන් දෘෂ්ට ඊට ඇතුල් වීමයි.

දෘෂ්ටිය **ශාශ්වත උච්ඡේදයයි** විවිධ වේ. සත්ත්වයා භවයෙන් භවයට සැරිසරමින් සදාකාලිකව සිටින්නේයයි විශ්වාස කිරීම **ශාශ්වත දෘෂ්ටියයි.**

**මරණින්** මතු සත්ත්වයා නැවත නූපදින්නේය එයින් සිඳීයන්නේය යන විශ්වාසය **උච්ඡේද** දෘෂ්ටියයි මේ දෘෂ්ටියට ගොචර වන්නාවූ සත්ත්ව ප්‍රවෘත්තිය පූර්වාන්ත **අපරාන්ත** වශයෙන් විවිධවේ. අතීත භවයන් ධ්‍යාන චක්ෂුසින් දැකීමෙන් හෝ විමසා වටහා ගැනීමෙන් **පූර්වාන්තය** පිළිබඳ දෘෂ්ටි ඇතිවන්නාහ.

එබඳු දෘෂ්ටි අටළොසක් ඇත්තාහ **ශාශ්වත 4 එකච්ච ශාශ්වත වාද 4 අන්තානන්තික 4 අමරාවික්ඛෙපික 4 අධිච්ච සමුප්පන්න 2** යන මොහුයි.

## ශාශ්වත 4

මේ ලෝකයෙහි ඇතැමෙක් ගිහිගෙන් නික්ම කාමයෙන් වෙන්ව භාවනානුයෝගයට ධ්‍යාන ලැබ අතීතය සිහි කළ හැකි **පූර්වේනිවාසානුස්මෘති ඥානය** ලබා ගනිත්. ඔවුන් අතුරෙන් සමහරෙකුට අතීත ජාති ලක්ෂ ගණනක් දැකිය හැක්කේය. සමහරෙකුට කල්ප දසයක් දැකිය හැක්කේය. සමහරෙකුට **කල්ප සතළිසක්** දැකිය හැක්කේය. ඔව්හු අතීතයෙහි ජාති ලක්ෂ ගණනේ පටන්ද **කල්ප දසයේ** පටන්ද **කල්ප සතළිසේ** පටන්ද තමාගේ භවයෙන් භවයට පැවත ඒම දැක ලෝකයා **ශාශ්වත** යයි කියති. මෙසේ තුනෙකි. **ඇතමෙක්** තර්ක කිරීමෙන් විමසා වටහා ගැනීමෙන් ලෝකයා **ශාශ්වත යයි** ගනිති.

**මෙසේ ශාශ්වත වාද සතරෙකි.**

**එකාත්‍ර ශාශ්වත 4.**

දීර්ඝ කාලයක් ඇවෑමෙන් මේ ලොකය වැනසෙන්නාවූ කාලයක් වන්නේය. එකල සත්ත්වයෝ බෙහෙවින් ආභස්සර බඹලොව උපදනාහුය. නැවත දීර්ඝ කාලයක් ඇවෑමෙන් මේ ලොකය හටගන්නා වූ කාලයක් ඇති වන්නේය. එකල ශූන්‍යවූ බ්‍රහ්ම විමානය පහළ වන්නේය. ඉන්පසු ආභස්සර බඹලොවින් යම් සත්ත්වයෙක් ආයුගෙවීමෙන් හෝ පින් ගෙවීමෙන් චුතව එම බ්‍රහ්ම විමානයෙහි උපදින්නේය බොහෝ කලක් එහි සිටියාවූ ඔහුට අහෝ තවත් සත්ත්වයෝ මෙතනට එන්නාහු නම් මැනවැයි පැතීමක් ඇති වන්නේය.

ඉන්පසු තවත් සත්ත්වයෝ ආභස්සර බඹලොවින් චුතව අවුත් එහි උපදනාහ පළමු උපන් සත්ත්ව තෙමේ තමාගේ පැතීමෙන් පසු ඔවුන් එහි පහළවූ බැවින් මොව්හු ම විසින් මවන ලද්දෙයයි හැඟීමක් ඇතිකර ගනී.

පසුව උපන්නෝද තමාට පළමුව එහි සිටි බඹා දැක මොහු විසින් අපි මවන ලද්දෙ වෙමුයයි හැඟීමක් ඇතිකර ගනිති.

පළමුව උපන්නා දීර්ඝායුෂ ඇත්තෙක් වේ. පසුව උපන්නෝ මද ආයුෂ ඇත්තෝ වෙත්. එබැවින් පසුව උපන්නාවුන් අතුරෙන් කෙණෙක් ඉන් චුතව මිනිස් ලොව ඉපිද වැඩී ගිහිගෙන් නික්ම ධ්‍යාන වඩා අභිඥා ලැබ එම් පූර්වේ නිවාසය පමණක් සිහිකරයිද ඉන් ඔබ්බෙහි සිහි නොකරයිද ඔහුට තමන් චුතව ආ බවත් මහා බ්‍රහ්මයා ස්ථිරව තවම බ්‍රහ්ම ලොකයෙහි සිටින බවත් පෙනේ. ඉන් ඔහුට අප මවන්නාවූ මහා බ්‍රහ්මයා සදාකාලිකය ඔහු විසින් මවන ලද අපි අනිත්‍ය වෙමු පෙර ළෙන සවභාව ඇත්තෝ වෙමුයයි විශ්වාසයක් හටගනී.

**මේ පළමු වන එකාත්‍ර ශාශ්වත වාදයයි.**

තවද ඛිඩ්ඩා පදෝසික නම් දෙව් කොටසක් ඇත ඔව්හු බොහෝ වේලාවක් සිනා කෙළියෙහි ඇලී සිටින ගතියට පැමිණියාහු සිහි මුලාවට පැමිණෙති.

ඒ හේතුවෙන් ඔව්හු ඒ දෙව්ලොවින් චුතව අවුත් මිනිස්ලොව උපදිති. ඔවුනතුරෙන් ඇතමෙක් ගිහිගෙන් නික්ම කාමයෙන් වෙන්ව භාවනා වඩා ධ්‍යානාභිඥාලාභිව එම 'ඛිඩ්ඩා පදෝසික' ආත්මය පමණක් සිහිකරයිද ඉන් ඔබ්බෙහි සිහි නොකරයිද ඔහුට ඒ දෙව්ලොව ඒ තාක් සිටින්නෝ සදාකාලික යයිද ඉන් චුතව ආ තමන් අනිත්‍යය පෙරළෙන සවභාව ඇත්තේයයිද විශ්වාසයක් හටගනී.

### මේ දෙවන එකච්ච ශාශ්වත වාදයයි.

තවද මනොපදොසික නම් දෙව් කොට්ඨාසයක් ඇත. ඔව්හු බොහෝ වේලාවක් ඔවුනොවුන් දෙස එරෙහිව බලා සිටිත්. එසේ බලා සිටින්නාවූ ඔවුන්ගේ සිත් එකිනෙකා කෙරෙහි දුෂ්‍ය වේත්. සිත් දූෂ්‍යවීමෙන් ක්ලාන්ත ශරීර හා ක්ලාන්තවූ සිත් ඇති ඔව්හු ඒ දෙව්ලොවින් චුතව අවුත් මිනිස් ලොව උපදිත්. ඔවුනතුරෙන් ඇතමෙක් ගිහිගෙන් නික්ම කාමයෙන් වෙන්ව භාවනා වඩා ධ්‍යානලාභිව එම මනොපදොසික ආත්මය පමණක් සිහි කරයිද ඔහුට ඒ දෙව්ලොව ඒ තාක් සිටින්නෝ සදාකාලිකයයිද ඉන් චුතව ආ තමන් අනිත්‍යය පෙරළෙන සවභාව ඇත්තේ යයිද විශ්වාසයක් හටගනී.

### මේ තෙවන එකච්ච ශාශ්වත වාදයයි.

තවද ඇතමෙක් තර්ක කිරීමෙන් විමසා වටහා ගැනීමෙන් මෙබඳු විශ්වාසයක් ඇතිකර ගනී. එනම්:- මේ ආත්මයෙහි ඇස, කණ, නාසය දිව ශරීරය යන යම් මේ කොටසක් වේද එය අනිත්‍ය පෙරළෙන සවභාව ඇත්තේය සිත හෙවත් විඥානය යන යම් මේ කොටසක් වේද එය ස්ථිරය සදාකාලිකය කියායි.

### මේ සිවුවන එකච්ච ශාශ්වත වාදයයි.

## අන්තානන්තික වාද 4

මේ ලොකයෙහි ඇතැම් මහණ බමුණෙක් වීර්‍ය වැඩීමෙන් අප්‍රමාදයෙන් සම්‍යක්මනස්කාරයට පැමිණ ලොකය අන්තයක් ඇත්තේය යන සංඥා ඇත්තාවූ චිත්ත සමාධියක් ලැබගෙන ඊට පැමිණ වාසය කරයි හෙතෙමේ ලොකය අන්තයක් ඇත්තේයයි පවසයි.

### මේ පළමු වන අන්ත වාදයයි.

එබඳුම ඇතැම් මහණෙක් හෝ බමුණෙක් හෝ වීර්‍ය වැඩීමෙන් අප්‍රමාදයෙන් සම්‍යක්මනස්කාරයෙන් ලොකය අන්තයක් නැත්තේය යන සංඥා ඇත්තාවූ චිත්ත සමාධියක් ලබාගෙන ඊට පැමිණ වසයි හෙතෙමේ මෙසේ පවසයි. ලොකය කෙළවරක් ඇත්තේය යනු බොරුවකි. ලොකයෙහි කෙළවරක් නැත්තේය මම එබඳුවූ චිත්ත සමාධියකට පැමිණ වසමි.

### මේ දෙවන අනන්ත වාදයයි.

එසේම ඇතැම් මහණෙක් හෝ බමුණෙක් වීර්‍ය වැඩීමෙන් අප්‍රමාදයෙන් සම්‍යක්මනස්කාරයෙන් මේ අවකාශ ලොකයෙහි උඩ යට කෙළවරක් ඇත්තේය. සරස කෙළවරක් නැත්තේය යන සංඥා ඇත්තාවූ

චේතො සමාධියක් ලබාගෙන ඊට පැමිණ වාසය කරයි හෙතෙමේ මෙසේ **පවසයි**. ලොකය කෙළවරක් ඇත්තේය යනු බොරුවකි. ලොකය කෙළවරක් නැත්තේය යනුද බොරු කථාවකි. ලොකයෙහි කෙළවරක් ඇත්තේත් වෙයි නැත්තේත් වෙයි. මම එබඳු සංඥ ඇති චේතො සමාධියකට පැමිණ වසමි.

**මේ තෙවන අන්තානන්තික වාදයයි.**

මේ ලොකයෙහි ඇතමෙක් තර්කකිරීමෙන් විමසා වටහා ගැණීමෙන් මෙසේ කියයි. මේ ලොකය අන්තයක් ඇත්තේය යනු බොරුය මේ ලොකය අන්තයක් නැත්තේය යනුද බොරුය. මේ ලොකය අන්තයක් ඇත්තේ වෙයි අන්තයක් නැත්තේත් වෙයි යනුද බොරුය මේ ලොකය අන්තයක් ඇත්තේත් නොවෙයි අන්තයක් නැත්තේත් නොවෙයි යි.

**මේ සතර වන අන්තානන්තික වාදයයි.**

**අමරාවික්ෂෙප 4**

අමරා **වික්ෂෙප** නම් බොරු වන කිසිවකට අසු නොවනසේ ඒ මේ අත පැනීමයි.

ඇතමෙක් ඒ ඒ කරුණු පිළිබඳ ප්‍රශ්නයක් විචාළ කල එසේත් නොවෙයි මෙසේත් නොවෙයි අන්සේත් නොවෙයි නැත කියාත් නොවෙයි නැත්තේ නැත කියාත් නොවෙයි යනාදී වශයෙන් පිළිතුරු දෙති.

මේ කුසලය මේ අකුසලයයි තත්වූ පරිද්දෙන් නොදන්නාවූ ඇතැම් මහණෝ හෝ බමුණෝ තමන්ගෙන් බොරුවක් කියවේය යන බයින් අමරා වික්ෂෙපයට පැමිණෙති.

**මේ පළමු වන අමරා වික්ෂෙපයයි.**

එසේම ඇතැමෙක් තමන් කුසල් අකුසල් තත්වූ පරිද්දෙන් නොදන්නා නිසා මේ කුසලය කියා හෝ මේ අකුසලය කියා හෝ ස්ථිර පිළිතුරක් දුනහොත් ඒ පිළිබඳව මට ඇලීමක් හෝ ගැටීමක් ඇති වන්නේයයි සිතා අමරා වික්ෂෙපයට පැමිණෙති.

මෙසේ ඇලුම් ගැටුම් බියෙන් ස්ථිර වචනයක නොපිහිටීම.

**දෙවන අමරා වික්ෂෙපයයි.**

එසේම කුසලා කුසලයන් තත්වූ පරිද්දෙන් නොදන්නාවූ ඇතැම් මහණෙක් හෝ බමුණෙක් ඒ ඒ කරුණෙහි ප්‍රශ්න විචාරණ ලද්දේ

එසේත් නොවෙයි යනාදී වාග්වික්ෂෙපයට පැමිණෙනුයේ අනුයොග කිරෙයති.

පණ්ඩිතවූ වාදයෙහි ජයගන්නාවූ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ මගෙන් කරුණු විචාරන්නාහුය කරුණු ගන්වන්නාහුය උත්තර කියන්නාහුය ඔවුන්ට කරුණු සැපයීම මට අපහසු වුවොත් එය මට වෙහෙසක් වන්නේයයි සිතයි මෙසේ අනුයොග බියෙන් වාග්වික්ෂෙපයට පැමිණීම, **තෙවන අමරා වික්ෂෙපයයි.**

ඇතමෙක් නුවණ මද බැවින් වාග්වික්ෂෙපයට පැමිණෙති මේ **සතරවන අමරා වික්ෂෙපයයි.**

**අධිච්ච සමුප්පන්න 2**

සිත් නැත්තාවූ අසංඥ සත්ත්ව නම් දෙවි කොට්ඨාසක් ඇත සංඥ විරාග භාවනා වැඩූවෝ එහි උපදින්නෝය ඔවුන්හට එම භාවනාමය පුණ්‍ය ක්‍රියාවේ විපාක ශක්තිය අවසන්වත්ම සංඥව උපදී සංඥව ඉපදීමෙන් එයින් චුතවේ මෙසේ ඉන් චුතවූ සත්ත්වයෙක් මිනිස් ලොව ඉපිද ගිහිගෙන් නික්ම කාමයෙන් වෙන්ව භාවනා වඩා පූර්වේනිවාසය සිහි කරන්නේ එම අසංඥ භවය දක්වා සිහි කරයිද ඉන් ඔබ්බ නොසිහි කරයිද හෙතෙම තමා හා සත්ත්වලොකය **අධිච්ච සමුප්පන්නය** ඉබේ හට ගත්තේය යන දෘෂ්ටි ඇත්තේ වන්නේය

**මේ පළමුවන අධිච්ච සමුප්පන්න වාදයයි.**

ඇතමෙක් තර්ක කිරීමෙන් විමසා වටහා ගැනීමෙන් තමා හා ලොකය ඉබේ හටගත්තේය යන දෘෂ්ටි ඇත්තෝ වෙත්

**මේ දෙවන අධිච්ච සමුප්පන්න වාදයයි.**

මෙසේ පූර්වාන්තය අරභයා උපදනා දෘෂ්ටීහු **අටළොසක් වෙත්.**

| | | | |
|---|---|---|---|
| **ශාශ්වත වාද** | **4** | | |
| **එකච්ච ශාශ්වත වාද** | **4** | | |
| **අන්තානන්තික වාද** | **4** | | |
| **අමරාවික්ෂෙපික වාද** | **4** | | |
| **අධිච්ච සමුප්පන්නවාද** | **2** | — | **18** |

අපරාන්තය අරබයා උපදනා **දෘෂ්ටිහු සුසාළිසක්** වෙත්

| | | | | |
|---|---|---|---|---|
| **උද්ධමාඝාතනිකා සඤ්ඤී** | **වාද** | **16** | | |
| **උද්ධමාඝාතනිකා අසඤ්ඤී** | **වාද** | **8** | | |
| **උද්ධමාඝාතනිකා නෙවසඤ්ඤී නාසඤ්ඤී** | **වාද** | **8** | | |
| **උච්ඡේද** | **වාද** | **7** | | |
| **දිට්ඨ ධම්ම නිබ්බාණ** | **වාද** | **5** | — | **44** |

## උද්ධමාඝාතනිකා සඤ්ඤීවාද 16

තවද මේ ලොකයෙහි ඇතැම් මහණ බමුණෝ අපරාන්තය හෙවත් සත්ත්වයාගේ මරණින් මතුව ගැන කල්පනා කරන්නෝ විමංසනය කරන්නෝ සොළොස් ආකාර දෘෂ්ටියක් ඇතිකර ගනිති

එනම්:-

සමහරු ආත්මය නම් රූපයේ අයිතිකාරයාය හේ නිරුපද්‍රැතය මරණින් මතු සංඥා ඇතිව පවත්නේයයි හඟිති

සමහරු ආත්මය නම් සත්ත්වයාගේ රූපය හැර අරූපයවූ සෙස්ස අයිතිකාරයාය හේ නිරුපද්‍රැතය මරණින් මතු සංඥා ඇතිව පවත්නේ යයි හඟිති

සමහරු ආත්මය රූපයද අරූපයද අයිතිකොට ඇත්තේය නිරුපද්‍රැතය මරණින් මතු හේ සංඥා ඇතිව පවත්නේ යයි හඟිති

සමහරු ආත්මය රූපය අයිතිකොට ඇත්තේත් නොවෙයි රූපය අයිතිකොට නැත්තේත් නොවෙයි නිරුපද්‍රැතය මරණින් මතු සංඥා ඇතිව පවත්නේ යයි හඟිති

මෙසේම ආත්මය කෙළවරක් ඇත්තේය ආත්මය කෙළවර නැත්තේය. ආත්මය කෙළවර ඇත්තේත් වෙයි නැත්තේත් වෙයි ආත්මය කෙළවර ඇත්තේත් නොවෙයි නැත්තේත් නොවෙයි යන මේ ආකාරයෙන් හැඟුම් ඇත්තාවූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් සතර කොටසක්ද ඇත්තාහ ඔව්හුද ආත්මය නිරුපද්‍රැතය මරණින් මතු සංඥා ඇතිව පවත්නේය යන දෘෂ්ටි ඇත්තාහ

තවද ආත්මය ඒකාකාර සංඥා ඇත්තේය නානාකාර සංඥා ඇත්තේය ස්වල්ප සංඥා ඇත්තේය අප්‍රමාණ සංඥා ඇත්තේය ඒකාන්ත සැප ඇත්තේය ඒකාන්ත දුක් ඇත්තේය සැප දුක් දෙකම ඇත්තේය නොදුක් නොසැප ඇත්තේය යන මේ ආකාර හැඟුම් ඇත්තාවූ තවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් අට කොටසක්ද ඇත්තාහ

ඔව්හුද ඒ ආත්මය නිරුපද්‍රැතය මරණින් මතු සංඥා ඇතිව පවත්නේයයි විශ්වාස කරත්

මේ උද්ධමාඝාතනිකා සඤ්ඤීවාද සොළොසයි.

## උද්ධමාඝාතනිකා අසඤ්ඤීවාද 8

තවද අපරාන්තය ගැන කල්පනා කරන්නාවූ ඇතැම් මහණ බමුණෝ මරණින් මතු ආත්මය සංඥාරහිතව පවත්නේයයි විශ්වාස කරන්නාහු අට ආකාර දෘෂ්ටියක් ඇතිකර ගනිති

එනම්:-

ආත්මය නම් රූපයේ අයිතිකාරයාය, ආත්මය නම් අරූප ධර්මයන්ගේ අයිතිකාරයාය, ආත්මය නම් රූපයේද අරූපයේද අයිතිකාරයාය, ආත්මය නම් රූපය අයිතිකොට ඇත්තේ නොවෙයි රූපය අයිතිකොට නැත්තේත් නොවෙයි, ආත්මය කෙළවරක් ඇත්තේය, ආත්මය කෙළවරක් නැත්තේය. ආත්මය කෙළවර ඇත්තේත් වෙයි නැත්තේත් වෙයි, ආත්මය කෙළවර ඇත්තේත් නොවෙයි නැත්තේත් නොවෙයි, යන මේ ආකාරයෙන් හැඟුම් ඇත්තාවූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් අට කොටසක් ඇත්තාහ. ඔව්හු ආත්මය නිරුපද්‍රැතය මරණින් මතු සංඥා රහිතව පවත්නේයයි විශ්වාස කෙරෙති

**උද්ධමාඝාතනිකා නෙවසඤ්ඤීනාසඤ්ඤීවාද 8**

අපරාන්තය ගැන කල්පනා කරන්නාවූ ඇතැම් මහණ බමුණෝ ආත්මය මරණින් මතු සංඥා ඇත්තේත් නොව සංඥා නැත්තේත් නොව පවත්නේයයි විශ්වාස කරන්නෝ අට ආකාර දෘෂ්ටියක් ඇතිකර ගනිති.

එනම්:-

අසඤ්ඤීවාදයෙහි දක්වූ පරිච්ඡෙදන්ම ආත්මය පිළිබඳව අට ආකාරයකින් හැඟුම් ඇති කරගන්නාවූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් අට කොටසක් ආත්මය නිරුපද්‍රැතය මරණින් මතු සංඥා ඇත්තේත් නොව නැත්තේත් නොව පවත්නේයයි විශ්වාස කෙරෙති.

**උච්ඡේද වාද 7**

අපරාන්තය ගැන කල්පනා කරන්නාවූ ඇතැම් මහණ බමුණෝ මරණින් මතු ආත්මය සිඳීයන්නේය අභාවයට යන්නේය යන උච්ඡේද වාද ඇත්තෝ වෙත්.

ආත්මය මරණින් මතු මුල් සිඳී යන්නේය යන හැඟුම් ඇති මහණ බමුණන් සත් කොටසක් වෙත්

එනම්:-

සමහරු මවු පිය දෙදෙනා නිසා හටගත් සතර මහ භූතයන්ගෙන් සෑදුනු ආහාරයෙන් වැඩුණු මේ රූපය නිසා ආත්මය පහළ වන්නේය. මරණින් මතු කාය භෙදයෙන් ආත්මය අභාවයට යන්නේයයි හඟිති.

සමහරු රූපය නිසා ආත්මය පහළ වන බව සැබෑය එහෙත් එය එපමණින් සිඳී නොයන්නේය රූප ඇත්තාවූ ආහාර බුදින්නාවූ අනිත් කාමාවචර දිව්‍ය ආත්මයක් ඇත්තේය. ඒ දිව්‍යාත්මයට පැමිණ එම දිව්‍ය කාය භෙදයෙන් මරණින් මතු අභාවයට යන්නේයයි කියති.

සමහරු එබඳු ආත්මයක් ඇති බවද සැබෑය එහෙත් එපමණින්ම ආත්මය සිඳී නොයන්නේය රූප ඇත්තාවූ මනෝමයවූ සියළු අඟ පසඟ ඇති ඉන්ද්‍රියයන් අඩු නැති අනිත් දිව්‍යාත්මයක් ඇත්තේය ඒට පැමිණ කාය භේදයෙන් මරණින් මතු ආත්මය අභාවයට යන්නේයයි කියති.

සමහරු එබඳු ආත්මයක් ඇති බව සැබෑය එහෙත් එය එපමණින් සිඳී නොයන්නේය ආකාසානඤ්චායතන නම් අනික් අරූපි ආත්මයක් ඇත්තේය ඒට පැමිණ මරණින් මතු ආත්මය අභාවයට යන්නේයයි කියති

සමහරු එබඳු ආත්මයක් ඇති බව සැබෑය. එහෙත් එය එපමණින් සිඳී නොයන්නේය **විඤ්ඤානඤ්චායතන** නම් අනිත් අරූපි ආත්මයක් ඇත්තේය ඒට පැමිණ මරණින් මතු ආත්මය අභාවයට යන්නේයයි කියති.

සමහරු එබඳු ආත්මයක් ඇති බව සැබෑය එහෙත් එය එපමණින් සිඳී නොයන්නේය, **ආකිඤ්චඤ්ඤායතන** නම් අනිත් අරූපි ආත්මයක් ඇත්තේය ඒට පැමිණ මරණින් මතු ආත්මය අභාවයට යන්නේයයි කියති,

සමහරු එබඳු ආත්මයක් ඇති බව සැබෑය එහෙත් එය එපමණින් සිඳී නොයන්නේය. **නෙවසඤ්ඤා නාසඤ්ඤ** යතන නම් අනිත් අරූපි ආත්මයක් ඇත්තේය ඒට පැමිණ ආත්මය අභාවයට යන්නේය අන් තැනකට නොයන්නේයයි කියති.

**මෙසේ උච්ඡේද වාදීහු සත්වැදෑරුම් වෙති.**

**පරම දිට්ඨ ධම්ම නිබ්බාන වාද 5**

අපරාන්තය ගැන කල්පනා කරන්නාවූ ඇතැම් මහණ බමුණෝ මරණින් මතු අභාවයට යන්නාවූ ආත්මය පිළිබඳ ඉහාත්මයෙහි උතුම් නිර්වාණයට පැමිණීමේ පස්අංකාරයක් දක්වති.

එනම්:–

සමහරු යම් කලෙක මේ ආත්මය **පස්කම්** ගුණයෙන් සමර්පිතව සමඞ්ගීභූතව හසුරුවාද එකල ආත්මය **ඉහාත්ම නිර්වාණයට** පැමිණියේ වේයයි කියති.

සමහරු කාම සම්පත් නම් අනිත්‍යය දුක්ය පෙරලෙන සවභාව ඇත්තාහුය එබැවින් ඔවුන්ගේ වෙනස් වීමෙන් **සොක පරිදෙව දුක් දොම්නස්** උපදිත්.

එබැවින් ආත්මය එපමණකින් ඉහාත්ම නිර්වාණයට පැමිණියේ නොවන්නේය. යම් කලෙක කාමයෙන් වෙන්ව විවෙකයෙන් හටගත්

ප්‍රීති සැප ඇති ධ්‍යානය ලබා ඊට පැමිණ වාසය කෙරේද එකල ආත්මය ඉහාත්ම නිර්වාණයට පැමිණියේ වේයයි කියති.

සමහරු ඒ ධ්‍යානයෙහි විතර්ක විචාර ඇත එහෙයින් එය **බලාපිකාය** එය ඉහාත්ම **නිර්වාණය** නොවන්නේය. විතර්ක විචාර නැති **සමාධි** යෙන් හටගත් ප්‍රීති සැප ඇති විතීය ධ්‍යානය ලබා ඊට පැමිණ වාසය කෙරේද එකල ආත්මය (ඉහාත්ම) නිර්වාණයට පැමිණියේ වේයයි කියති.

සමහරු **විතීය ධ්‍යානයෙහි** ප්‍රීතියෙන් ඉල්පු යාමක් ඇත එබැවින් එය **බලාපිකාය** එසේම ඉහාත්ම නිර්වාණය නොවන්නේය **යම්** කාලෙක ප්‍රීතියෙන් වෙන්ව **උපෙක්ෂාවෙන්** හා සිහි නුවණින් යුක්තව කයින් සැප විඳින **තෘතීය ධ්‍යානය** ලබා ඊට **පැමිණ** වාසය කෙරේද එකල ආත්මය ඉහාත්ම **නිර්වාණයට** පැමිණියේ වේයයි කියති.

සමහරු ඒ **තෘතීය ධ්‍යානයෙහි** සැපය යන **ආභොගයක්** ඇත එහෙයින් එය **බලාපිකාය** එසේම ඉහාත්ම **නිර්වාණය** නොවන්නේය යම් කාලෙක සැප දුක් දෙකම අත හැරීමෙන් උපෙක්ෂා සමෘති දෙකින් පිරිසිදුවූ **චතුර්ථධ්‍යානයට** පැමිණ වාසය කෙරේද එකල ආත්මය ඉහාත්ම **නිර්වාණයට** පැමිණියේ වේයයි කියති.

මෙසේ **දිට්ඨධම්ම නිබ්බාණ** වාදීහු පස් වැදෑරුම් වෙති. **පූර්වාන්තය** පිළිබඳ දෘෂ්ටි 18 ක්ද **අපරාන්තය** පිළිබඳ දෘෂ්ටි 44 ක්ද යන මේ **දෙසැට දෘෂ්ටීන්** අතුරෙන් **යම් දෘෂ්ටියක් දක්වන්නාවූ** සූත්‍රය **සඞ්කිලෙශ** භාගිය සූත්‍රයයි දතයුත්තේය

**දුශ්චරිත සඞ්කිලෙස භාගිය** සූත්‍රය ත්‍රිවිධ දුශ්චරිතයෙන් **දක්විය** යුත්තේය. එනම්:- **කාය දුශ්චරිත වාග්දුශ්චරිත මනො දුශ්චරිත** යන තුනෙනි.

**කාය දුශ්චරිතය**- ප්‍රාණඝාත අදත්තාදාන, කාමමිථ්‍යාචාරයයි ත්‍රිවිධ **වේ.**

**වාග්දුශ්චරිතය**- මුසාවාද, පිසුනාවාච, ඵරුසාවාච සම්පප්පලාපයයි චතුර්විධ වේ

**මනො දුශ්චරිතය**- **අභිධ්‍යා**, ව්‍යාපාද, මිථ්‍යාදෘෂ්ටියයි ත්‍රිවිධ වේ.

මෙසේ විස්තර **වශයෙන්** දසවැදෑරුම් **වේ.**

**මේ දශ අකුසල කර්මපථයන්** අතුරෙන් යමක් **දක්වන්නාවූ** සූත්‍රය **සංකිලෙසභාගිය සූත්‍රයයි** දතයුත්තේය.

**වාසනාභාගිය** සූත්‍රය ත්‍රිවිධ සුචරිතයෙන් **දක්විය** යුත්තේය

එනම්:-

**කාය සුචරිත වාක්සුචරිත, මනො සුචරිත යන තුනෙනි**

යථොක්ත දශ අකුසල නම් සථාන්ගෙන් වෙන්වීමම දශ කුසලය හෙවත් දශවිධ සුචරිතය වන්නේය.

මේ සුචරිතයන් අතුරෙන් යමක් දක්වන්නාවූ සූත්‍රය හෝ සත්ත්ව ජනයාගේ සමථ විදර්ශනාවන් දක්වන්නාවූ සූත්‍රය- **වාසනාභාගිය** සූත්‍ර යයි දතයුත්තේය.

**නිබ්බෙධභාගිය සූත්‍රය දුක්ඛ සමුදය නිරොධ මාර්ග** යන චතුරාර්‍ය්‍ය සත්‍යයෙන් දැක්විය යුත්තේය.

**අසෙඛ භාගිය සූත්‍රය**

බුද්ධ ධර්ම ප්‍රත්‍යෙක බුද්ධ ධර්ම අභිත් ශ්‍රාවක ධර්ම යන මෙයින් දැක්විය යුත්තේය.

මෙසේ සත්වයන්ගේ කිළුට හා පිරිසිදුව (සංකිලෙස වොදාන; තථාගතයන් වහන්සේ විසින් දෙසන ලද බැවින් මුළු පාවචනය සංකිලෙස භාගියාදි සතරකට බෙදෙන පරිදිත් නැවත ව්‍යති මිශ්‍රණයෙන් සොළසක් වන පරිදිත් මැනැවින් දත යුත්තේය.

එසේම මේ අනුව සකල බුද්ධ වචනයෙන්ම පැවසුණේ සංකිලෙස වොදාන දෙක බව නිරායාසයෙන් පැහැදිලි විය යුත්තේය.

උදාහරණ.

**1 සංකිලෙස භාගිය සූත්‍රය**

කාමන්ධා ජාල සඤ්ඡන්නා - තණ්හා ඡදන ඡාදිතා
පමත්ත බන්ධුනා බද්ධා - මච්ඡාවකුම්භා මුඛෙ
ජරාමරණ මන්වෙති - වච්ඡොඛීරපකොව මාතරං ති

කාමයෙන් අන්ධවූ තෘෂ්ණා දැලින් බැඳුනාවූ තෘෂ්ණා නැමති සෙවිල්ලෙන් වැසුණාවූ කෙමන්- කාවෙහි මසුන් මෙන් මරුවා විසින් බඳනා ලද්දාවූ පුද්ගලයෝ කිරිබොන වස්සා මවුදෙන කරා යන්නාක් මෙන් ජරා මරණයන් කරා පැමිණෙත්

මෙහි තෘෂ්ණාව මතුකොට දක්වා වදාළ බැවින් මෙය තණ්හා සංකිලෙස භාගිය සූත්‍රය වන්නේය.

යට සූත්‍රාධිෂ්ඨාන විභාගයෙහි දක්වන ලද අනුසාරයෙන් සියළු දෙශනාවන්හි හෙතු- ඵල- නිස්සන්දයන් සලකා ගන්නේය.

අවජ්ජෙවජ්ජ මතිනො - වජ්ජෙචාවජ්ජ දස්සිනො
මිච්ඡා දිට්ඨි සමාදානා - සත්තාගච්ඡන්ති දුග්ගතිං ති.

නිවරදෙහි වරද යන හැඟුම් ඇත්තාවූ වරදෙහි නිවරද යනහැඟුම් ඇත්තාවූ මිසදිටු මැලඳ ගත්තා සත්ත්වයෝ දුගතියට යෙත්.

මෙහි මිථ්‍යාදෘෂ්ටිය මතුකොට දක්වා වදාළ බැවින් මෙය දිට්ඨි සඞ්කිලෙස භාගිය සූත්‍රය වන්නේය.

අධම්මෙන ධනං ලද්ධා මුසාවාදෙනචූභයං
මමෙති බාලා මඤ්ඤන්ති තං කථන්නු භවිස්සති
අන්තරායා භවිස්සන්ති සම්භතස්ස විනස්සති
මතාසග්ගං න ගච්ඡන්ති නනු එත්තාව තාගතා ති

බොරු කීමෙන්ද ප්‍රාණඝාතාදී වෙනත් පව් එකකින් හෝ කීපය කින්දැයි මෙසේ අධර්මයෙන් ධනය ලැබගෙන බාලයෝ එය මගේයයි සිතා ගනිත් එය කොයි ආකාරයකින් නම් එසේ විය හැකිද එයින් රාජ දණ්ඩනාදී බොහෝ අන්තරායෝ වන්නාහ. ඔහු රැස්කර ගත් දෙයද ඉන් නැති වන්නේය.

තවද මරණින් මතු සුගතියට නොයන්නේය. මෙපමණකින්ම ඒ බාලයෝ නැසුණෝ නොවෙත්ද? මෙහි දුගීතියට හේතුවූ දුශ්චරිතය මතුකොට දක්වා වදාළ බැවින් දුශ්චරිත සඞ්කිලෙස භාගිය සූත්‍රය වන්නේය.

**2 වාසනා භාගිය සූත්‍රය**

මනො පුබ්බඞ්ගමා ධම්මා, මනො සෙට්ඨා මනොමයා
මනසා චෙ පසන්නෙන, භාසති වා කරොති වා
තතො නං සුඛ මන්වෙති, ඡායාව අනපායිනී ති.

වේදනාදී ධර්මයෝ සිත පූර්වාඞ්ගමකොට ඇත්තාහ සිත ශ්‍රෙෂ්ඨ කොට ඇත්තාහ. සිතින් නිපන්නාහ ඉදින් පැහැදුනාවූ සිතින් කිසිවක් කියයිද කිසිවක් කරයිද කිසිවක් සිතයිද ඒ කියුම් කෙරුම් සිතුම් හේතුවෙන් තමා අත් නොහැර සිටින්නාවූ ඡායාව මෙන් ඔහු කරා විපාක සැපය අනුව එන්නේය.

මෙහි සැප විහරණයට හේතුවූ පුණ්‍ය ක්‍රියාව මතුකොට දක්වා වදාළ හෙයින් **වාසනා භාගිය සූත්‍රය** වන්නේය.

**3 නිබ්බෙධ භාගිය සූත්‍රය**

යො ච බුද්ධඤ්ච ධම්මඤ්ච – සඞ්ඝඤ්ච සරණං ගතො
චත්තාරි අරිය සච්චානි – සම්මප්පඤ්ඤාය පස්සති
දුක්ඛං දුක්ඛ සමුප්පාදං – දුක්ඛස්සච අතික්කමං
අරියඤ්චට්ඨඞ්ගිකං මග්ගං – දුක්ඛූපසම ගාමිනං
එතං ඛො සරණං ඛෙමං – එතං සරණ මුත්තමං
එතං සරණ මාගම්ම – සබ්බ දුක්ඛා පමුච්චතී ති.

යමෙක් බුදුන්ද දහම්ද සඟුන්ද සරණ ගියේද දුක දුක ඉපදීම දුක ඉක්මවීම දුක සංසිඳ වන්නාවූ ආර්‍ය්‍යාෂ්ටාඞ්ගික මාර්ගය යන මේ චතුරාර්‍ය්‍ය සත්‍යයන් මනා නුවණින් දකීද යන මෙය වනාහි නිර්භයවූ සරණය වන්නේය මෙය උතුම්වූ සරණය වන්නේය මේ සරණයට පැමිණ හෙතෙම් සියළු දුකින් මිදෙන්නේය.

මෙහි බුද්ධාදී රත්නත්‍රයයෙහි අචල ශ්‍රද්ධාව හා චතුරාර්‍ය්‍ය සත්‍යයන් නුවණින් දැකීමද දක්වා වදාරණ ලදී. මෙය සිදුවන්නේ සොවාන් මාර්ග ඥානයෙහි ශෛක්‍ෂ සඞ්ඛ්‍යාතවූ සොවාන් පුද්ගලයාගේ කෙලශ පරිනිර්වාණයට උපකාරීවූ ශ්‍රද්ධාව හා ප්‍රඥාව මෙයින් විශෙෂයෙන් දක්වා වදාළ බැවින්

මෙය නිබ්බෙධ භාගිය සූත්‍රය වන්නේය,

## 4 අසෙඛ භාගිය සූත්‍රය

බාහිත්වා පාපකෙ ධම්මෙ – යෙචරන්ති සදාසතා
ඛීණ සංයොජනා බුද්ධා – තෙවෙ ලොකස්මිං බ්‍රාහමණා ති.

පාප ධර්මයන් බැහැරකොට සියළු කල්හි සමෘති ඇතිව යම් අය හැසිරෙද්ද සංයොජනයන් ක්‍ෂයකළාවූ පරම සත්‍යයන් අවබොධ කළාවූ ඔව්හු ඒ කාන්තයෙන් ලොකයෙහි බ්‍රාහමණ නම් වෙති.

මෙහි අශෛක්‍ෂ නම්වූ රහතුන්වහන්සේ පිළිබඳ සීල සමාධි ප්‍රඥාවන් මතුකොට දක්වා වදාළ බැවින් මෙය අසෙඛ භාගිය සූත්‍රය වන්නේය.

## 5 සඞ්කිලෙස භාගිය හා වාසනා භාගිය සූත්‍රය

චත්තාරො මෙ මහාරාජ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං කතමෙ චත්තාරො:

තමො තම පරායණො තමො ජොති පරායණො ජොති තම පරායණො ජොති ජොති පරායණො ති.

මහරජ, ලොකයෙහි පුද්ගලයෝ සතරදෙනෙක් වෙති.

එනම්:

අඳුරෙන් අඳුරට යන්නාය, අඳුරෙන් එළියට යන්නාය, එළියෙන් අඳුරට යන්නාය, එළියෙන් එළියට යන්නාය යන සතරදෙනායි.

අඳුරෙන් අඳුරට යන්නා නම් පාප විපාක විඳිමින් පව් රැස් කරන්නාය, එළියෙන් අඳුරට යන්නා නම් පුණ්‍ය විපාක විඳිමින් පව් රැස් කරන්නායි. මේ දෙදෙනාගේ දැක්වීමෙන් මේ සූත්‍රය සඞ්කිලෙස භාගිය වන්නේය. එසේම අඳුරෙන් එළියට යන්නා නම් පාප විපාකය විඳිමින් පිං රැස් කරන්නාය එළියෙන් එළියට යන්නා නම් පුණ්‍ය විපාක විඳිමින් පින් රැස් කරන්නාය මේ දෙදෙනාගේ දැක්වීමෙන් වාසනා භාගියද වන්නේය.

## 6 සංකිලෙස භාගිය සූත්‍රය හා නිබ්බෙධ භාගිය සූත්‍රය

නතං දළ්හං බන්ධනමාහු ධීරා යදායසං දරුජං බබ්බජඤ්ච
සාරත්තරත්තා මණිකුණ්ඩලෙසු පුත්තෙසු දරෙසුචයා අපෙක්ඛා
එතං දළ්හං බන්ධන මාහුධීරා ඔහාරිනං සිථිලං දුප්පමුඤ්චං
**• එතම්පි ඡෙත්වාන පරිබ්බජන්ති අනපෙක්ඛිනො**
**කාමසුඛං පහායාති.**

යකඩින් කළ දම්වැල් මාංචු ආදියෙන් කරන ලද්දවූද දැවයෙන් කළ දඬු කඳන් ආදියෙන් කරන ලද්දවූද බබුස් තණ ආදි කෙඳිවලින් ගොතා කළ රැහැතින් කරන ලද්දවූද යම් ඒ බැඳීමක් ඇත්ද එය දැඩි බැඳීමකැයි නුවණැත්තෝ නොකියති. මිණි කොඩොල්හිද (මිණි කොඩොල් යනුවෙන් රන් රුවන් ආභරණාදී වස්තූහු ගැණෙත්) පුත්‍රයන් කෙරෙහිද රාගයෙන් ඇලුණු යම් අපෙක්ෂාවක් වේද එය එහා මෙහා කළ හැකිසේ ලිහිල් වුවත් මිදිය නොහැකිවූ දැඩි බැම්ම කැයි නුවණැත්තෝ කියති.

ආලය හරින්නාවූ නුවණැත්තෝ මේ බන්ධනයද සිඳදමා කාම් සැපය හැර පැවිදි වෙත්. මෙහි වස්තුවෙහි හා අඹු දරුවන් කෙරෙහි තෘෂ්ණාව සඞ්කිලෙසයයි කාම් සැපය හැර දැම්ම නිර්වේදයයි මේ දෙකම මතුකොට දක්වන ලද බැවින් මෙය සඞ්කිලෙස භාගිය හා නිබ්බෙධ භාගිය සූත්‍රය වන්නේය.

## 7 සඞ්කිලෙස භාගිය හා අසෙඛ භාගිය සූත්‍රය

එකමූලං ද්විරාවට්ටං, තිමලං පඤ්ච පත්ථරං
සමුද්දං ද්වාදසාවට්ටං, පාතාලං අතරීඉසී ති.

සියළු කෙලෙසුන්හට අසහාය මූලක්වූ ශාස්වත උච්ඡේද දෘෂ්ටීන්ගේ වශයෙන් ආවෘත දෙකක් ඇති රාග, ද්වේෂ මෝහ සඞ්ඛ්‍යාත මල තුනක් ඇති. කමනීයවූ රූප, ශබ්ද, ගන්ධ, රස ස්පර්ශ යන පැතිරීම් පසක් ඇති පිරවිය නොහැකි අර්ථයෙන් සමුද්‍ර නම්වූ චක්ෂු සොත ඝ්‍රාණ ජිව්හා කාය මනස් යන බාහිරාය තනයන්හි ආවර්තන පරිවර්තන වන හෙයින් දොළොස් ආවෘතයක් ඇති ප්‍රතිෂ්ඨා රහිත හෙයින් පාතාල නම්වූ තෘෂ්ණාව විමුක්තිය සොයන්නාවූ රහතන් වහන්සේ එතර කළසේක.

මෙහි ලක්ෂණ සහිතව දක්වන ලද තෘෂ්ණාව සඞ්කිලෙසයයි එය එතර කළ පුද්ගලයා වශයෙන් දක්වන ලද රහතන් වහන්සේ අශෛක්ෂයායි.

මේ දෙක මතුකොට දක්වන ලද හෙයින් මෙය සඞ්කිලෙස භාගිය හා අශෛක්ෂ භාගිය සූත්‍රය වන්නේය.

## 8 වාසනා භාගිය හා නිබ්බෙධ භාගිය සූත්‍රය

**වෙමානි භික්ඛවෙ පධානානි දුරභි සම්භවානි** ලොකස්මිං කතමානි වෙ? යඤ්ච ගිහිනං **අගාර** මජ්ඣාවසතං චීවර පිණ්ඩපාත සෙනාසන ගිලාන පච්චය භෙසජ්ජ **පරික්ඛාරානුප්පදානත්ථං** පධානං යඤ්ච **අගාරස්මා අනගාරියං** පබ්බජිතානං **සබ්බූපධි පටිනිස්සග්ගත්ථං** පධානං **ඉමානි ඛො භික්ඛවෙ** වෙ පධානානි දුරභි සම්භවානි ලොකස්මිං.

**මහණෙනි!** මේ ලොකයෙහි මේ වීර්‍ය්‍ය දෙකක් පිරීමට **දුෂ්කර** වෙත් කවර දෙකක්ද යත්?

ගිහිගෙයි **වසන්නවුන්** විසින් පැවිද්දන්ට චීවර පිණ්ඩපාත **සෙනාසන** ගිලන්පස බෙහෙත් පිරිකර සපයා දීමට ගන්නා වීර්‍ය්‍යයද.

ගෙයින් **නික්ම** අනගාරික **ශාසනයෙහි** ඇතුළත් වූවන් විසින් **ස්කන්ධාදී සියළු උපධීන් දුරලීම පිණිස** ගන්නා වීර්‍ය්‍යයද යන දෙකයි.

මහණෙනි! මේ **වීර්‍ය්‍ය** දෙක ලොකයෙහි පිරීමට දුෂ්කර වූවාහු වෙත්. මෙහි චීවරාදි ප්‍රත්‍යය දානය මතු සැප විපාක **පිණිස** පවත්නා **පුණ්‍ය** ක්‍රියාවක් හෙයින් **වාසනාවයි.**

උපධීන්ගේ දුරලීම වොදන පක්ෂයෙහි වූවක් බැවින් නිර්වේදයයි.

මේ දෙක මතුකොට වදාළ බැවින් මෙය වාසනා භාගිය හා නිබ්බෙධ භාගිය සූත්‍රය වන්නේය. මේ නයින් සෙසු භෙදයන් හටද උදාහරණ පාවචනයෙන් බලා දත හැකි බැවින් හා ග්‍රන්ථ බාහුල්‍ය භීතියෙන් සොළස විධ පඨානයට උදාහරණ දැක්වීම මෙයින් නවත්වමු.

**යම්** සූත්‍රයක සංක්ලෙශ භාගයද සංක්ලෙශ ප්‍රහාණෝපාය භාගයද එයින් ලැබිය යුතු අග්‍ර ඵල ගුණ විශෙෂ භාගයද අනු සන්ධි වශයෙන් හෝ ව්‍යති මිශ්‍ර වශයෙන් දක්වන ලද්දේ නම් එය

**සඞ්කිලෙස භාගිය වාසනා භාගිය නිබ්බෙධ භාගිය හා අසෙඛ භාගිය සූත්‍ර** නම් වන්නේය.

**නෙව සඞ්කිලෙස භාගිය, නවාසනා භාගිය, න නිබ්බෙධ භාගිය නාසෙඛ භාගිය සූත්‍රය** නම් කවරේද? මේ භාග සතරම යම්කිසි සූත්‍රයක අප්‍රකටද **එය** මේ අසම් භාගිය සූත්‍රයයිද.

**සොහි භගවා ජානං ජානාති පස්සං පස්සති** යනාදිය ඊට උදාහරණ යයිද නෙත්තිරත්නාකර කර්තෘන් වහන්සේ විසින් කියා තිබේ.

නමුත් එය ඒකාන්ත වශයෙන් නොගෙන මතාන්තරයක්ද උන්වහන්සේ දක්වති. එනම්: මේ සඞ්කිලෙස භාගියාදී සතර සූත්‍රයන්ගේ ප්‍රස්තාරයෙහි අවසානයට ලැබෙන හෙයින් එබන්දක් දැක්වූවා මිස පාවචනයෙහි එය ලැබෙන දෙයක් ලෙස නොවේය කියායි එබැවින් සෙසු භෙද පසළොස පාවචනයෙහි ඇති සූත්‍රයෝය. මෙය පාවචනයෙහි නැති සූත්‍රයකි යනුයි.

නමුත් පළමු මතය යොග්‍ය තරයයි අපි හඟිමු.

# එහි අටවිසි වැදෑරුම් පස්ථානය කවරේදයත්?

| | | | |
|---|---|---|---|
| 1 | ලෝකියං | 15 | සකවචන පරවචනං |
| 2 | ලෝකුත්තරං | 16 | විස්සජ්ජනීයං |
| 3 | ලෝකිය ලෝකුත්තරං | 17 | අවිස්සජ්ජනීයං |
| 4 | සත්තාධිට්ඨානං | 18 | විස්සජ්ජනීය අවිස්සජ්ජනීයං |
| 5 | ධම්මාධිට්ඨානං | 19 | කම්මං |
| 6 | සත්තාධිට්ඨාන ධම්මාධිට්ඨානං | 20 | විපාකො |
| 7 | ඤාණං | 21 | කම්ම විපාකො |
| 8 | ඤෙය්‍යං | 22 | කුසලං |
| 9 | ඤාණ ඤෙය්‍යං | 23 | අකුසලං |
| 10 | දස්සනං | 24 | කුසලාකුසලං |
| 11 | භාවනා | 25 | අනුඤ්ඤාතං |
| 12 | දස්සන භාවනා | 26 | පටික්ඛිත්තං |
| 13 | සකවචනං | 27 | අනුඤ්ඤාත පටික්ඛිත්තං |
| 14 | පරවචනං | 28 | ථවො |

යන විසි අටයි.

1 යම් සූත්‍රයක ලෝකය පිළිබඳ අර්ථයක් දක්වන ලද්දේ නම් එය ලෞකික සූත්‍රයයි.

ලාභො අලාභො අයසො යසොච නින්දාපසංසාච සුඛංච දුක්ඛං
එතෙ අනිච්චා මනුජෙසු ධම්මා අසස්සතා විපරිණාම ධම්මා ති.

ලාභය අලාභය අයසය යසසය නින්දාවය ප්‍රශංසාවය සැපය දුකය යන මේ අනිත්‍යවූ අශාස්වතවූ පෙරළෙන සුළුවූ ධර්ම අට මිනිසුන් අතර වෙත් **මේ ලෞකික සූත්‍රයයි**

2 යම් සූත්‍රයක ලෝකෝත්තර අර්ථයක් දක්වන ලද්දේ නම් එය **ලෝකෝත්තර සූත්‍රයයි.**

යස්සින්ද්‍රියානි සමථං ගතානි – අස්සා යථා සාරථිනා සුදන්තා
පහීන මානස්ස අනාසවස්ස–දෙවාපි තස්ස පිහයන්ති තාදිනො ති.

යමෙකුගේ ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයෝ සාරථියකු විසින් මැනවින් දමිතවූ අසුන් මෙන් සමථයට ගියාහුද පහවූ මාන ඇති ආශ්‍රව රහිතවූ තාදී ගුණ ඇති ඔහට දෙවියෝ පවා කැමති වෙත්. **මේ ලෝකුත්තර සූත්‍රයයි.**

3 **යම්** සූත්‍රයෙක ප්‍රදේශයකින් ලෝකය පිළිබඳ අර්ථයක්ද ප්‍රදේශයකින් ලෝකයෙන් එතර පිළිබඳ අර්ථයක්ද දක්වන ලද්දේ නම් **එය ලෞකික ලොකොත්තර සූත්‍රයයි.**

පඤ්චජාගරතං සුත්තා – පඤ්ච සුත්තෙසු ජාගරා
පඤ්චහි රජමාදෙති – පඤ්චහි පරිසුජ්ඣති ති.

පස්දෙනෙක් නිදිවරද්දී පස්දෙනෙක් නිදිගත්තෝය පස්දෙනෙක් නිදද්දී පස්දෙනෙක් නිදිවරන්නෝය පසකින් රජස ඇරගනී පසකින් පිරිසිදු වෙයි.

මෙය මුළුමනින් ලෞකිකාර්ථයක් මෙන් පෙනී යතත් මෙය ලෞකික ලොකොත්තර දෙකින් මුසුය.

මෙහි නිදිවැරීම නම් ක්‍රියාත්මක බවයි නිදි ගැනීම නම් ක්‍රියා රහිත බවයි.

ශ්‍රද්ධා සමෘති සමාධි ප්‍රඥා වීර්‍ය යන ඉන්ද්‍රිය පස ක්‍රියාත්මක වන කල්හි **කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්ච කුක්කුච්ච, විචිකිච්ඡා** යන නිවරණ පස ක්‍රියා රහිත වෙති.

නිවරණ පස ක්‍රියාත්මක වන කල්හි ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයෝ ක්‍රියා රහිත වෙති. නිවරණ පසින් කෙලෙස් රජස් ඇතිකර ගනී. ශ්‍රද්ධාදී ඉන්ද්‍රිය පසින් පිරිසිදු වෙයි යනු මෙහි අදහසයි.

නිවරණයෝ ලෞකිකයෝමය. ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයෝ පාරිශුද්ධිය ඇති කරන කල්හි ලොකොත්තරද වෙති. එබැවින් මෙය **ලෞකික ලොකොත්තර සූත්‍රයයි,**

ලෞකිකාභාස ලක්ෂණයද ලෞකික ලොකොත්තර මිශ්‍ර ලක්ෂණයද යන ලක්ෂණ දෙකක් මෙහි පවති. ඉන් එක් ලක්ෂණයක් පමණක් ඇතත් **ලෞකික ලොකොත්තර සූත්‍රය** විය යුත්තේය.

4 යම් සූත්‍රයක් සත්වයන් ගැන සත්ව ප්‍රඥප්ති මුඛයෙන් දෙසන ලද්දේද ඒ **සත්තාධිෂ්ඨාන සූත්‍රයයි.**

පියො ච ගරු භාවනීයො – වත්තා ච වචනක්ඛමො
ගම්භීරඤ්ච කථං කත්තා – නොචඨානෙ නියොජයෙ
තං මිත්තං මිත්ත කාමෙන – යාවජීවම්පි සෙවියං ති.

ප්‍රියවූ ගරුවූ සැලකිය යුතුවූ අවවාද කරන්නාවූ වචනය ඉවසන්නාවූ ගැඹුරු කථා කියන්නාවූ නොතැන නොයොදවන්නාවූ එබඳු මිත්‍රයා මිත්‍රයන් කැමැත්තා විසින් දිවිහිමියෙන් වුවත් සෙවනය කළ යුත්තේය.

මෙය මිත්‍ර සඞ්ඛ්‍යාත සත්ත්වයා අධිෂ්ඨාන කොට දෙසන ලද්දක් හෙයින් **සත්ත්වාධිෂ්ඨාන සූත්‍රයයි.**

යම් සූත්‍රයක් ධර්මපද ශීර්ෂයෙන් දෙසන ලද්දේද එය **ධර්මාධිෂ්ඨාන සූත්‍රයයි.**

සුසුඛං වත නිබ්බාණං – සම්මා සම්බුද්ධ දෙසිතං
අසෝකං විරජං ඛෙමං – යත්ථ දුක්ඛං නිරුජ්ඣති ති.

සම්මා සම්බුදුන් විසින් දෙසන ලද නිවන ඒකාන්තයෙන් ඉතා සැපය ශෝක රහිතය රජස් රහිතය බිය රහිතය දුක එහිදී නිරුද්ධ වෙයි.

යම් සූත්‍රයක සත්ත්ව ප්‍රඥප්ති මුඛයෙන් ධර්මය දක්වන ලද්දේද නැතහොත් ප්‍රදේශයක් සත්ත්ව ප්‍රඥප්ති මුඛයෙන් හා ප්‍රදේශයක් ධර්ම පද ශීර්ෂයෙන් දේශනා කරණ ලදද එය **සත්ත්වාධිෂ්ඨාන ධර්මාධිෂ්ඨාන සූත්‍රයයි.**

මාතරං පිතරං හන්ත්වා – රාජානො වෙච ඛත්තියෙ
රට්ඨං සානුචරං හන්ත්වා – අනීඝො යාති බ්‍රාහ්මණොති

මවත් පියත් නසා කැත් රජුන් දෙදෙනෙකු නසා අනුවරයන් සහිත රටකුත් නසා බමුණා නිදුක්වයයි.

මෙහි මවයයි කියන ලද්දේ තෘෂ්ණාවටය තෘෂ්ණාව සත්ත්වයන් උපදවන හෙයිනි.

පියායයි කියන ලද්දේ මානයටය මානය නම්ගොත් සලකන හෙයිනි පියාගෙන්ද නම්ගොත් ලැබේ කැත් රජුන් දෙදෙනායයි කියන ලද්දේ ශාස්වත උච්ඡේද යන දෘෂ්ටි දෙකටය රජහුද වැසියනට ප්‍රධානයෝය. දෙසැට දෘෂ්ටීන්හට මේ දෙක ප්‍රධාන වෙති.

රටයයි කියන ලද්දේ ද්වාදශ ආයතනයන් හටය ඔහු රටක් මෙන් පැතිර පවතිත්. අනුවරයයි කියන ලද්දේ නන්දිරාගයටය සතුටින් ද්වාදශායතන යන්හි ඇලෙන හෙයිනි.

අනුවරයාද රටේ ආදායම් පාලනයෙහි නිරත වේ. බ්‍රාහ්මණ යයි කියන ලද්දේ රහතන් වහන්සේටය. පාපයන් ප්‍රතිබාහනය කළ හෙයිනි.

මෙහි මාතරං පිතරං රාජානො වෙච ඛත්තියෙ රට්ඨං සානුචරං බ්‍රාහ්මණො යන පද පෙනෙන හෙයින් මුළුමනින් සත්ත්වාධිෂ්ඨාන යක් මෙන් පෙනෙනත්

මාතරං පිතරං හන්ත්වා රාජානො චෙව ඛත්තියෙ රට්ඨං සානු චරං හන්ත්වා යනු ධම්මාධිෂ්ඨානයි.

අනීඝො යාති බ්‍රාහමණො යනු රහතන් වහන්සේ උදෙසා කිහෙයින් සත්වාධිෂ්ඨානයි.

එහෙයින් මෙහි සත්වාධිෂ්ඨානාභාස ධම්මාධිෂ්ඨාන ලක්ෂණයද සත්වාධිෂ්ඨාන ධම්මාධිෂ්ඨාන මිශ්‍ර ලක්ෂණයද යන ලක්ෂණ දෙකක් පෙනේ. එක් ලක්ෂණයක් පමණක් ඇතත් සත්වාධිෂ්ඨාන ධම්මාධිෂ්ඨාන සූත්‍රය වන්නේය.

7 යම් සූත්‍රයක් ප්‍රඥාචාරයෙන් දෙසන ලද්දේද එය ඥාන නම් වේ.

යංතං ලොකුත්තරං ඤාණං සබ්බඤ්ඤුයෙන වුච්චති
න තස්ස පරිහානත්ථි සබ්බකාලෙ පවත්තතී ති.

සර්වඥයයි කියනු ලැබීමට කරුණුවූ යම් ඒ ලොකොත්තර නුවණක් වේද එහි පිරිහීමක් නැත්තේය සියළු කාලයෙහි පවතින්නේය මේ ඥාන සූත්‍රයයි.

8 යම් සූත්‍රයක නුවණින් අවබොධ කළයුතු ධම්මයෝ දෙසන ලද්දාහුද එය ඥෙය්‍ය නම් වේ.

චතුන්නං අරිය සච්චානං – යථා භූතං අදස්සනා
සංසරිතං දීඝමද්ධානං - තාසුතා ස්වෙව ජාතිසු

තානි එතානි දිට්ඨානි භවනෙත්ති සමූහතා
උච්ඡින්නං මූලං දුක්ඛස්ස නත්ථිදානි පුනබ්භවොති,

චතුරාර්‍ය්‍ය සත්‍යයන් තත්වූ පරිද්දෙන් නොදැකීමෙන් ඒ ඒ ජාතීන්හි බොහෝ කාලයක් සංසරණය කරණ ලදී.

ඒ මේ චතුරාර්‍ය්‍ය සත්‍යයෝ දක්නා ලදහ භවනෙත්ති සඞ්ඛ්‍යාත තෘෂ්ණාව නසන ලදී දුකෙහි මූල සිඳින ලදී දැන් නැවත ඉපදීමක් නැත්තේය.

නුවණින් අවබොධ කළයුතු ආර්‍ය්‍ය සත්‍යයන් දක්වන ලද හෙයින් මෙය ඥෙය්‍ය සූත්‍රයයි.

යම් සූත්‍රයක ඥාන ඥෙය දෙක දක්වන ලද්දේ නම් එය ඤාණඤෙය්‍ය නම් වන්නේය,

සබ්බෙ සඞ්ඛාරා අනිච්චාති - යදා පඤ්ඤාය පස්සති
අථ නිබ්බින්දති දුක්ඛෙ - **එසමග්ගො** විසුද්ධියා ති.

සියළු සංස්කාර ධර්මයෝ **අනිත්‍යයහයි යම්** කලෙක නුවණින් දකිද එකල දුකෙහි නිර්වේදය (කලකිරීමට) පැමිණෙයි **මේ විසුධි යට** මාර්ගය වන්නේයැ.

මෙහි සියළු සංස්කාර ධර්මයෝ අනිත්‍යයහයි යනු **ඥෙයයයි**

යම් කලෙක නුවණින් දකිද යනු **ඥානයයි** එකල දුකෙහි කලකිරෙයි මේ විශුඩියට මාර්ගය වන්නේය යනු **ඥානයද ඥෙයයද** වන්නේය. **මේ ඥානඥෙය සූත්‍රයයි**

10 යම් සූත්‍රයක සෝතාපත්ති මාර්ගය **දක්වන** ලද්දේද **එය** දර්ශන නම් වන්නේය. ප්‍රථමකොට **නිර්වාණය දක්නා** හෙයින් **සෝවාන්** මාර්ගය දර්ශන භූමියයි කියනු ලැබේ.

යථින්දඛීලො පඨවිං සිතොසියා
චතුබ්භි වාතෙහි අසම්පකම්පියො
තථූපමං සප්පුරිසං වදාමි
යො **අ**රිය සච්චානි අවෙච්ච පස්සති ති.

යම්සේ ඉන්ද්‍රඛීලය පොළොවෙහි **හිඳුවන** ලද්දේ සතර දිගින් හමන සුළඟින් සෙලවිය නොහැකි වේද එපරිද්දෙන්ම **යමෙක්** ආර්‍ය්‍ය සත්‍යයන් නුවණින් දකිද ඔහු **සත්පුරුෂයෙකැයි** කියමි. **මේ** **දර්ශන සූත්‍රයයි.**

11 යම් **සූත්‍රයෙක** සකෘදාගාමි අනාගාමි **අර්හත්මාර්ග දක්වන** ලද්දාහුද **එය** භාවනා නම් වන්නේය.

ප්‍රථම මාර්ගයාගේ **වැඩිමක් හෙයින්** සකෘදාගාමි **ආදි** මාර්ග තුන **භාවනා භූමියයි** කියනු ලැබේ.

යස්සින්ද්‍රියානි **සුභාවිතානි** -
අජ්ඣත්තං බහිද්ධාච සබ්බලොකෙ
**නිබ්බිජ්ඣ ඉමං පරංචලොකං -**
**කාලං කඞ්ඛති භාවිතො ස දන්තො ති.**

යමෙකු විසින් **අධ්‍යාත්මයෙහිද** බැහැරද යන සියළු ලොකය විෂයෙහි චක්ෂුරාදී ඉන්ද්‍රියයෝ මැනවින් මඩනා ලද්දාහුද **භාවිතවූ** සුදාන්තවූ හෙතෙම **මෙලොවද** පරලොවද අපෙක්ෂා හැර කාලය (අවසානය) බලා සිටී. **මේ භාවනා සූත්‍රයයි.**

12 යම් සූත්‍රයක මේ දෙකම දක්වන ලද්දේනම් **එය** දර්ශන **භාවනා** නම් වන්නේය.

පඤ්ච ඡින්දෙ පඤ්ච ජහෙ - පඤ්ච චුත්තරි භාවයෙ
**පඤ්ච සංගාතිගො භික්ඛු** - ඔඝතිණ්ණොති වුච්චති ති.

**සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බත පරාමාස කාමරාග ව්‍යාපාද** යන පස සිඳදමනු. **රූපරාග අරූපරාග මාන උද්ධච්ච අවිජ්ජා** යන පස හැර දමනු. මත්තෙහි **ශ්‍රද්ධා වීර්‍ය්‍ය ස්මෘති සමාධි ප්‍රඥා** යන පස වඩනු. **රාග ද්වේෂ මෝහ මාන දිට්ඨි** යන **සඞ්ග** පස ඉක්ම ගිය මහණ සැඩ පහරින් එතර වූවෙකැයි කියනු ලැබේ.

මෙහි පසක් සිඳ දමනු පසක් හැර දමනු යනු **දර්ශනයයි.**

පසක් වඩනු පසක් ඉක්ම ගිය මහණ සැඩ පහරින් එතරවූවෙකැයි කියනු ලැබේ. යනු භාවනායි **මේ දර්ශන** භාවනා සූත්‍රයයි.

13 යම් සූත්‍රයක ධර්මස්වාමිවූ බුදුරජාණන් වහන්සේගේම වචනය දක්වන ලද්දේද එය **සකවචන** නම් වන්නේය:

සබ්බ පාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා
සචිත්ත පරියොදපනං - එතං බුද්ධාන සාසනං ති.

සියළු පව් නොකිරීමද සියළු කුසල් රැස්කිරීමද තමාගේ සිත පිරිසිදු කරගැනීමද යන මෙය බුදුවරුන්ගේ අනුශාසනාවයි මේ **සකවචන සූත්‍රයයි.**

14 යම් සූත්‍රයක අනුන්ගේ වචනය දක්වන ලද්දේද එය පරවචන නම් වන්නේය.

පථවී සමො නත්ථි විත්ථතො -
නින්නො පාතාල සමො න විජ්ජති
මේරු සමො නත්ථි උන්නතො -
චක්කවත්ති සදිසො නත්ථි පොරිසො **ති.**

පොළොව හා සමාන පතළ දෙයක් නැත. පාතාලය හා සමාන පහත් තැනක් නැත. මේරුව හා සමාන උස් වූවක් නැත. සක්විති රජු සමාන පුරුෂයෙක් නැත. **මේ පරවචන සූත්‍රයයි.**

15 යම් සූත්‍රයක සකවචන පරවචන දෙක දක්වන ලද්දේද එය සකවචන පරවචන නම් වන්නේය.

ඛත්තියො විපදං සෙට්ඨො - බලිවද්දො චතුප්පදං
කොමාරි සෙට්ඨා භරියානං - යො ච පුත්තානං පුබ්බජො
සම්බුද්ධො විපදං සෙට්ඨො - ආජානීයො චතුප්පදං
සුස්සූසා සෙට්ඨා භරියානං - යො ච පුත්තාන මස්සවො ති.

දෙපා ඇත්තවුන් අතුරෙන් ක්ෂත්‍රියයා ශ්‍රෙෂ්ඨය සිව්පා ඇත්තවුන් අතුරෙන් ගොනා ශ්‍රෙෂ්ඨය භාර්‍ය්‍යාවන් අතුරෙන් බාලවයස් ඇත්තී ශ්‍රෙෂ්ඨය පුත්‍රයන් අතුරෙන් පළමු උපන්නා ශ්‍රෙෂ්ඨය

මෙය දෙවතාවෙකු විසින් කියන ලද්දක් හෙයින් **පරවචනයි.**

දෙපා ඇත්තවුන් අතුරෙන් බුදුරජාණන් වහන්සේ ශ්‍රේෂ්ඨය සිව්පා ඇත්තවුන් අතුරෙන් ආජානීයයා (කරුණු දන්නා) ශ්‍රේෂ්ඨයැ භාර්‍යාවන් අතුරෙන් හිමියා විචාරා සේවය කරන්නී ශ්‍රේෂ්ඨයැ පුත්‍රයන් අතුරෙන් කීකරුවා ශ්‍රේෂ්ඨයැ මෙය බුදුරජාණන් වහන්සේ විසින් දෙවතාවාගේ ගාථාවට වදාළ ප්‍රති ගාථාව බැවින් සකාවචනය – දෙක එකතුව සකාවචන පරවචන සූත්‍රයයි.

16 යම් සූත්‍රයක දක්වන ලද පද විස්තර කළයුතු වේද්ද එය විසජ්ජනීය නම් වන්නේය.

තථාගතයන් වහන්සේ විසින් දෙසන ලද සූත්‍රයන්ගෙන් වැඩි හරියක්ම විසජ්ජනීයම වේ.

මේ නුවණින් දතයුත්තේය මේ නිරණයකොට දතයුත්තේය මේ පහකල යුත්තේය මේ වැඩිය යුත්තේය මේ සාක්ෂාත් කටයුත්තේය මේ ධර්මයෝ මෙසේ ගන්නා ලද්දාහු මෙබඳු ඵලයක් උපදවත් එසේ ගන්නා ලද ධර්මයන්ගේ මෙබඳු අර්ථයක් වන්නේය යනාදීන් විස්තර කළ යුත්තාහුය විස්තර කළයුතු ක්‍රමය හෝ විසජ්ජනීය යයි.

සබ්බෙ සඞ්ඛාරා අනිච්චාති – යදා පඤ්ඤාය පස්සති
අථ නිබ්බින්දති දුක්ඛෙ – එස මග්ගො විසුද්ධියාති.

මෙහි සංස්කාරයෝ නම් කවරහුද? අනිත්‍ය වන්නේ කෙසේද? ප්‍රඥාව නම් කවරේද? නිර්වේදයට පැමිණෙන්නේ කෙසේද? විසුද්ධියට මාර්ගය වන්නේ කෙසේදැයි විසඳිය යුතු හෙයින් විසජ්ජනීයයි.

17 යම් සූත්‍රයක විස්තර නොකළ යුත්තක් දක්වන ලදද ඒ හේතුවෙන් එය අවිසජ්ජනීය නම් වන්නේය.

පුබ්බා භික්ඛවෙ කොටි න පඤ්ඤායති අවිජ්ජානීවරණානං සත්තානං තණ්හා සංයොජනානං සකිං නිරයං සකිං තිරච්ඡාන යොනිං සකිං පෙත්ති විසයං සකිං අසුර යොනිං සකිං දෙවෙ සකිං මනුස්සෙ සන්ධාවතං සංසරතං.

මහණෙනි! අවිද්‍යාවෙන් වැසුණාවූ තෘෂ්ණාවෙන් බැඳුනාවූ වරක් නිරයටද වරක් තිරිසන් යෝනියටද වරක් ප්‍රේත විෂයටද වරක් අසුරයෝනියටද වරක් දෙවියන් අතරටද වරක් මිනිසුන් අතරටද සංධාවනය කරන්නාවූ සංචරණය කරන්නාවූ සත්ත්වයන්ගේ මුල්කොණ නොපෙණෙයි. සත්ත්වයන්ගේ මුල්කොණ නොපෙනෙන්නේයයි වදාළ බැවින් එය අවිසජ්ජනීයයි:

මෙසේ යමක් භාග්‍යවතුන් වහන්සේ අසංඛ්‍යෙයය අප්‍රමෙයයයි හෝ නොසිතිය යුතුයයි වදාළසේක්ද එය අවිසජ්ජනීයයි විස්තර නොකළ යුතු ක්‍රමය හෝ අවිසජ්ජනීයයි.

18 විස්සජ්ජනීය අවිස්සජ්ජනීය දෙකින් යුක්තාවූයේ විස්සජ්ජනීයා විස්සජ්ජනීය නම් වන්නේය.

> පස්සති භගවා දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්ත මානුසකෙන සත්තෙ චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ යථා කම්මූපගෙ සත්තෙ පජානාති.

භාග්‍යවතුන් වහන්සේ මිනි ඇස ඉක්ම ගියාවූ පිරිසිදුවූ දිවැසින් චුතවන්නාවූද උපදින්නාවූද සත්ත්වයන් හීනවූවන් මෙන්ම ප්‍රණීත වූවන්ද සවර්ණ වූවන් මෙන්ම දුර්වර්ණ වූවන්ද කර්මයවූ පරිද්දෙන් යන්නවුන් දක්නාසේක.

මෙහි භාග්‍යවතුන් වහන්සේ කවරේද? දිවැස කවරේද? යනු විස්සජ්ජනීයයි.

කවර සත්ත්වයන්ද යනු අවිස්සජ්ජනීයයි මේ **විස්සජ්ජනීයා විස්සජ්ජනීයයි.**

19 කර්මය දක්වන ලද සූත්‍රය කර්ම නම් වන්නේයැ.

> උභො පුඤ්ඤං ච පාපං ච – යං මච්චො කුරුතෙ ඉධ
> තං හි තස්ස සකං හොති – තං ච ආදාය ගච්ඡති.
> තඤ්චස්ස අනුගං හොති – ඡායාව අනපායිනි ති

මනුෂ්‍ය තෙමේ මේ ලොකයෙහි යම් පින් පව් යන දෙකක් කෙරේද? එය ඔහුට අයිති වන්නේය එය රැගෙන යන්නේය පහව නොයන්නාවූ ඡායාව මෙන් එය ඔහු අනුව යන්නේ වෙයි මේ **කර්ම** සූත්‍රයයි.

20 විපාකය දක්වන ලද සූත්‍රය විපාක නම් වන්නේයැ.

> චිරප්පවාසිං පුරිසං – දූරතො සොත්ථිමාගතං
> ඤාතිමිත්තා සුහජ්ජා ච – අභිනන්දන්ති ආගතං
> තථෙව කතපුඤ්ඤම්පි – අස්මා ලොකා පරං ගතං
> පුඤ්ඤානි පතිගණ්හන්ති – පියං ඤාතිංව ආගතං ති.

බොහෝ කලක් විදෙශයක වැස දුර සිට සුවසේ ආපසු පැමිණියකු නෑයෝද මිතුරෝද යහළුවෝද සතුටින් පිළිගනිත්ද එසේම පිං කළාවූ මෙලොවින් පරලොව ගිය පුද්ගලයා තමා කළ පින් තුමූම තමා වෙත ආ ප්‍රිය ඥාතියකු මෙන් සතුටින් පිළිගනිත්. මෙය කුසල විපාකය දක්වන ලද හෙයින් **විපාක** සූත්‍රයයි.

21 කර්මය හා විපාකය දක්වන ලද සූත්‍රය **කර්ම විපාක** නම් වන්නේයැ.

> න හි ධම්මො අධම්මො ච – උභො සමවිපාකිනො
> අධම්මො නිරයං නෙති – ධම්මො පාපෙති සුගතිං ති

ධර්ම චරණයද අධර්ම චරණයද යන දෙක සම විපාක ඇත්තාහු නොවෙති අධර්ම චරණය සත්‍වයා නිරයට පමුණුවයි. ධර්ම චරණය සුගතියට පමුණුවයි.

මෙහි ධර්මය අධර්මය යනු පුණ්‍ය කර්ම පාප කර්මයන් හෙයින් කර්ම යයි නිරය සුගතිය යන දෙක අධර්ම ධර්මයන්ගේ විපාකයයි මේ කර්ම විපාක සූත්‍රයයි

22 කුසලය දක්වන ලද සූත්‍රය **කුසල** නම් වන්නේය.

යස්ස කායෙන වාචාය – මනසා නත්ථි දුක්කටං
**සංවුතං තීහි ඨානෙහි – තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං ති.**

යමෙකුට කයින් වචසින් හා මනසින් කරණ ලද වරදක් නැත්තේද මේ තුන් තැනින් සංවරවූ ඔහු මම බ්‍රාහ්මණයකැයි කියමි මේ **කුසල** සූත්‍රයයි.

23 අකුසලය දක්වන ලද සූත්‍රය අකුසල නම් වන්නේය

යස්ස අච්චන්ත දුස්සීල්‍යං – මාළුවා සාල මිවොත්ථතං
**කරොතිසො තථත්තානං – යථානං ඉච්ඡති දිසො ති.**

මාළුවා වැලක් සල් ගසක් මත පැතිර ගියාක් මෙන් යමෙකුට ඉතා බොහෝවූ දුස්සීල බවක් වේද හෙතෙම තමාගේ ආත්මයට කරගන්නේ සතුරෙක් ඔහුට කරණු කැමති වන්නාවූ ක්‍රියාවකි මේ **අකුසල** සූත්‍රයයි.

24 කුසල් අකුසල් දෙකම දක්වන ලද සූත්‍රය **කුසලා කුසල** නම් වන්නේය.

යාදිසං වපතෙ බීජං – තාදිසං හරතෙ ඵලං
කල්‍යාණ කාරී කල්‍යාණං – පාපකාරීච පාපකං ති.

යම් බඳු බීජයක් වපුරයිද එබඳු ඵලයක් ඇරගනී එසේම යහපත කරන්නා යහපත්වූද පව් කරන්නා පවිටුවූද ඵලයක් ඇර ගනී මේ **කුසලා කුසල** සූත්‍රයයි

25 යම් සූත්‍රයක භාග්‍යවතුන් වහන්සේ විසින් කළ යුතුයයි අනු දන්නා ලද්ද දක්වන ලද්දේද එය **අනුඤ්ඤාත** නම් වන්නේය.

තීණි මානි භික්ඛවෙ කරණීයානි කතමානි තීනි කාය සුචරිතං වචී සුචරිතං මනො සුචරිතං ති.

මහණෙනි මේ කටයුතු තුනක් ඇත. ඒ කවරේද? කාය සුචරිතය වචී චරිතය මනො සුචරිතය යන තුනයි. මේ **අනුඤ්ඤාත** සූත්‍රයයි.

26 යම් සූත්‍රයක භාග්‍යවතුන් වහන්සේ විසින් නොකළ යුතුයයි වළක්වන ලද්ද දක්වන ලද්දේද එය **ප්‍රතික්ෂේප** නම් වන්නේය.

**තීණි මානි** භික්ඛවෙ අකරණීයානි කතමානි තීණි? කාය දුච්චරිතං වචී දුච්චරිතං මනො දුච්චරිතං ති.

**මහණෙනි** මේ නොකටයුතු තුනක් ඇත. ඒ කවරේද? කාය දුශ්චරිතය වචී දුශ්චරිතය මනො දුශ්චරිතය යන තුනයි. **මේ ප්‍රතික්ෂේප** සූත්‍රයයි.

27 අනුඥාත ප්‍රතික්ෂේප දෙක යම් සූත්‍රයක දක්වන ලද්දේද එය **අනුඥාත ප්‍රතික්ෂේප** නම් වන්නේය.

සබ්බ පාපස්ස අකරණං – කුසලස්ස උපසම්පදා
සචිත්ත පරියොදපනං – එතං බුද්ධාන සාසනං ති.

**මෙහි කුසල් රැස්** කිරීමද සිත පිරිසිදු කිරීමද **අනුඥාතයි** පව් කිරීම **ප්‍රතික්ෂේපයි**. **මේ අනුඥාත ප්‍රතික්ෂේප** සූත්‍රයයි.

28 යම් සූත්‍රයක ප්‍රශංසාවක් දක්වන ලද්දේද එය ස්තව නාම වන්නේය.

මග්ගානට්ඨංගිකො සෙට්ඨො – සච්චානං චතුරො පදා
විරාගො සෙට්ඨො ධම්මානං – ද්විපදානංච චක්ඛුමා ති.

මාර්ගයන් **අතුරෙන් ආර්‍යාෂ්ටාංගික** මාර්ගය ශ්‍රේෂ්ඨ වන්නේය, සත්‍යයන් **අතුරෙන් දුක්ඛ සමුදය නිරොධ මාර්ග** යන සතර ශ්‍රේෂ්ඨ වන්නේය ධර්මයන් අතුරෙන් විරාග සංඛ්‍යාත **නිර්වාණය** ශ්‍රේෂ්ඨ වන්නේය, දෙපා ඇත්තවුන් අතුරෙන් පසැස් ඇති බුදුරජාණන් වහන්සේ **ශ්‍රේෂ්ඨ වනසේක; මේ ස්තව** සූත්‍රයයි.

මේ විසිඅට පෙරකී සොළස සමග මිශ්‍රවීමෙන් සාරසිය අටසාළිසක් ප්‍රභෙදයෝ වන්නාහ.

තවත් නොයෙක් ආකාරයෙන් පාවචනය විභාගකොට දක්වීමට නුවණැත්තෝ සමර්ථවෙති. පෙටකොපදෙසයෙහි තවත් ක්‍රම කීපයක් දක්වා ඇත. එහෙත් ධර්මාව බොධයට මේ ප්‍රමාණ වන හෙයින් මෙසින් නවතිමු.

කොතෙක් ප්‍රභෙද දැක්විය හැකි වුවත් මේ සියළු සූත්‍රයෝම භූමි වශයෙන් **ඉන්ද්‍රිය භූමි කිලෙස භූමියයි** දෙකකට බෙදෙත්. ඒ දෙකොටසෙහි මූල්පද අටළොසෙහි විකාශයමය මේ සියළු සූත්‍රයෝ එසේම මේ සියළු ආකාර සූත්‍රයන්හි ගැබ්වී ඇත්තේ ඒ මූල්පද අටළොසමය. ඒ **පිළිබඳ** විස්තරය මීළඟ න්‍යාය විභාගයෙහි දක්වන්නෙමු.

දීඝ මජ්ඣිම ඛුද්දකාදි බෙදීම් සූත්‍රයන්ගේ ප්‍රමාණය මුල්කොට ගෙනයැ වර්ග වශයෙන් බෙදීම සංඛ්‍යාව මුල්කොට ගෙනයැ පිටක වශයෙන් බෙදීමට හේතුව යට දක්වන ලදී. සූත්‍රයන්ගේ අංගය මුල්කොටගෙන සලකන ලද ප්‍රභේදයෝයැ. මෙහි සඳහන්වූවෝ සමහරැ පාළි වශයෙන්ද බෙදති. යක්ඛපාළි, පෙතපාළි, දෙව පාළි ආදි වශයෙනි

එහෙත් එය ධර්මාව බොධයට ඉවහල් වන ක්‍රමයකැයි අපි නොසිතමු.

**පාවචන න්‍යායයෙහි පාවචන විභාග නම්වූ**
**ප්‍රථම භාගය නිමි.**

# න්‍යාය විභාගය

**අථො විභජ්ජ දසෙසයො ළුං පාවචනං වරං**
**විභජිස්සාමි තං න්‍යායං සමාසෙන යථාබලං.**

**පාවචනය**

නොයෙක් ක්‍රමවලින් බෙද දක්විය හැකි වූවත් මුළු පාවචනයෙහිම උගැන් වෙන්නේ කාරුණ්‍ය සතරක් පමණකි. මේ සතර අවබොධකාරජීම පිණිස මිය බුදුරජාණන් වහන්සේගේ සියළුම දෙශනාව. යටකි ප්‍රභෙද ඇති හැම සූත්‍රයකම එක ලෙසින්ම මේ සතර වචනයෙන් සඳහන්ව ඇත්තේ නොවෙයි. සමහරෙක මේ සතරද සමහරෙක ඉන් එකක් දෙකක් හෝ තුනක්ද සඳහන්ව ඇත්තේය සමහරෙක එකකුදු සඳහන්ව නැත්තේය, නමුත් අර්ථයෙන් සියළු සූත්‍රයෙන්ම මේ සතර ලැබෙන්නේය. මුහුදෙහි එක දිය බිඳෙක්හිද ලවණ රසය ඇත්තාසේ බුදුරජාණන් වහන්සේගේ එක ගාථාවක්හිද මේ ආය්‍ර්‍ය සත්‍ය සඞ්ඛ්‍යාත කාරුණ්‍ය සතරම ඇත්තේය. එය මතුකොට දක්වන පිළිවෙළය මෙහි න්‍යාය යයි කියනු ලබන්නේ ද්‍රව්‍ය ධර්ම ශාස්ත්‍රඥයකුහට යම් ද්‍රව්‍යයක්දී එහි කුමන කුමන දේ අඩංගුදැයි විචාළ කල හෙතෙම ඒ ද්‍රව්‍ය පළමු කොට බෙහෙත් බලයෙන් විසුරුවා ලිහා වෙන් වෙන් කොට බලා ශාස්ත්‍රානුකූලව අසවල් අසවල් දේ මෙහි අඩංගුයයි පවසයි. එසේම පාවචනයෙහි එක් එක් පාඨයක් හෝ ගාථාවක් හෝ ගෙන එහි ගැබ්වී ඇති චතුරාය්‍ර්‍ය සත්‍යයන් දැක්වීම පිණිස පළමුකොටම එය න්‍යාය ක්‍රමයෙන් බෙද ලිහා විස්තර කළයුතුය. ඒ විස්තරයෙන් චතුරාය්‍ර්‍ය සත්‍යයන් මතුකොට දැක්විය යුත්තේය මේ න්‍යාය මාර්ගයෙහි ව්‍යඤ්ජන වශයෙන් සූත්‍රය විස්තර කිරීම හාර යයි කියනු ලැබේ මතු නොවූ ව්‍යඤ්ජන පදයන් හරණය (ගෙනහැර දැක්වීම) කාරණ හෙයින් හාර නම් වේ පාවචනයේහි සූත්‍රයක් හාරා පාරා බලන ක්‍රමය හාරයයි දතයුතුය.

**හාර සොළසකි.**

දෙසනා විචයො යුත්ති පදට්ඨානො ච ලක්ඛණො
චතුබ්‍යූහො ච ආවත්තො විභත්ති පරිවත්තනො
වෙවචනො ච පඤ්ඤත්ති ඔතරණො ච සොධනො
අධිට්ඨානො පරික්ඛාරො සමාරොපනො සොළස.

නෙත්තිප්ප කරණයෙහි:

**හාර විභඞ්ගය හාර සම්පාතනයයි** දෙවාරයක් දක්නා ලැබේ.

**එක් එක්** හාරයකට අවන වෙනම නිදසුන් දැක්වීම හාර විභඞ්ගයයි **එක් සූත්‍රයක් හාර** සොළසින්ම පිළිවෙළින් විස්තර කිරීම "හාර සම්පාතයයි.

හාර විභඞ්ගය හාරයන්ගේ මනා අවබෝධය පිණිසවේ. හාර සම්පාතය පාළිවන න්‍යායයෙහි සූත්‍රයක් ව්‍යඤ්ජන චාරයෙන් විස්තර කිරීම පිණිස වේ.

මෙහි අප විසින් ග්‍රන්ථ සංක්ෂේපය සඳහා හාර සම්පාතය ස්වල්පයක් දක්වනු ලැබේ. හාරයන් පිළිබඳ වැඩිපුර අවබෝධය ඒ තැනින්ම ඇති කරගත යුත්තේය.

නෙත්ති ප්‍රකරණයෙහි

අරක්ඛිතෙන චිත්තෙන මිච්ඡාදිට්ඨි හතෙන ච
ථිනමිද්ධාභිභූතෙන වසං මාරස්ස ගච්ඡති
තස්මා රක්ඛිත චිත්තස්ස සම්මා සඞ්කප්ප ගොචරො
සම්මාදිට්ඨි පුරෙක්ඛාරො ඤත්වාන උදයබ්බයං
ථිනමිද්ධාභිභූ භික්ඛු සබ්බා දුග්ගතියො ජහෙ ති

යන ගාථාවට හාර සම්පාතය දක්වා තිබේ.

නෙත්තිප්පකරණ අටුවාවේහි
දදතො පුඤ්ඤං පවඩ්ඪති – සංයමතො වෙරං න චීයති

කුසලො ච ජහාති පාපකං – රාගදොස මොහක්ඛයා ස නිබ්බුතොති
යන ගාථාවටත්.

මනො පුබ්බඞ්ගමා ධම්මා මනොසෙට්ඨා මනොමයා
මනසා චෙ පසන්නෙන භාසති වා කරොති වා
තතො නං සුඛ මන්වෙති ඡායාව අනපායිනී ති

යන ගාථාවටද හාර සම්පාතය දක්වා තිබේ.

නෙත්ති රත්නාකරයෙහි හාර සම්පාතයෙහි පෙනෙනුයේ මනො පුබ්බඞ්ගමා යනාදි ගාථාවමැයි.

නෙත්ති ප්‍රදීපයෙහි පූජා ච පූජනීයානං එතං මඞ්ගල මුත්තමං යන්නට හාරසම්පාතය දක්වා තිබේ.

බුද්ධ වචනයන් අතුරෙහි කවරක් වුවත් සොළසාහාර වර්ණනාවට අයොග්‍ය නොවන හෙයින් අප විසින්

සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො චිත්තං පඤ්ඤඤ්ච භාවයං
ආතාපී නිපකො භික්ඛු සො ඉමං විජටයෙ ජටං

යෙසං රාගො ච දොසො ච අවිජ්ජා ච විරාජිතා
ඛීණාසවා අරහන්තො තෙසං විජටිතා ජටා

යත්ථ නාමඤ්ච රූපඤ්ච අසෙසං උපරුජ්ඣති
පටිඝං රූපසඤ්ඤා ච එත්ථෙසා ඡිජ්ජතෙ ජටා ති.

ප්‍රඥා සහිතවූ සීලයෙහි පිහිටා සිතත් නුවණත් වඩන්නාවූ කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තාවූ පැසුණු නුවණැති භික්ෂු නම්වූ ඒ නර තෙමේ මේ ජටාව විජටනය කරන්නේය.

යම් කෙනෙකු විසින් රාගයද ද්වෙෂයද අවිද්‍යාවද දුරු කරණ ලද්දහුද ආශ්‍රවයන් ක්‍ෂය කළ ඒ රහතුන් වහන්සේ විසින් ජටාව විජටනය කරණ ලදී.

යම් තැනක නාමයත් රූපයත් ඉතිරි නැතිව නිරුඬවේද ප්‍රතිඝ සංඥාව හා රූප සංඥාත් නිරුඬ වෙත්ද එහි මේ ජටා තොමෝ සිඳෙනු ලැබේ.

යත මේ සංයුත්ත නිකායෙහි දෙවතා සංයුත්තකයෙහි තුන්වන සත්ති වර්ගයෙහි තුන්වන ජටා සූත්‍රය සොළස හාරයෙන් වර්ණනා කරණු ලැබේ.

එහි දෙශනා හාරය නම් කවරේද?

අස්සාදාදී නවතා නිස්සරණං ච ඵලං උපායොච
ආණත්ති ච භගවතො යොගීනං දෙසනාහාරො

යම් සූත්‍රයක අස්සාද ආදීනව නිස්සරණ ඵල උපාය හා යොගීන් හට බුදුරජුන්ගේ ආඥාවත් බෙදා දක්වනු ලැබෙත් ද එය දෙසනා හාර නම්වේ.

රසවිඳ ගැනීම ආස්වාදයයි එනම්: කායික සැපය සොම්නස හා ඉෂ්ටාරම්මණයන්ය රස විඳ ගැනීමට කරණවූ තෘෂ්ණා විපර්‍යාස ධර්මයෝද ආස්වාද නම් වෙති.

අතිශයින් දීනව දුක්ඛිතවපැවැත්ම ආදීනවයයිඑනම් දුක්වෙදනාව දුක්ඛ දුක, විපරිණාම දුක හා සියළු ත්‍රෛභූමික සංස්කාරයෝ ආදීනව, නම් වෙති.

ආර්‍ය්‍ය මාර්ගය හා නිර්වාණය නිස්සරණ නම් දෙසනාවෙන් නිපැයෙන්නේ ඵලයයි.

ශ්‍රුතමය ඥාණය ෂඩ්විශුද්ධිය හා සියළු ලෞකික ලොකොත්තර සම්පත් විශෙෂයෝ ඵල නම් වෙති.

උපාය නම් ආර්‍ය්‍ය මාර්ගයට කරුණුවූ පූර්වභාග ප්‍රතිපදාවයි මෙසේ පිළිපදිනුයයි බුදුරජුන්ගේ විධානය ආණත්තියයි දුන් යථොක්ත ගාථාව දෙසනා හාරයෙන් බෙදා දක්වමු.

එක් දිව්‍ය පුත්‍රයකු විසින් බුදුරජුන්ගෙන් ඇසූ ප්‍රශ්නයකට පිළිතුර වශයෙන් මේ ගාථාව වදරණ ලද්දීය ඒ ප්‍රශ්නය සඳහන් ගාථාව මෙසේය.

අන්තො ජටා බහි ජටා ජටාය ජටිතා පජා
තං තං ගොතම පුච්ඡාමි කො ඉමං විජටයෙ ජටං ති

ඇතුළත ජටාය බැහැරත් ජටාය ප්‍රජාව ජටාවෙන් දැවටුණිය ගෞතමයන් වහන්ස, කවරෙක් මේ ජටාව විජටනය කරන්නේද යන කාරණය ඔබගෙන් විචාරමි යනුයි.

මෙහි අන්තො ජටං බහිජටා ජටාය ජටිතා පජා යනුවෙන් දක්වන ලද දැවටීම ආස්වාදයයි රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ ධර්ම යන ෂඩාරම්මණයන්හි චක්ෂුරාදී ෂඩින්ද්‍රියයන්ගේ මාර්ගයෙන් ඇලීම ජටා යයි කියන ලද හෙයින් එයින් ඇති වන රාග සහගත චේතනාවෝ ආස්වාදයයි දත යුත්තේය.

තෘෂ්ණා ජටාවෙන් දැවටුණාවූ සත්ත්වයාහට තෘෂ්ණා විෂයවූ වස්තූන්ගේ යම් හානියක් භේදයක් විනාශයක් ඇතිවූ කල ඒකාන්තයෙන් ශොකයක් පරිදේවයක් පහළ වන්නේය. අහෝ මගේ වස්තුව නැතිවිය හානිවිය කියායැ මේ දුක් දොම්නස් සහගත චේතනාවෝ ආදීනවයයි.

ජටාවිජටන සඞ්ඛ්‍යාත තෘෂ්ණා ඡේදනය නිස්සරණයයි තෘෂ්ණා සඞ්ඛ්‍යාත ජටාවෙන් ගෙතීම නිසා ඇතිවන රාග ද්වේෂ අවිද්‍යාවන්ගේ දුරුකිරීමද නාමරූපයන්ගේ පැවැත්ම ඉතිරි නොකොට වළකා ලීමද ඵලයයි.

සීලයෙහි පිහිටීම සිත හා නුවණ වැඩීම කෙලෙස් තවන වීර්‍යය නිපක ප්‍රඥව යන මොහු ජටාවිජටනයෙහි උපායයෝයි. සීලයෙහි පිහිටා සිත හා නුවණ වඩමින් කෙලෙස් තවන වීර්‍ය ඇතිව නිපක ප්‍රඥ ඇතිව තෘෂ්ණා ජටාව විජටනය කරවූ! යනු මේ දෙශනාවෙන් බුදුරජාණන් වහන්සේ විසින් දෙන්නාවූ ආඥවයි. දෙශනා හාරයෙහි ඇතුළත් මේ අඞ්ග සයෙහි ආස්වාදය වනාහි සමුදයයි ආදීනවය හා ඵලය දුඃඛයි නිස්සරණය නිරොධයයි උපාය හා ආණත්තිය මාර්ගයයි.

චතුරාර්‍ය සත්‍යය සියළුම දෙශනාවේ අඩංගුව පවත්නා බැවින් දෙශනාහාර සම්පාතයෙන් චතුරාර්‍ය සත්‍යය කෙසේ ඇද්දූයි මතු·සාරනු ලැබේ. ඇතුළත පිටත ජටාවෙන් ගෙතී සිටීම නිසා සත්වයා සසර සුගති දුර්ගති භවයන්හි චුති උත්පත්ති වශයෙන් බැඳී සිටියි. මේ බැඳී සිටීම දුඃඛයි එසේම එය තෘෂ්ණා ජටාවේ ආදීනවය හා ඵලයයි තෘෂ්ණාවට ගොදුරුවූ ධර්මයන්ගේ ලැබීමෙන් යම් සතුටක් වේනම් එහි යම් තෘෂ්ණාවෙන් බැස ගැනීමක් ගැලීමක් වේ නම් එය දුඃඛ සමුදයයි එසේම එය ආස්වාදයද වන්නේය. තෘෂ්ණා ජටාව සහමුලින් විජටනය කොට හැරපීමක් වේ නම් එය නිරොධයයි එයම නිස්සරණ නම්ද වේ. තෘෂ්ණා ජටා විජටනයට උපායවූ සිත හා නුවණ වැඩීම වූකලී සමථ විදර්ශනා සහිත මාර්ගයයි ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයයි එයම උපාය

වත්තේය. එය පිළිපදුවයි බුදුරජාණන් වහන්සේ විසින් කරණ ලද දෙශනාවම **ආණත්තිය යි**

මේ සීලෙ පතිට්ඨාය යනාදී ගාථාවට දක්වූ
**දෙසනාහාර සම්පාතයයි**.

---

ඉක්බිති විචය සම්පාතය දක්වනු ලැබේ.

**විචය හාර නම් කවරේද?**

යං පුච්ඡිතං විස්සජ්ජිතංච සුත්තස්ස යාච අනුගීති
සුත්තස්සයො පවිචයො හාරො විචයොති නිද්දිට්ඨො

සූත්‍රය පිළිබඳ ප්‍රශ්නයද, විසජ්ජනයද, අනුගීතිය හෙවත් පූර්වාපර සම්බන්ධයද සොයා බැලීම හා මුළු සූත්‍රයම ආස්වාදදී සවැදෑරුම් අඞ්ග යන්ගේ වශයෙන් සොයා බැලීම් **විචයහාර** නම්.

මේ විචය හාර ලක්ෂණ දක්වූ ගාථාවෙහි සඳහන් ච ශබ්ද **බලයෙන් පද විචයද** ගනු ලැබේ. සූත්‍රයෙහි සියළු පදයන් පිළිවෙළින් ශබ්ද වශයෙන් අර්ථවශයෙන් හා ව්‍යඤ්ජන වශයෙන් සොයා බැලීම පදවිචය නම් වේ.

**අන්තොජටා බහිජටා** යනාදි ගාථාවෙන් දිව්‍ය පුත්‍රයා සත්වයන්ගේ තෘෂ්ණා ජටා විජටනය විචාරයි.

මේ ගාථාවෙහි එකම ප්‍රශ්නයකි. **අදිට්ඨජොතනා, දිට්ඨසංසන්දනා, විමතිච්ඡේදනා, අනුමති පුච්ඡා, කථෙතුකම්‍යතා පුච්ඡා** යන ප්‍රශ්නයන් අතුරෙන් මේ අදිට්ඨ ජෝතනා ප්‍රශ්නයයි. හෙවත් නොදත් දේ දැන ගැනීම පිණිස කරනු ලබන ප්‍රශ්නයයි.

කවරෙක් මේ ජටාව විජටනය කෙරේදැයි ප්‍රශ්න කළ බැවින් මෙය **සත්තාධිට්ඨාන** ප්‍රශ්නයයි.

ජටාජටිත බව අතීත වර්තමාන අනාගත යන තුන්කාලයටම සාධාරණ බැවින් **කාලත්‍රය විෂය** ප්‍රශ්නයයි

**සීලෙ පතිට්ඨාය** යනාදී ගාථාවෙන් **භාග්‍යවතුන්** වහන්සේ ඒ ප්‍රශ්නය විසඳූසේක. **ඒකංසබ්‍යාකරණ** විස්සජ්ජනයයි එසේම **නිරවසෙස** විස්සජ්ජනයයි ලෞකික ලොකොත්තර දෙකින් මිශ්‍රයි.

ජටා යනු දැලක් මෙන් ගෙතුණු **තෘෂ්ණාවට** නමෙකි රූපාදී අරමුණුවල උඩු යටි වශයෙන් නැවත නැවත උපදනා හෙයින් බැඳෙන හෙයින් උණ පඳුරෙහි උණ අතු ගෙතී යාම මෙන් ඇතිවන ජටාව වැනිනුයි තෘෂ්ණාව ජටායයි කියනු ලැබේ.

ඒ මේ තෘෂ්ණාව ස්වපරිෂ්කාර පරපරිෂ්කාරයන්හිද ස්වාත්මභාව පරාත්මභාවයන්හිද අධ්‍යාත්මිකායතන බාහිරායතනයන්හිද උපදනා හෙයින් **අන්තොජටා බහිජටා** නම් වේ හෙවත් ඇතුළත පිටත ගෙතුණේ නම් වෙයි.

• උණ ජටාවෙන් උණගස් මෙන් තෘෂ්ණා ජටාවෙන් මේ සියළු සත්ත්ව වර්ගයා ජටිතවෙයි. බැඳී සිටියේ වෙයි. එය කවරෙක් විජටනයට අවුල් හැරීමට සමර්ථවිද්දැයි දිව්‍ය පුත්‍ර තෙමේ විචාරයි.

භාග්‍යවතුන් වහන්සේගේ විස්සජ්ජනයෙහි **සීලෙ පතිට්ඨාය** යනු කාය වාක් සමාධාන සංඛ්‍යාත සීලයෙහි පිහිටා ගෙනය. **නරො** යනු යම් කිසි සත්වයකි. **සපඤ්ඤො** යනු උප්පත්තියෙන් ලත් නුවණ ඇතිවූ වෙකි. **චිත්තං පඤ්ඤං ච භාවයං** යනු චිත්ත භාවනාවයයි කියන ලද සමාධියද ප්‍රඥා භාවනාවයයි කියන ලද විදර්ශනාවද වඩමින් යනුයි.

මෙහි සිත මුල්කොට දැක්වීමෙන් **සමාධියද** ප්‍රඥාව දැක්වීමෙන් **විදර්ශනාවද** දක්වන ලද්දේය. **නිපකො** යනුවෙන් මූසාල නුවණ ඇතියා දක්වන ලද්දේය.

සියළු කටයුතු සිඩකොට දෙන්නාවූ පාරිහාරිය ප්‍රඥාව **නිපක** නම් වේ.

**භික්ඛු** නම් ගෘහස්ථවූ හෝ ප්‍රව්‍රජිතවූ හෝ සසර භය වශයෙන් දක්නා පුද්ගල තෙමේයි. මෙයින් ශෛක්ෂ්‍ය භූමිය දක්වන ලදී. ඉක්බිති ජටා විජටනය කොට සිටි අශෛක්ෂ්‍යවූ රහතන් වහන්සේ දැක්වීම පිණිස **යෙසං රාගො ච දොසො ච** යනාදිය වදාළසේක. ඉක්බිති ජටාවිජටන අවකාශය දක්වනු පිණිස යත්ථ නාමඤ්ච රූපංච යනාදිය වදාළසේක. **නාමං** යනු සතර අරූපස්කන්ධයි **රූපං** යනු රූපස්කන්ධයි පටිඝං රූපසඤ්ඤාච යන තැන **පටිඝං** යනුවෙන් කාම භවය ගන්නාලදී **රූපසඤ්ඤා** යනුවෙන් රූප භවය ගන්නා ලදී. ඒ දෙක ගත් කල්හි අරූප භවය භව සංක්ෂෙපයෙන් ගන්නාලද්දේ වෙයි. **එත්ථෙසා ඡිජ්ජතෙ ජටා** යනු නිර්වාණයට පැමිණ ජටා නිරුඩවේය යන අර්ථයි.

කවරෙක් ජටා විජටනය කෙරේද යන ප්‍රශනය විචාලේ වෙයි. ජටාවක් නම් තියුණුවූ ආයුධයක් සූරවූ අතින් ගෙන සපිර පොළොවෙහි පිහිටා සිටගෙන කපා සිඳ හැරීමෙන් අවුල් හැරිය යුත්තේය.

මේ ප්‍රශනයට අනුකූලවම භාග්‍යවතුන් වහන්සේ එය විස්සජ්ජනය කරණසේක. සීල නැමති පොළොවෙහි පිහිටා සමාධි නමැති ගලෙහි මුවහත් තබන ලද විදර්ශනා ප්‍රඥා නැමති අයුධය ආතාපන වීර්‍ය්‍ය නැමති වීර්‍ය්‍ය බලයෙන් පාරිහාරිය ප්‍රඥා නැමති අතින් ගෙන ඔසවා සව සන්තාන ගත සකල තෘෂ්ණා ජටාව කපා හැර අවුල් හරින්නේ යයි විස්සජ්ජනය කොට වදාළසේක.

**අධ්‍යාත්මික බාහිර ආයතනයන්හි තෘෂ්ණාවෙන් ගෙතුණාවූ සත්වයා යමක් යමක් පතයිද ඉදින් එය ලැබුනේ නම් හෙතෙම ප්‍රීතියට පැමිණෙයි තව තවත් පතයි මෙය ආස්වාදයයි එය අන්තෝජටා යනුවෙන් මේ ගාථාවෙහි පෙනේ.** පැතූ පැතූදේ ලැබීම ඒකාන්ත නොවන්නේය පතා නොලත් කල දුක් දොම්නස් ඇතිවන්නේය ලත් ලත් දෙය එසේම පවතින්නේද නොවෙයි ලෝකය අනිත්‍ය ධර්මයෙන් පීඩිත හෙයිනි. ලත් දෙය නැතිවීමෙන්ද දුක් දොම්නස් ඇතිවන්නේය මෙසේ තෘෂ්ණාව ඇති සියළු තැන ආදී නවයද ඇතිවන්නේය එසේම ස්වර්ගයෙහි බොහෝ සැප ඇත්තේය පින් කළෝ එහි උපදිති යනු අසා එහි උපදනා තෘෂ්ණාවෙන් යමෙක් දන් ආදිය දේද එහි විපාකයෙන් හෙතෙම ස්වර්ගයෙහි උපදනේය.

පුණ්‍ය ඵලයෙන් එහි ලත් ආත්ම භාවයද උදය ව්‍යය පීඩිත හෙයින් දුඃඛම වන්නේය.

තෘෂ්ණා ජටාව සහමුලින් විජටිත වී නම් එකල තෘෂ්ණා මූලිකාසියළු දුක් නැති වන්නේය අවුලින් මිදෙන්නේය **මෙය නිස්සරණයයි.**

සීලයද **චිත්ත භාවනායි** මෙහි කියන ලද **සමාධියද පඤ්ඤායන** පදයෙන් ගත් ජාති ප්‍රඥාවද **පඤ්ඤංච භාවයං** යන්නෙන් ගත් විදර්ශනා වද **නිපකො** යන පදයෙන් ගත් පාරි හාරිය ප්‍රඥාවද ආතාපන වීර්‍ය්‍යයද යන මේ අඞ්ග සය තෘෂ්ණා විජටන සඞ්ඛ්‍යාත නිස්සරණයට උපාය වන්නේය.

එම උපායම මාර්ගය නම් වන්නේය. ආණත්තිය මෙහි වචන ස්වරූප යෙන් නොලැබෙතත් මේ දේශනාවෙන්ම භාග්‍යවතුන් වහන්සේ විසින් ආඥාවක් කළාක් මෙන් සැලකිය යුත්තේය.

**විචයහාර සම්පාතයයි.**

---

ඉක්බිති යුක්ති හාර සම්පාතය දක්වනු ලැබේ.

**යුක්තිහාර නම් කවරේද?**

සබ්බෙසං හාරානං යාභූමියො ච ගොචරො තෙසං
යුත්තා යුත්ති පරික්ඛා හාරො යුත්තීති නිද්දිට්ඨො

දෙසනාදි සොළොස් හාරයන්හට භූමිවූ යම් ව්‍යඤ්ජනයක් වේද ඔවුන්ට ගොචරවූ යම් අර්ථයක් වේද මේ භූමි ගොචරයන්ගේ යුක්ති අයුක්ති පරීක්ෂාව **යුක්තිහාර යයි** දක්වන ලද්දේය.

සතර මහා ප්‍රදේශයන් හා ගැලපෙන් [illegible]. සතර මහා පදෙස නම්: **බුද්ධාපදෙස - සඞ්ඝාපදෙස - සම්බහුල ථෙරාපදෙස - එකථෙරාපදෙස** යන මොහුයි.

මහාපදෙස නම් මහත්වූ බුද්ධාදීන් දක්වා කියන ලද කරුණුයි. නැතහොත් ධර්මයාගේ සිටීමට මහත්වූ අවකාශ ස්ථානයි.

ධර්මයට සම්ප්‍රදාය දෙකකි. භාග්‍යවතුන් වහන්සේය ශ්‍රාවකයෝයයි ශ්‍රාවකයෝ සඞ්ඝ ගණ පුද්ගල වශයෙන් ත්‍රිවිධ වෙති. මෙසේ මහාපදෙශ සතරකි. බුදුන්ගේ හමුවෙන් මා විසින් මේ ධර්මය පිළිගන්නා ලද්දේයයි කියන ලද්දේ නම්: එය **බුද්ධාපදෙසයයි**.

අසවල් සඞ්ඝයා හමුවෙන් පිළිගන්නා ලද්දේයයි කියන ලද්දේ නම් මේ **සඞ්ඝාපදෙසයයි**.

අසවල් ගණයා කෙරෙන් පිළිගන්නා ලද්දේයයි කියන ලද්දේ නම් එය **සම්බහුල ථෙරාපදෙසයයි**.

අසවල් තෙරුන් වහන්සේගෙන් පිළිගන්නා ලද්දේයයි කියන ලද්දේ නම් එය **එකථෙරාපදෙසයයි**.

ව්‍යඤ්ජනයන්ගේ වනාහි ස්වභාව නිරුක්තියට එකඟ වන බව හා අභිප්‍රේතාර්ථ වාචක බව යුක්තියයි.

අර්ථයාගේ වනාහි සූත්‍ර විනය ධර්මතාවන් හා අවිරුද්ධ වන බව යුක්තියයි සූත්‍රය නම් චතුරාර්‍ය්‍ය සත්‍යයයි චතුරාර්‍ය්‍ය සත්‍යය විනිර්මුක්ත බුද්ධ වචනයක් නැත්තේය චතුරාර්‍ය්‍ය සත්‍යයන් පවසා නම් එය සූත්‍රයට ඇතුලත් වන්නේය.

**විනය** නම් රාග දේෂ මොහයන් දුරුකිරීමයි රාග විනය හෝ දේෂ විනය හෝ මොහ විනය පවසා නම් එය විනයට ඇතුළත් වන්නේය. **ධර්මතා** නම් පටිච්ච සමුප්පාද ධර්මයයි පටිච්ච සමුප්පාද ධර්මයට අවිරුද්ධ වේනම් එය ධර්මතාවෙහි ඇතුළත් වන්නේය මෙසේ යෙදෙන්නාවූ සූත්‍රයම ගත යුත්තේය නොයෙදෙන්නේ නම් හළ යුත්තේය.

**සිලෙසනිඛාය** යනාදී ගථාව සඟිතිත්‍රයාරූඪවූ සංයුක්ත නිකායෙහි දෙවතා සංයුත්තකයෙහි තුන් වන සත්ති වර්ගයෙහි තුන්වන සූත්‍රයයි. එබැවින් ධර්ම භාණ්ඩාගාරික ආනන්ද ස්ථවිරයන් වහන්සේ විසින් ප්‍රතිඥ කළ පරිදි මෙය **බුද්ධාපදෙසය** වන්නේය. මෙහි අඩංගු සියළු පදයෝ ස්වභාව නිරුක්තියට එකඟ වූවාහුය. එබැවින් ව්‍යඤ්ජන වශයෙන් මෙය යෙදෙන්නේය.

ජටා ශබ්දයෙන් තෘෂ්ණාව දක්වන ලද හෙයින් සමුදය සත්‍යය මෙහි පෙනේ.

සො ඉමං විජටයෙ ජටං යනුවෙන්ද

තෙසං විජටිතා ජටා යනුවෙන්ද

එත්ථෙසා ඡිජ්ජතෙ ජටා යනුවෙන්ද

තෘෂ්ණා ඡෙද සඞ්ඛ්‍යාත නිරොධ සත්‍යය පෙනේ සීලෙපතිට්ඨාය නරොසපඤ්ඤො චිත්තං පඤ්ඤංච භාවයං ආතාපි නිපකො යනුවෙන්ද

යෙසං රාගොච දොසොච අවිජ්ජාච විරාජිතා යනුවෙන්ද

නාමංච රූපංච අසෙසං උපරුජ්ඣති පටිඝං රූප සඤ්ඤාච යනුවෙන්ද

මාර්ග සත්‍යය පෙනේ. ජටාය ජටිතා පජා යනුවෙන් දුක්ඛ සත්‍යයද පෙනේ. මෙසේ චතුරාර්‍ය්‍ය සත්‍යය දක්වෙන බැවින් මෙය සූත්‍රයෙහි ඇතුළත් වන්නේය.

යෙසං රාගොච දොසොච අවිජ්ජාච විරාජිතා යනුවෙන් රාග දොස මොහයන්ගේ විනය දක්වෙන බැවින් මෙය විනයෙහි ඇතුළත් වන්නේය. ජටා යනුවෙන් තෘෂ්ණාව කියන ලදී.

තෘෂ්ණාව ඇති කල උපාදානය වන්නේය උපාදානය ඇතිකල භවය ඇති වන්නේය භවය ඇති කල ජාතිය ඇති වන්නේය ජාතිය ඇතිකල ජරා මරණ සොක පරිදෙව දුක්ඛ දොමනස්සාදී අනෙක දුක්ඛස්කන්ධය ඇති වන්නේය.

යත්ථ නාමඤ්ච රූපඤ්ච අසෙසං උපරුජ්ඣති යනුවෙන් නාම රූප නිරොධය දක්වන ලදී. නාම රූප නිරොධයෙන් සළායතන නිරොධය වන්නේය. සළායතන නිරොධයෙන් ඵස්ස නිරොධය වන්නේය ඵස්ස නිරොධයෙන් වේදනා නිරොධය වන්නේය වෙදනා නිරොධයෙන් තෘෂ්ණා නිරොධය වන්නේය තෘෂ්ණා නිරොධයෙන් උපාදාන නිරොධය වන්නේය උපාදාන නිරොධයෙන් භව නිරොධය වන්නේය භව නිරොධයෙන් ජාති නිරොධය වන්නේය ජාති නිරොධයෙන් ජරා මරණ සොක පරිදෙව දුක්ඛ දොමනස්සාදී අනෙක විධ දුක්ඛස්කන්ධයාගේ නිරොධය වන්නේය.

මෙසේ මේ දෙසනාව පටිච්ච සමුප්පාද ධර්මයෙහි ඇතුළත් වන්නේය එබැවින් අර්ථ වශයෙන්ද මේ දෙශනාව යෙදෙන්නේය සූත්‍රාභිධර්ම සම්පාතයයි.

ඉක්බිති පදට්ඨාන හාර සම්පාතය දක්වනු ලැබේ.

**පදට්ඨාන හාර නම් කවරේද?**

ධම්මං දෙසෙති ජිනො තස්සච ධම්මස්සයං පදට්ඨානං
ඉතියාව සබ්බ ධම්මා එසො හාරො පදට්ඨානො

පදට්ඨාන නම් ආසන්න කාරණයි.

යම්කිසි උප නිශ්‍රයක් වේද යම් කිසි ප්‍රත්‍යයක් වේද එය පදට්ඨාන යයි ජිනෙන්ද්‍රයන් වහන්සේ විසින් දෙසන ලද ධර්මපදයන්ට ආසන්න කාරණද ඒ ධර්මයන් ආසන්න වශයෙන් පවත්නා කාරණද දක්වීම පදට්ඨාන හාරයයි.

හිරිඔතප් දෙක සීලයට පදට්ඨානයි
සීලය සමාධියට පදට්ඨානයි
සමාධිය ඤාණ දර්ශනයට පදට්ඨානයි
ඤාණ දර්ශනය විමුක්තියට පදට්ඨානයි

| | | |
|---|---|---|
| ඤාණ සම්ප්‍රයුක්ත | කුසල කර්ම විපාකය ජාති ප්‍රඥාවට | පදට්ඨානයි |
| | ප්‍රඥාව තත්වාව බොධයට | පදට්ඨානයි |
| | චිත්ත භාවනාවට ධ්‍යානය | පදට්ඨානයි |
| | ප්‍රඥා භාවනාවට සත්‍යය | පදට්ඨානයි |
| | ප්‍රඥා භාවනාව විද්‍යාවට | පදට්ඨානයි |
| ආතාපන | වීර්‍ය්‍යයට සම්‍යක් ප්‍රධානය | පදට්ඨානයි |
| | නිපක ප්‍රඥාවට වීමංසාව | පදට්ඨානයි |
| | ජටාවට ලොභය | පදට්ඨානයි |
| | ජටාව සංසාර බන්ධනයට | පදට්ඨානයි |
| | රාගයට සුභාරම්මණය | පදට්ඨානයි |
| | රාගය අනිවේදයට | පදට්ඨානයි |
| | අසුභය රාග විරාගයට | පදට්ඨානයි |
| රාග විරාගය | මෙත්තා චෙතො විමුක්තියට | පදට්ඨානයි |
| | ද්වෙසයට පටිඝාරම්මණය | පදට්ඨානයි |
| | ද්වෙසය ප්‍රාණඝාතයට | පදට්ඨානයි |
| මෛත්‍රිය | ද්වෙස විරාගයට | පදට්ඨානයි |
| ද්වෙස විරාගය | ප්‍රීතියට | පදට්ඨානයි |
| විපර්‍යාස | ධර්මයෝ අවිද්‍යාවට | පදට්ඨානයි |
| අවිද්‍යාව | සංස්කාරයන්ට | පදට්ඨානයි |
| සත්‍යාව | බොධය අවිද්‍යා විරාගයට | පදට්ඨානයි |
| අවිද්‍යා විරාගය | ප්‍රඥා විමුක්තියට | පදට්ඨානයි |
| විඤ්ඤාණය | නාමරූපයන්ට | පදට්ඨානයි |

| | | |
|---|---|---|
| නාමරූපයෝ | සළායතනයන්ට | පදට්ඨානයි |
| විඤ්ඤාණ නිරොධය නාමරූප නිරොධයට | | පදට්ඨානයි |
| නාමරූප නිරොධය සළායතන නිරොධයට | | පදට්ඨානයි |
| සප්‍රතිඝාරම්මණය ප්‍රතිඝ සංඥාවන්ට | | පදට්ඨානයි |
| ප්‍රතිඝ සංඥාව | කාම භවයට | පදට්ඨානයි |
| ප්‍රතිඝ සංඥා නිරොධය කාමභව නිෂ්ක්‍රමණයට | | පදට්ඨානයි |
| රූපාරම්මණය | රූපසංඥාවන්ට | පදට්ඨානයි |
| රූපසංඥාව | රූපභවයට | පදට්ඨානයි |
| රූපසංඥා | නිරොධය රූප භවනිෂ්ක්‍රමණයට | පදට්ඨානයි |

මෙසේ ජටා සූත්‍රයෙහි සඳහන්වූ ධර්මයන් පිළිබඳ පදට්ඨාන දත යුත්තේය.

නිර්ධාරිත පදට්ඨාන ධර්මයන්ගේ තව දුරටත් පදට්ඨාන දැක්වීමෙන් පදට්ඨාන පරම්පරා වශයෙන්ද දැක්විය හැක්කේය.

**පදට්ඨාන හාර සම්පාතයයි.**

---

ඉක්බිති ලක්ඛණ හාර සම්පාතය දක්වනු ලැබේ.

**ලක්ඛණ හාරය නම් කවරේද?**

වුත්තම්හි එක ධම්මෙ යෙ ධම්මා එක ලක්ඛණා කෙචි
වුත්තා භවන්ති සබ්බෙ සො හාරො ලක්ඛණො නාම.

එක් ධර්මයක් කීකල්හි ඒ ධර්මයට සමාන ලක්ෂණ ඇති සියළු ධර්මයන් කීවවුන් කොට සලකාගැනීම ලක්ෂණ හාරයයි.

සීලය ආත්ම සම්‍යක් ප්‍රණිධානය ලක්ෂණකොට ඇත්තේය. ආත්ම සම්‍යක් ප්‍රණිධානය ලක්ෂණකොට ඇති සියළු පුණ්‍යක්‍රියාවෝ සීලෙ පතිට්ඨාය යන්නෙන් කියන ලද්දාහු වෙත්. චිත්තං පඤ්ඤංච භාවයං යන්නෙන් සමාධි ප්‍රඥා ඉන්ද්‍රියයෝ කියන ලදහ ආතාපි යන්නෙන් විරියින්ද්‍රිය කියන ලදී නිපකො යන්නෙන් ප්‍රඥෙන්ද්‍රිය කියන ලදී ඉන්ද්‍රිය ලක්ෂණයෙන් සමාන හෙයින් මෙයින් ශ්‍රද්ධා සමෘති ඉන්ද්‍රියයෝද කියන ලදහ. පඤ්චෙන්ද්‍රියයන් කීකල්හි සම්‍යක් ප්‍රධාන බල ඍද්ධිපාද බොජ්ඣඞ්ග ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ග යන සත්තිස් බොධිපාක්ෂික ධර්මයෝ කියන ලදහ. නිර්‍ය්‍යානික ලක්ෂණයෙන් සියළු බොධිපක්ෂික ධර්මයෝ එක ලක්ෂණ වන හෙයිනි.

රාග දෙස අවිජ්ජා යනුවෙන් අකුසල මූල් කියන ලදහ. චිත්තොපක්ලේශ ලක්ෂණයෙන් ලොභ මෝහ ක්‍රොධ උපනාහ, මක්ඛ පලාස ඉස්සා මච්ඡරිය මායා සාඨෙය්‍ය-ථම්භ සාරම්භ මාන අතිමාන මද ප්‍රමාද යන සියළු උපක්ලේශ ධර්මයෝ කියන ල

නාමරූප යන්නෙන් අවිද්‍යා සංස්කාර විඥාන ෂඩායතන ස්පර්ශ වේදනා තෘෂ්ණා උපාදාන භව ජාති ජරා මරණ යන සියළු පටිච්ච සමුප්පාද ධර්මයෝ කියන ලදහ. පටිච්ච සමුප්පාද ලක්ෂණයෙන් ඒක ලක්ෂණ වන හෙයිනි.

පටිඝ සඤ්ඤා රූප සඤ්ඤා යන දෙක කීහල්හි අරූප සංඥාවද කියන ලද්දේ වෙයි. සංඥා ලක්ෂණයෙන් සමානවන හෙයිනි. ජටා විජටනයෙන් ලක්ෂණ නිරොධය කියන ලදී. දුක්ඛ සමුදය හා මාර්ගයද එයින් කියන ලද්දාහු වෙත්. ආර්‍ය්‍ය සත්‍ය ලක්ෂණයෙන් සමාන වන හෙයිනි.

ජටා සූත්‍රයෙහි ලක්ෂණ වශයෙන් දතයුතු ධර්මයෝ මෙසෙයින් දතයුත්තාහ.

## ලක්ෂණ හාර සම්පාතයයි.

---

ඉක්බිති චතුබ්‍යූහ හාර සම්පාතය දක්වනු ලැබේ.

**චතුබ්‍යූහ හාරනම් කවරේද?**

> නෙරුත්තමධිප්පායො බ්‍යඤ්ජනමථ දෙසනා නිදානඤ්ච
> පුබ්බාපරානුසන්ධී එසොහාරො චතුබ්‍යූහො

බ්‍යඤ්ජන වාරයෙන් සූත්‍රයාගේ නිරුක්ති විධියද දෙසකයාගේ අදහසද දෙසනා නිදානයද පූර්වාපරානු සන්ධියද යන සතර උපුටා දැක්වීම චතුබ්‍යූහහාරයයි.

නිරුක්ති නම් නාමාදී සියළු පදයන්ගේ ලක්ෂණ හා නිර්වචන දැක්වීමයි. පාවචනය පිළිබඳ සියළු ව්‍යාකරණ විධිය මේ නිරුක්තියට ඇතුළත් වේ.

**සීලෙ පතිට්ඨාය** යනාදී ගාථාවෙහි විජටයෙයනු අනුමති අර්ථයෙහි කාලත්‍රය සාධාරණවූ කර්තෘකාරක ප්‍රථම පුරුෂ ඒක වචන ආඛ්‍යාත ක්‍රියා පදයි. සො යනු එයින් උක්ත කර්තෘයි. නරොසපඤ්ඤො චිත්තං පඤ්ඤංච භාවයං ආතාපි නිපකො භික්ඛු යනු කර්තෘ විශෙෂණ පදයෝයි.

ජටං යනු අනුක්ත කර්මයි ඉමං යනු කර්ම විශෙෂණයි පතිට්ඨාය යනු විජටයෙ යන අවසාන ක්‍රියාවට පූර්ව ක්‍රියායි සීලෙ යනු ඊට ආධාරයි.

**කාය කම්මාදීනං සීලනං සමාධානං සීලං**–සීල සමාධානෙ.

කාය කර්මාදීන් මැනවින් පිහිටුවීම සීල නම් සීල ධාතුව මැනවින් තැබීම් අර්ථයෙහි වැටේ.

පජානාතීති පඤ්ඤා දනිනුයි ප්‍රඥා නම් සහ පඤ්ඤාය වත්තතෙනි සපඤ්ඤො ප්‍රඥාව සහිතව පවත්නුයි සපඤ්ඤො යනුවේ. චෙතයතීති චිත්තං සිතානුයි චිත්ත නම් ආසම්නතා ක්ලෙශ තාපය තීති ආතාපො තාපයින් කෙලෙස් තවානුයි ආතාප නම් වීර්‍ය්‍ය යයි. ආතාපො අස්ස අත්ථීති ආතාපී වීර්‍ය්‍ය මොහුට ඇත්තේනුයි ආතාපී නම් නිගුඝං පචවනෙති නිපකං අතිශයින් දැසේනුයි නිපක නම් සාවධුත්භාව තිසි නුවණයි නිපකං අස්ස අත්ථීති නිපකො සාවධුත්භාව තිසි නුවණ මොහුට ඇත්තේනුයි නිපකො යනුවේ.

යෙසං රාගොච දොසොච අවිජ්ජාච විරාජිතා යන වාක්‍යලුයෙහි විරාජිතා යනු කර්මකාරක කිතක ක්‍රියාවයි. යෙසං යනු කර්තෘ අර්ථයෙහි සම්බන්ධ බහු වචනයි අවිජ්ජා යනු උක්ත කර්මයි විරාජිතා යන්න ලක්ෂණ කොටගෙන රාගොච විරාජිතො දොසොච විරාජිතොයි: විරාජිතො යන පුල්ලිඞ්ග එක වචනයක් අධ්‍යාහාරය කළ යුතුයි.

ඛීණාසවා අරහන්තො යන තන්හි යෙ ඛීණාසවා තෙ අරහන්තො හොන්ති කියා වාක්‍යය සම්පූර්ණ කළයුතුයි. යම් අය ආශ්‍රවයන් ක්ෂය කළ රහත්හු වෙත්ද යනුයි. තෙසං විජටිතා ජටා යනුවෙහි යෙසං යන්න ප්‍රථම වාක්‍යයෙහි අනියමින් දක්වූවත් තෙසං යන්නෙන් නියම කාරණු ලැබේ. විජටිතා යනු කර්ම කාරක කිතක ක්‍රියායි ජටා යනු ඉන් උක්තවූ කර්මයි.

රජ්ජතීති රාගො රඤ්ජේනුයි රාග නම්. දුස්සතීති දොසො කිළුටු කෙරේනුයි දොස නම් විජානාතීති විජ්ජා දනිනුයි විජ්ජා නම් න විජ්ජා අවිජ්ජා දැනීම නොවන්නේ අවිජ්ජාවයි ඛීණා ආසවා යෙසං තෙ ඛීණාසවා ක්ෂය කළ ආශ්‍රවයෝ යම් කෙනෙකුන් විසින්ද ඔහු ඛීණාසව නම් වෙත්.

අරහන්තීති අරහන්තො පූජාවට සුදුසු වෙත්නුයි අරහන්ත නම් වෙත්.

යත්ථ නාමඤ්ච රූපඤ්ච අසෙසං උපරුජ්ඣති පටිඝං රූප සඤ්ඤාච යන වාක්‍යයෙහි උපරුජ්ඣති යනු තත්කාල වර්තමානයෙහි කර්තෘකාරක ක්‍රියාවයි. නාමං රූපං පටිඝං රූප සඤ්ඤා යන එක් එක් නාම පදයක් හා සම්බන්ධ වන හෙයින් මෙය අලඞ්කාර වශයෙන් ක්‍රියාදීපකයි.

එත්ථ සා ඡිජ්ජතෙ ජටා යන වාක්‍යයෙහි ඡිජ්ජතෙ යනු තත් කාල වර්තමාන කර්ම කාරක ක්‍රියාවයි එසා ජටා යනු ස්වයං කර්තෘ ස්වයං කර්මයි අසෙසං යනු ක්‍රියා විශෙෂණයි යත්ථ යනුවෙන් පූර්ව වාක්‍යයෙහි අනියමින් දක්වන ලද්ද එත්ථ යනුවෙන් නියම කරන ලදී, එනම්: ක්ලෙශ ක්ෂයයයි. නමතීති නාමං නැමේනුයි නාම නම්. රූපතීති

රූපං වැනසේනුයි රූප නම්. පටිඝසඤ්ඤන්ති පටිඝං හැපේනුයි පටිඝ නම් රූපෙප පමතා සඤ්ඤා රූපසඤ්ඤා රූපය අරමුණුකොට පැවති සංඥාව රූපසඤ්ඤා නම්. මෙසේ නිරුක්තිය සැකැවින් දක්වන ලදි. මේ දෙශනාවෙන් භාග්‍යවතුන් වහන්සේ දක්වූ අදහස කවරේද? යම් අය තෘෂ්ණා ජටාව සිඳහැරලනු කැමැත්තෝද ඔහු සීලයෙහි පිහිටින්නෝය සමථ විදර්ශනා වඩන්නෝය කෙලෙස් තවන වීර්‍ය්‍ය දරන්නෝය නුවණ වඩන්නෝය ඔහු රාග ද්වේෂ අවිද්‍යා සිඳහැර සියළු ආශ්‍රවයන්. ක්ෂයකොට රහත් වන්නෝය ඔහු කාමරූප අරූප යන භවත්‍රය, ඉක්ම නිර්වාණයට පැමිණෙන්නෝය යනුයි.

අන්තො ජටා බහි ජටා යනාදීන් දෙවතාවෙකු විසින් විචාළ ප්‍රශ්නය මේ දෙශනාවට නිදානයි එයින් හැඟෙන්නේ ජටා යනුවෙන් තෘෂ්ණාව කියන ලද බවයි විජටයෙ යන්නෙන් තෘෂ්ණා ක්ෂය කියන ලද බවයි භික්ඛු යන්නෙන් යොගාවචරයා කියන ලද බවයි සො ඉමං විජටයෙ ජටං යනුවෙන් අර්හත්ඵල විමුක්තිය කියන ලද බවයි.

අනෙකානුසන්ධිකා සූත්‍රයෙහි පූර්වාපර සන්ධි ගළපා දැක්වීමද එකානුසන්ධිකා සූත්‍රයෙහි දෙසනා නිදානයන් හා ගළපා දැක්වීමද පුබ්බාපරානුසන්ධි නම්. මේ පූර්වාපරානුසන්ධිය අත්ථ සන්ධි බ්‍යඤ්ජන සන්ධි නිද්දේස සන්ධි දෙසනා සන්ධි යයි සතර වැදෑරුම් වේ. එහි අත්ථ සන්ධි නම් ක්‍රියා කාරකාදි වශයෙන් අර්ථයාගේ සම්බන්ධයයි හේ වනාහි සංකාසනා පකාසනා විවරණා විභජනා උත්තානීකම්මං පඤ්ඤත්ති යන සවැදෑරුම් අර්ථ පදයන්ගේම වෙයි සියළු අර්ථ ඒ සයට ඇතුළත් වන හෙයිනි.

බ්‍යඤ්ජන සන්ධි නම් පදයක් පදාන්තරයක් හා වන සම්බන්ධයයි එද- අක්ඛරං පදං බ්‍යඤ්ජනං ආකාරො නිරුත්ති නිද්දෙසො යන සවැදෑරුම් බ්‍යඤ්ජන පදයන්ගේමය නාමාදි සියළු පද එහි ඇතුළත්වන බැවිනි.

දෙසනා සන්ධි නම් දෙසනාවක් දෙශනාන්තරයක් හා සංසන්දනය කිරීමයි නිද්දේස සන්ධිනම් නිර්දේශය උපුටා දැක්වීම හෝ නිර්දේශය හා ගළපා දැක්වීම හෝ පූර්ව පශ්චිම නිර්දේශයන් සංසන්දනය කිරීමයි.

මෙහි දෙශනා සන්ධි දක්වනු ලැබේ,

සවන්ති සබ්බධි සොතා ලතා උබ්භිජ්ජ තිට්ඨති .
තං ච දිස්වා ලතං ජාතං මූලං පඤ්ඤාය ඡින්දථ.

තෘෂ්ණා නැමති දිය පාරවල් රූපාදි සියළු තැනින් ගලා බසිත් එයින් තෘෂ්ණා නැමති ලතාව පැනනැග සිටී. ඒ හටගත් ලතාව දැක

නුවණින් මුල සිඳින්නේය ලතාව ජටාවක් වන බැවින් තෘෂ්ණාව ගෙතී යන ධර්මයක් බව මෙයිනුදු ප්‍රකාශවේ.

> සබ්බපාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා
> සචිත්ත පරියොදපනං එතං බුද්ධාන සාසනං

මෙහි සියළු පව් නොකිරීම නම් සීලයයි කුසල් රැස් කිරීම නම් සමථ විදර්ශනාවන්ගේ වැඩීමයි සිත් පිරිසිදු කිරීම නම් ප්‍රඥාවයි තෘෂ්ණාවෙච්ඡේදයට **සීල සමාධි පඤ්ඤාවන්** හේතුවන බව මෙයිනුදු ප්‍රකාශ වේ.

නිර්දේශ සංඛ්‍යා නම්-

සීලෙ පතිට්ඨාය — පෙ — විජටයෙ ජටං යනු **සෛඛභූමි** නිර්දේශයි

යෙසං රාගොච — පෙ — විජටිතා ජටා යනු **අශෛඛභූමි** නිර්දේශයි

යත්ථ නාමඤ්ච — පෙ — ඡිජ්ජතෙ ජටා යනු **විමුක්තිභූමි** නිර්දේශයි

**චතුබ්‍යූහ හාර සම්පාතයයි**

---

ඉක්බිති ආවත්ත හාරය දක්වනු ලැබේ.

**එහි කවරේද?**

> එකම්හි පදට්ඨානෙ පරියෙසති සෙසකං පදට්ඨානං
> **ආවත්තති** පටිපක්ඛෙ ආවත්තො නාම සො හාරො

එක් පදස්ථාන ධර්මයක් සූත්‍ර රූපව ඇතිකල්හි ඊට විසභාග වශයෙන් සෙසු පදස්ථාන ධර්මයන් නුවණින් සොයාද දේශනාව ප්‍රතිපක්ෂ වශයෙන් ආවර්තනය කෙරේද එය **ආවත්ත හාරයයි.**

දේශනාගත ධර්මයන් සභාග විසභාග වශයෙන් ආවර්තනය කිරීම් **ලක්ෂණ** කොට ඇත්තේ ආවත්ත හාරයයි.

**සීලෙ පතිට්ඨාය** යන්නෙන් දක්වන ලද **සීලය** නම් සම්‍යක් වචනය සම්‍යක් කර්මාන්තය **සම්‍යක්** ආජීවය යන තුනයි **චිත්තං භාවයං** යන්නෙන් දක්වන ලද චිත්ත භාවනාව නම් **සම්මා සති සම්මා** සමාධි යන දෙකයි.

**පඤ්ඤං** භාවයං යන්නෙන් දක්වන ලද ප්‍රඥා භාවනාව නම් **සම්මාදිට්ඨි සම්මා සඞ්කප්ප** යන දෙකයි

**සො ඉමං විජටයෙ ජටං** යනු එසේ කථිතවූ මේ මාර්ගාඞ්ග අවිද්‍යා **තෘෂ්ණා** ජාල සම්ප්‍රදාලනය දක්වන ලදී

මේ සම්‍යක් මාර්ගයට විසභාගවූයේ මිථ්‍යා මාර්ගයයි එනම්: මිච්ඡාදිට්ඨි මිච්ඡා සඞ්කප්ප මිච්ඡාවාචා මිච්ඡාකම්මන්ත මිච්ඡා ආජීව මිච්ඡා වායාම මිච්ඡා සති මිච්ඡා සමාධි – යන අඞ්ග අටයි.

යෙසං රාගොච – පෙ – විජ්ජිතා ජටා යනු තෘෂ්ණා ක්ෂය කළ ආර්‍ය්‍ය පුද්ගලයෝය.

යත්‍ථ නාමංච – පෙ – ඡිජ්ජතෙ ජටා යනු නිරොධයයි

ඒ ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ යම් උපාදින්නක ස්කන්ධ පංචකයක් වේද ඒ දුකයි

ඒ ආර්‍ය්‍ය පුද්ගලයන් විසින් ඡේද්‍යමානවූ යම් තෘෂ්ණා ජටාවක් වේද ඒ සමුදයයි

ඒ ආර්‍ය්‍ය පුද්ගලයන්හට විසභාගවූවෝ තෘෂ්ණා ජටාවෙන් ජටිතවූ පෘථග්ජනයෝයි

ඒ දුකට විසභාග වූයේ අනුපාද පරිනිර්වාණයයි
ඒ තෘෂ්ණා ජටාවට විසභාග වූයේ ආර්‍ය්‍ය මාර්ගයයි

ආවත්තහාර සම්පාතයයි

---

ඉක්බිති විභක්ති හාරය දක්වනු ලැබේ

**විභක්ති හාරය නම් කවරේද?**

ධම්මංච පදට්ඨානං භූමිංච විභජතෙ අයං හාරො
සාධාරණෙ අසාධාරණෙච නෙය්‍යො විභත්ති ති

සංකිලෙස වොදාන ධර්මයන් පදස්ථාන වශයෙන් හා භූමි වශයෙන්ද සාධාරණ අසාධාරණ වශයෙන්ද බෙදා දැක්වීම විභක්ති හාරයයි.

විචයහාර යුක්ති හාරයෝ විභක්තිහාරයට පරිකර්ම ස්ථානයි සීලෙ පතිට්ඨාය – පෙ – විජටයෙ ජටං – යනු නිබ්බෙධ භාගිය සූත්‍රයයි

මෙහි සීලය නම් ප්‍රහාණ සීලයයි. කාය වාග්දුශ්චරිතයන්ගේ ප්‍රහාණය එයින් කරණු ලැබේ – සීලය සමාධියට පදස්ථානයි චිත්ත භාවනා නම් සමාධියයි. සමාධිය ප්‍රඥාවට පදස්ථානයි ප්‍රඥා භාවනාව විමුක්තියට පදස්ථානයි. මෙයින් දර්ශන භූමිය හා භාවනා භූමිය දක්වන ලදී. සීලය සියළු ශෛක්ෂයන්ට සාධාරණ වේ ධර්මතාව අසාධාරණ වේ ප්‍රඥාව සියළු ආර්‍ය්‍යයන්හට සාධාරණ වේ ධර්මතාව අසාධාරණ වේ.

විභත්තිහාර සම්පාතයයි.

ඉක්බිති පරිවර්තන හාරය දක්වනු ලැබේ

**ඒ කවරේද?**

කුසලා කුසලෙ ධම්මෙ නිද්දිට්ඨෙ භාවිතෙ පහීනෙච
පරිවත්තති පටිපක්ඛෙ හාරො පරිවත්තනො නාම

සූත්‍රයෙහි නිර්දිෂ්ටවූ ධර්මයන්ද වැඩිය යුතු පහකළ යුතු ධර්මයන්ද ප්‍රතිපක්ෂයට පෙරළා දැක්වීම **පරිවර්තන** හාරයයි

සීලයෙහි පිහිටියහුට කාය වාග් දුශ්චරිතයෝ ප්‍රහීණ වෙත්. කාය වාග්දුශ්චරිතයන්ගේ ප්‍රහාණයෙන් කාය වාග්සුචරිතයෝ සම්පූර්ණවෙත්. විතක භාවනා කරන්නාහුට විතක වික්ෂෙපය ප්‍රහීණවේ. විතක වික්ෂේප ප්‍රහාණයෙන් විතක **සමාධිය** සම්ප්‍රාප්ත වේ. **ආතාපනා** වීර්‍යය ඇති කල්හි කුසීත භාවය පහවේ කුසීත භාවය පහවීමෙන් වීරිද්ධි පාදය සම්පූර්ණවේ රාගය ඇති කල්හි අසුභ සංඥාව ප්‍රහීන වේ අසුභ සංඥාව ප්‍රහීණවූ කල්හි අසුභයෙහි සුභය යන විපර්‍යාසය ඇතිවේ.

**ද්වේෂය** ඇති කල්හි මෛත්‍රී චේතො විමුක්තිය පහවේ මෛත්‍රී චේතො විමුක්තිය පහවූ කල්හි ප්‍රාණඝාතාදි අකුසල ධර්මයන්ගේ පහළ වීම වේ

**අවිද්‍යාව** ඇති කල්හි **විද්‍යාව** පහළ නොවන්නේය **විද්‍යාව** නැතිකල්හි මෝහයෙන් මූළා වන්නේය ජටා, විජටනයවූ **කල්හි** සංයෝජනයන්ගේ විසංයොගය වේ විගත සංයොග ඇති කල්හි ජාතිය ක්ෂය වන්නේය නාම රූපයන්ගේ **නිරෝධය** ඇති කල්හි **විඥාන** නිරොධය වන්නේය **විඥානය** නිරුද්ධවූ කල්හි **පුනර්භවය** ඇති නොවන්නේය **පටිඝ සඤ්ඤා රූපසඤ්ඤා** වන්ගේ **උපරොධය** ඇති කල්හි කාම රාග රූප රාගයන්ගේ අභාවය වන්නේය

කාමරාග රූප රාගයන්ගේ ප්‍රහාණයෙන් කාම රාග රූප රාග සංයෝජනයන් ක්ෂය වන්නේය කාම රාගය හා ද්වේෂය අනාගාමි මාර්ගයෙන් ප්‍රහීන වන කල්හි රූප රාග අරූප රාග හා අවිද්‍යාව අර්හත්මාර්ගයෙන් ප්‍රහීන වන්නේය.

මේ මාර්ගවයම භාවනා භූමිය වන්නේය

**පරිවත්තනහාර සඞ්ඛාතයයි**

---

ඉක්බිති වෙවචන හාරය දක්වනු ලැබේ

**වෙවචනහාරය යනු කවරේද?**

වෙවචනානි බහූනිතු සුත්තෙ වුත්තානි එකධම්මස්ස
යො ජානාති සුත්තවිදූ වෙවචනො නාම සො හාරො

සූත්‍රයෙහි කියන ලද එක් ධර්මයක් පිළිබඳවූ බොහෝ පර්‍යාය වචනයන් **දැක්වීම වෙවචන හාරයයි**

සීලං සුචරිතං කාය වාචාය සමාධානං කායවාචා පාරිසුද්ධි සංවරො සමාචාරො යනාදිය සීලය පිළිබඳ වෙ වචනයි.

චිත්තං මනො මනින්ද්‍රියං මනායතනං මනොවිඤ්ඤාණං විජානනං යනාදිය සිත පිළිබඳවූ වේ වචනයි.

පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං අධිපඤ්ඤා සික්ඛා පඤ්ඤාක්ඛන්ධො ධම්ම විචය සම්බොජ්ඣඞ්ගො ඤාණං සම්මා දිට්ඨි තීරණ විපස්සනා චක්ඛු විජ්ජා භූරි මෙධා බුද්ධි ආලොකො යනාදිය ප්‍රඥාව පිළිබඳ වෙවචනයි.

ආතාපො විරියං විරියින්ද්‍රියං විරිය බලං විරිය සම්බොජ්ඣඞ්ගො ආරම්භො පධානං පදහිතත්තං යනාදිය වීර්‍ය පිළිබඳ වෙවචනයි

ජටා ජාලං ඡදනං තණ්හා පිපාසා අභිනන්දනා ආසා පිහා පිහායනා බන්ධනං රාගො සාරාගො රඤ්ජිතත්තං ජෙඤ යනාදිය තෘෂ්ණාව පිළිබඳ වෙවචනයි.

දොසො පටිඝො ආඝාතො වෙරං අමනාපො දොමනස්සං අප්පසාදො විරොධො අනභිරති යනාදිය ද්වෙෂය පිළිබඳ වෙවචනයි.

අවිජ්ජා අඤ්ඤාණං මොහො අවිජානනං අදස්සනා අප්පටිවෙධො විපරීතගාහො මිච්ඡාදිට්ඨි යනාදිය අවිද්‍යාව පිළිබඳ වෙවචනයි.

ඛීණාසවො අරහා පරික්ඛීණභවසංයොජනො පාරංගතො නිබ්බුතො සීතිභූතො නික්කිලෙසො විමුත්තො වොම්පතො අනාසවො උත්තමො නාගො යනාදිය රහතුන් වහන්සේ පිළිබඳ වෙවචනයි.

වෙවචන හාර සම්පාතයයි

---

ඉක්බිති පඤ්ඤත්ති හාරය දක්වනු ලැබේ.

පඤ්ඤත්ති හාරය නම් කවරේද?

එකං භගවා ධම්මං පඤ්ඤත්තීහි විවිධාහි දෙසෙති
සො ආකාරො ඤෙය්‍යො පඤ්ඤත්ති නාම හාරොති

භාග්‍යවතුන් වහන්සේ දෙශනා කළ එක් ධර්ම පදයක් නොයෙක් ප්‍රඥප්තීන්ගෙන් පනවන්නාවූ පිහිටුවන්නාවූ ආකාරය දැක්වීම ප්‍රඥප්ති හාරයයි.

සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො යනු දුශ්චරිතයන් පිළිබඳ ප්‍රහාන ප්‍රඥප්ති යයි. සුචරිතයන් පිළිබඳ නික්ෂෙප ප්‍රඥප්තියයි. චිත්තං පඤ්ඤංච භාවයං යනු සමථ විදර්ශනා පිළිබඳ භාවනා ප්‍රඥප්තියයි එසේම දෙසනා ප්‍රඥප්තියයි. ආතාපී යනු වීර්‍ය්‍ය පිළිබඳ නික්ෂෙප ප්‍රඥප්තියයි. නිපකො යනු ප්‍රඥාව පිළිබඳ නික්ෂෙප ප්‍රඥප්තියයි. භික්ඛු යනු යොගියා පිළිබඳ වෙවචන ප්‍රඥප්ති යයි.

සො ඉමං විජටයෙ ජටං යනු සමුදය පිළිබඳ ප්‍රහාන ප්‍රඥප්තියයි යෙසං රාගොච – පෙ – විරාජිතා යනු කෙලශයන් පිළිබඳ ප්‍රහාන ප්‍රඥප්තියයි.

ඛීණාසවා අරහන්තො යනු රහතුන් පිළිබඳ නාම ප්‍රඥප්තියයි
යෙසං විජටිතා ජටා යනු මාර්ගය පිළිබඳ සාක්ෂාත්‍ය ප්‍රඥප්තියයි.

යත්ථ නාමංච – පෙ – එත්‍ථෙසා ඡිජ්ජතෙ ජටා යනු නිරොධය පිළිබඳ දෙශනා ප්‍රඥප්තියයි වෙවචන ප්‍රඥප්තියද වේ.

## ප්‍රඥප්ති හාරයයි

ඉක්බිති ඕතරණ හාරය දක්වනු ලැබේ.

**ඕතරණ හාරය නම් කවරේද?**

යොච පටිච්චුප්පාදෙ ඉන්‍ද්‍රිය ඛන්‍ධාච ධාතු ආයතනා
එතෙහි ඔතරතියො ඔතරණො නාම සො හාරො

ප්‍රතීත්‍ය සමුත්පාද ඉන්ද්‍රිය ස්කන්‍ධධාතු ආයතන යන මොවුන්ගේ මාර්ගයෙන් සූත්‍රය විස්තර කොට දක්වීම ඕතරණ හාර නම්වේ.

සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො යනුවෙන් ශීලස්කන්‍ධය දක්වන ලදී මේ ස්කන්‍ධයන්ගේ මාර්ගයෙන් ඔතරණයයි සීලය චාරිත්‍ර වාරිත්‍ර වශයෙන් විවිධ වේ චාරිත්‍ර සීලය ශ්‍රද්ධාවෙන් හා වීර්‍ය්‍යයෙන් පිරිය යුත්තේය වාරිත්‍ර සීලය ශ්‍රද්ධාවෙන් පිරිය යුත්තේය මෙයින් ශ්‍රද්ධෙන්ද්‍රිය හා වීර්‍ය්‍යෙන්ද්‍රිය කියන ලදහ. මේ ඉන්ද්‍රිය යන්ගේ මාර්ගයෙන් ඔතරණ යයි මේ ශ්‍රද්ධා වීර්‍ය්‍යාදි චෛතසිකයෝ ධර්ම ධාතුවට අයිති වූවාහු වෙති. මේ ධාතුන්ගේ මාර්ගයෙන් ඔතරණ යයි.

ඒ ධර්ම ධාතුවම ධර්මායතනයටද ඇතුළත් වේ– මේ ආයතනයන්ගේ මාර්ගයෙන් ඔතරණයයි.

සප්‍රාඥවූ නරයාගේ සීලය විද්‍යාභාගිය වේ – විද්‍යාව ඇති කල්හි අවිද්‍යානිරොධය වේ අවිද්‍යා නිරොධයෙන් සංස්කාර නිරොධය වේ සංස්කාර නිරොධයෙන් විඤ්ඤාණ නිරොධය වේ විඤ්ඤාණ නිරොධයෙන් නාමරූප නිරොධය වේ නාම රූප නිරොධයෙන් ෂඩායතන

**නිරොධය** වේ ෂඩායතන නිරොධයෙන් ස්පර්ශ නිරොධය වේ ස්පර්ශ නිරොධයෙන් **වෙදනා** නිරොධය වේ වෙදනා නිරොධයෙන් **තෘෂ්ණා නිරොධය** වේ **තෘෂ්ණා** නිරොධයෙන් **උපාදාන** නිරොධය වේ උපාදාන නිරොධයෙන් භව **නිරොධය** වේ භව නිරොධයෙන් **ජාති නිරොධය** වේ ජාති නිරොධයෙන් **ජරා මරණ ශොක පරිදෙව දුක්ඛ දෞර්මනස්සාදි** අනෙක දුක්ඛස්කන්ධයන්ගේ නිරොධය වේ මේ ප්‍රතීත්‍ය සමුත්පාද මාර්ගයෙන් **ඔතරණ** යයි.

චිත්තං **පඤ්ඤංච** භාවයං යන්නෙන් සමථ විදර්ශනාවෝ දක්වන ලදහ. **සමථය** සමාධිස්කන්ධයයි **විදර්ශනාව** ප්‍රඥා ස්කන්ධයයි එම ස්කන්ධයන්ගේ මාර්ගයෙන් **ඔතරණ** යයි **සමථය** සමාධීන්ද්‍රියයි **විදර්ශනාව** ප්‍රඥෙන්ද්‍රියයි මේ ඉන්ද්‍රියයන්ගේ මාර්ගයෙන් **ඔතරණ**යයි.

**ශ්‍රද්ධා** සමෘති **සමාධි වීර්ය** ප්‍රඥා යන මේ ඉන්ද්‍රියයෝ ධර්ම ධාතු **පර්‍යා**පන්නවෙත් මේ ධාතූන්ගේ මාර්ගයෙන් **ඔතරණ** යයි මොහු ධර්මායතන පර්‍යාපන්නද වෙති මේ ආයතනයන්ගේ මාර්ගයෙන් ඔතරණයයි ඉන්ද්‍රියයෝ විද්‍යාභාගිය වෙති **විද්‍යාව** ඇති කල්හි **අවිද්‍යා නිරොධය වේ** අවිද්‍යා නිරොධයෙන් **සංස්කාර නිරොධය** වේ. – පෙ – **ජාති නිරොධයෙන් ජරා මරණ ශොක පරිදෙව දුක්ඛ දෞර්මනස්ස උපායාසාදී** අනෙක දුක්ඛස්කන්ධයාගේ නිරොධයවේ මේ ප්‍රතීත්‍ය සමුත්පාද මාර්ගයෙන් **ඔතරණ** යයි.

**සො ඉමං විජටයෙ** ජටං යනු ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයයි ඒ ප්‍රඥා ස්කන්ධ ප්‍රඥෙන්ද්‍රිය ධර්මධාතු ධර්මායතන විද්‍යාවන්හි ඇතුළත්වේ මේ නයින් තවදුරටත් **ඔතරණ** කළ හැක්කේය.

**ඔතරණ හාරයයි.**

---

ඉක්බිති සොධන හාරය දක්වනු ලැබේ

**සොධන හාරය නම් කවරේද?**

විස්සජ්ජිතම්හි පඤ්හෙ ගාථායං පුච්ඡිතාය මාරබ්භ
සුද්ධා සුද්ධ පරික්ඛා හාරො සො සොධනො නාම

තථාගතයන් වහන්සේ විසඳු ප්‍රශ්නයෙහි ආරම්භය පිළිබඳ සුද්ධා සුද්ධ බව විචාරණය කිරීම **සොධන හාරයයි ආරම්භය** නම් ප්‍රශ්න ප්‍රච්ඡකයා විසින් දැනගන්ට ඕනෑ කළ ප්‍රධාන කරුණයි.

විසර්ජනයෙන් ඔවුන්ගේ සියළු සැක පසිඳ අවබොධය ඇතිවීම සුද්ධ බවයි.

**අනෙකා ජටා බහිද්ධා ජටාය ජටිතා පජා**- ප්‍රජාව සත්ව වර්ගයා ඇතුළත පිටත ජටාවෙන් ජටිත බව කියයි.

**සො ඉමං විජටයෙ ජටං** යනුවෙන් මේ ජටාව විජටනය කිරීමෙහි කවරෙක් සමර්ථ වේදැයි විචාරයි.

**සීලෙ පතිට්ඨාය** නරො සපඤ්ඤො චිත්තං පඤ්ඤඤ්ච භාවයං ආතාපී **නිපකො භික්ඛු** යනුවෙන් ජටා විජටනය කරනු කැමති පුද්ගලයාහට පිහිට වන ධර්මයන් වදාළසේක.

එපමණින් පදන්‍යාසය සුඩවූ නමුත් ඔහුගේ ආරම්භය සුඩ නොවිය එබැවින් ජටා විජටනය කොට සිටි පුද්ගලයන් දක්වීම පිණිස

යෙසං රාගොච දොසොච අවිජ්ජාච විරාජිතා
ඛීණාසවා අරහන්තො තෙසං විජටිතා ජටා යි

යටකී ධර්මයන් පුරා රාග ද්වෙෂ අවිද්‍යාවන් දුරුකොට සිටි ආශ්‍රවක්ෂය කළ රහත්හු ජටා විජටනය කළ උත්තමයෝ යයි වදාළසේක.

එයින් ප්‍රශ්න කරුගේ ආරම්භය සම්පූර්ණයෙන් ශුඩ නොවිය
එබැවින් ජටා විජටනයට අවකාශ දක්වීම පිණිස

යත්ථ නාමඤ්ච රූපඤ්ච අසෙසං උපරුජ්ඣති
පටිඝං රූප සඤ්ඤාච එත්ථෙසා ඡිජ්ජතෙ ජටා යි

නාම රූපයන්ද කාම රූප අරූප භවයන්ද නිරවශෙෂයෙන් නිරුද්ධ වන්නාවූ ස්ථානයෙහි ජටා විජටිත වේයයි වදාළසේක.

මෙයින් ප්‍රශ්නකරු විසින් දැනගනු කැමතිවූ **ජටා විජටනය** පිළිබඳවූ සම්පූර්ණ තත්වය ප්‍රකාශ වුණු බැවින් ආරම්භය සුඩවිය.

**සොධන හාර සම්පාතයයි**

---

ඉක්බිති **අධිට්ඨාන**හාරය දක්වනු ලැබේ

**අධිෂ්ඨාන** හාරය නම් කවරේද?

එකත්තතාය ධම්මා යෙපිච වෙමත්තතාය නිද්දිට්ඨා
තෙ න විකප්පයි තබ්බා එසො හාරො අධිට්ඨානො

සූත්‍රයෙහි කියන ලද **එකත්ව** විවිධත්ව ඇති ධර්මයෝ එකත්ව විවිධත්ව වශයෙන් විකල්පනය නොකළ යුත්තාහුය එකත්ව විවිධත්ව යන දෙක අනවස්ථාන හෙයිනි.

එකත්ව විවිධත්වයෝ වනාහි අපේක්ෂාවෙන් සිද්ධ වන්නාහුය අනවස්ථානවතුදු එකත්ව විවිධත්ව දක්වීම අධිෂ්ඨාන හාර නම් වන්නේය එකත්වය නම් සමාන බවයි විවිධත්වය නම් විශෙෂ බවයි සීලය යනු එකත්වයයි.

ප්‍රාතිමොක්ෂ සංවරසීලය ඉන්ද්‍රිය සංවර සීලය ආජීව පාරිශුද්ධි ශීලය ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලය යනු විවිධත්වයයි එසේවූවත් චරණ ධර්මයන් අතුරෙහි ශීලය විවිධත්වයෙහි වේ.

චිත්ත භාවනා යනු එකත්වයයි ප්‍රථමධ්‍යාන ද්විතිය ධ්‍යාන තෘතීය ධ්‍යාන චතුර්ථධ්‍යාන යනු විවිධත්වයයි එසේ වූවත් භාවනා යනු එකත්වයි චිත්ත භාවනා ප්‍රඥා භාවනා යනු විවිධත්වයි ප්‍රඥා භාවනා යනු එකත්වයයි සෝවාන් මාර්ගය සකෘදාගාමි මාර්ගය අනාගාමි මාර්ගය අර්හත්මාර්ගය යනු විවිධත්වයි.

ආතාපී යනු එකත්වයයි රාග ප්‍රහාණය පිණිස ආතාප ඇත්තේය ද්වෙස ප්‍රහාණය පිණිස ආතාප ඇත්තේය මොහ ප්‍රහාණය පිණිස ආතාප ඇත්තේය යනු විවිධත්වයයි. නිපකෝ යනු එකත්වයයි සීලයෙහි නිපකය සමාධියෙහි නිපකය ප්‍රඥාවෙහි නිපකය යනු විවිධත්වයයි මේ නයින් සෙස්සද දත හැක්කේය.

අධිෂ්ඨානහාර සම්පාතයයි

---

ඉක්බිති පරික්ඛාර හාරය දක්වනු ලැබේ

පරික්ඛාර හාරය නම් කවරේද?

යෙ ධම්මා යං ධම්මං ජනයන්ති පච්චයා පරම්පරතො
හෙතුමවකඩ්ඪයිත්වා එසො හාරො පරික්ඛාරො

සූත්‍රයෙහි ආවාවූ ඵල ධර්මයන් පිළිබඳ සමනන්තර වශයෙන්ද පරම්පරා වශයෙන්ද පැවති හෙතු ප්‍රත්‍යයන් නිර්ධාරණය කොට දක්වීම පරිෂ්කාර හාර නම් වේ.

ඵලය සකස් කරණ හෙයින් හෙතු ප්‍රත්‍යයෝ පරිෂ්කාර නම් වෙත් අසාධාරණ ලක්ෂණවූ කාරණ හේතුවයි සාධාරණ ලක්ෂණවූ කාරණ ප්‍රත්‍යයයි. අඞ්කුරය පහළවීමට බීජය අසාධාරණ කාරණයයි පෘථිවි ආපොරස සාධාරණ කාරණයි. ජනකය හේතුවයි පරිග්‍රාහකය ප්‍රත්‍යයයි සමාන බව හේතුවයි අසමාන බව ප්‍රත්‍යයයි.

බීජය අඞ්කුරයට සමාන හෙයින්ම එබඳුම අඞ්කුරයක් උපදවයි වෙනත් අඞ්කුරයක් නූපදවයි පෘථිවි ආපො රස අසමානයි වෙනත් අඞ්කුරයන්ටද ප්‍රත්‍ය වන හෙයිනි.

**හේතුව** ඵලය හා එකම කාලයෙහි නොසිටි ප්‍රත්‍යය සිටින්නේද වේ කලයෙහි වත් කළ කිරි කාලාන්තරයෙන් දි වෙයි දී හා කිරි එකම කාලයෙහි සිටින්නෝ නොවෙති සිහිල් ගුණය හා කාලය ප්‍රත්‍යයයි එය දී අවස්ථාවේදිද සිටියි ජවාවට තෘෂ්ණා අනුසය **හේතුවයි** රූපාදී **ආරම්මණ ප්‍රත්‍යයයි** ජවා විජටනාවට **මාර්ගය හේතුවයි සිල සමාධි** ප්‍රඥාවෝ **ප්‍රත්‍යයයි** සීලයට දුශ්ශීල්‍ය විධ්වංශනය **හේතුවයි හිරි ඔතප්** දෙක හා කල්‍යාණ මිත්‍ර සෙවනාදිය ප්‍රත්‍යයෝයි සමාධියට කම්ස්ථාන භාවනාව **හේතුවයි** සප්පාය සේවනාදිය ප්‍රත්‍යයෝයි ප්‍රඥාවට **විදර්ශනා භාවනාව හේතුවයි** අනිත්‍ය ලක්ෂණාදිය ප්‍රත්‍යයයි රාගයට අයොනිසො මනසිකාරය **ප්‍රත්‍යයයි** සුභාරම්මණය **හේතුවයි** ද්වෙෂයට අයොනිසො මනසිකාරය ප්‍රත්‍යයයි පටිඝාරම්මණය **හේතුවයි** අඥාවට අවිද්‍යානුසය **හේතුවයි** දුක්ඛාදීන්හි අඥානය **ප්‍රත්‍යයයි.**

**පරිෂ්කාර හාර සම්පාතයයි**

---

ඉක්බිති **සමාරොපන** හාරය **දක්වනු** ලැබේ

**සමාරොපන හාරය නම් කවරේද?**

යෙ ධම්මා යම්මූලා යෙචෙ කත්ථාපකාසිතා මුනිනා,
තෙ සමාරොපයිතබ්බා **එස සමාරොපනො හාරො**

සූත්‍රාගත ධර්මයෝ යම් ධර්මයන් හට මුල්වෙද්ද ඒ ධර්මයන්ද අර්ථයෙන් සමාන වන ධර්මයන්ද ආරොපනය කොට **දක්වීම සමාරොපන හාරයයි**

මුල්වන ධර්ම යනුවෙන් අදහස් කරණ ලද්දාහු **පදට්ඨාන ධර්ම** යෝයි අර්ථයෙන් සමාන වූවෝ නම් **වෙවචනයෝයි.**

සූත්‍රයෙහි **සඳහන්වූ හෝ** උපුටා ගන්නා ලද ශික්ෂාත්‍රය පිළිබඳ භාවනා **පාරිපූරියද** එම පාරිපූරියෙන් වන ප්‍රහානයද **පදට්ඨාන වෙවචන** මාර්ගයෙන් **දක්වීම සමාරොපන හාරයයි.**

**පදට්ඨාන වෙවචන** හාරයන් වෙන වෙනම ඉහතින් **වර්ණනා** කරණ ලද බැවින් නැවත ඒවා **සමාරොපන** හාරයෙහි ඇතුලත් කරණ ලද්දේ කවර හෙයින්දයත් මෙහි පදට්ඨාන වෙවචනයන්ගේ ගැනීම භාවනා ප්‍රහානයන්ගේ **අධිෂ්ඨාන විෂය** දක්වීම **පිණිසත්** ඔවුන්ගේ **අධිවචන විභාගය දක්වීම පිණිසත්ය** එසේ ඇති කල්හි භාවනා ප්‍රහානයෝ සුවසේ **දත** හැක්කාහු වෙති පැහැදිලිකොට **දක්වන්නට** පහසුද **වෙති.**

**සීලය සමාධියට** පදට්ඨාන වන්නේය **සමාධිය ප්‍රඥාවට** පදට්ඨාන වන්නේය ප්‍රඥාව **විද්‍යාවට** පදට්ඨාන වන්නේය විද්‍යාව විමුක්තියට පදට්ඨාන

වන්නේය විමුක්තිය විමුක්ති ඥාන දර්ශනයට පදස්ථාන වන්නේය. චිත්ත භාවනාව සමාධියට පදස්ථාන වන්නේය.

සමාධිය පිළිවෙළින් විමුක්ති ඥාන දර්ශනයතෙක් පදස්ථාන වන්නේය චිත්ත භාවනාවෙන් අනභිධ්‍යා අව්‍යාපාද ධර්මයන්ගේ පරිපූර්තිය වන්නීය අභිධ්‍යා ව්‍යාපාද ධර්මයන්ගේ ප්‍රහාණය වන්නේය චිත්ත භාවනාවෙන් ධ්‍යානධර්මයන්ගේ පරිපූර්තිය වන්නීය පඤ්ච නිවරණයන්ගේ ප්‍රහාණය වන්නේය සමාධියෙන් සමාපත්තිය සම්පූර්ණ වන්නීය.

වික්ෂෙපය ප්‍රහීන වන්නේය. – සමාපත්තියෙන් ඉහාතම් සැප විහරණය සම්පූර්ණ වන්නේය. දුඃඛ විහරණය ප්‍රහීන වන්නේය. ප්‍රඥා භාවනාව මාර්ගයට පදස්ථාන වන්නීය මාර්ගය ඵලයට පදස්ථාන වන්නේය ඵලය විමුක්තියට පදස්ථාන වන්නේය විමුක්තිය විමුක්ති ඥාන දර්ශනයට පදස්ථාන වන්නේය ප්‍රඥා භාවනාවෙන් සත්තිස් බොධිපාක්‍ෂික ධර්මයෝ සම්පූර්ණ වන්නාහුය අඥානය ප්‍රහීන වන්නේය ප්‍රඥා භාවනාවෙන් පුනර්භවය නැති වන්නේය. නිර්වාණාධිගමය ප්‍රත්‍යක්‍ෂ වන්නේය සීලයෙන් හිරිඔත්තප්ප ධර්මයෝ සම්පූර්ණ වන්නාහුය අහිරීක අනොත්තප්ප ධර්මයෝ ප්‍රහීන වන්නාහුය සීලයෙන් ප්‍රාණඝාත අදත්තාදාන කාම මිථ්‍යාචාර මුසාවාද ඵරුෂවාච පිසුණාවාච සම්ඵප්පලාප යන මොවුන්ගේ ප්‍රහාණයෙන් ප්‍රාණඝාතාදීන්ගේ විරතිය සම්පූර්ණ වන්නේය.

සීලයෙන් කාය කර්ම වාක්කර්ම ආජීවයන්ගේ පාරිශුද්ධිය සම්පූර්ණ වන්නේය. කාය දුශ්චරිත වාග්දුශ්චරිත මිථ්‍යාජීවයන්ගේ ප්‍රහාණය වන්නේය. මේ භාසින් සෙසු සමාරොපනද දතයුත්තාහුය.

සමාරොපන හාර සම්පාතයයි

---

සූත්‍රයාගේ ව්‍යඤ්ජන පර්යෙෂණයවූ මේ සොළොස් හාරයන්ගේ සම්පාතය දෙසනා හාරාදී පිළිවෙළින්ම කළයුත්තේය උපිළිවෙළින් නොකළ යුත්තේය කුමක් හෙයින් දයත්?

1 ධර්මදෙශනාව තමා නිඃශ්‍රය ඵල තද්උපාය ශරීරවූ ආස්වාදදීන් දක්වන සුළු බැවින්ද පියවින් සියළු සූත්‍රයන්හට අනුරූප වන බැවින්ද විචය හාරාදී අනිකුත් සංවර්ණනා විශෙෂයන්හට පිහිටවන බැවින්ද දෙශනා හාරය පළමුකොට සංවර්ණනා කළ යුත්තේය.

2 දෙසනා හාරයෙන් දක්වූ පදාර්ථයන්ද එද පෘච්ඡා විසර්ජන පූර්වාපරානු ගීතීන්ද විවෙචනය කරණ සුළු හෙයින් ඉක්බිති විචය හාරය සංවර්ණනා කළ යුත්තේය,

3 ප්‍රවිචිතඅර්ථයන්ගේ යුක්ති අයුක්ති විචාරණය කළයුතු හෙයින් ඉක්බිති යුක්ති හාරය සංවර්ණනා කළ යුත්තේය.

4 දෙසෙන නොදෙසෙන ධර්මයන්ගේ පහළ වීමට අනුරූපවූ කාරණ පරම්පරාව උපුටා දැක්වීම පදස්ථාන විභාවනය හෙයින් යුක්ති හාරයට අනතුරුව පදස්ථාන හාරය සංවර්ණනා කළ යුත්තේය.

5 පදස්ථාන පරම්පරාවෙන් ගන්නා ලද්දාවූම ධර්මයන්ට සමාන ලක්ෂණ ඇති ධර්මයන් ගතයුතු බව දැක්වීම පිණිස පදස්ථාන හාරයට අනතුරුව ලක්ෂණ හාරය සංවර්ණනා කළ යුත්තේය.

6 සූත්‍රයෙහි ස්වරූපයෙන් ආ ධර්මයන්ගේ පමණක් නොව ලක්ෂණ වශයෙන් ගත් ධර්මයන්ගේද නිර්වචනාභිප්‍රාය දෙසනා නිදාන පූර්වාපර සන්ධීන් කිය යුතු බැවින් ලක්ෂණ හාරානන්තරව චතුර්ව්‍යූහ හාරය සංවර්ණනා කළ යුත්තේය.

7 චතුර්ව්‍යූහයෙන් නිර්වචනාදිය දැක්වූ කල්හි සභාග විසභාග ධර්මයන්ගේ ආවර්තනය පහසුවෙන් කළ හැකි හෙයින් චතුර්ව්‍යූහ හාරයට අනතුරුව ආවර්ත හාරය සංවර්ණනා කළ යුත්තේය.

8 සභාග විසභාග ධර්මයන් ආවර්තනය කළ කල්හි සාධාරණ අසාධාරණ වශයෙන් සංක්ලේශ ව්‍යවදාන ධර්මයන්ගේ පදස්ථාන වශයෙන් හා භූමි වශයෙන් විභාගය පහසුවෙන් දැක්විය හැක්කේනුයි ආවර්තනයට අනතුරුව විභක්ති හාරය සංවර්ණනා කළ යුත්තේස.

9 සාවද්‍යානවද්‍ය ධර්මයන් විභාගකොට දැක්වූ කල සූත්‍රාගත ධර්මයන් පහසුවෙන් ප්‍රතිපක්ෂයට පෙරළිය හැකි හෙයින් විභක්තියට අනතුරුව පරිවර්තන හාරය සංවර්ණනා කළ යුත්තේය.

10 ප්‍රති පක්ෂයට පෙරළූ ධර්මයන්ද පර්යාය වචනයෙන් අවබෝධ කරවිය යුත්තාහුනුයි පරිවර්තනයට අනතුරුව වේවචන හාරය සංවර්ණනා කළ යුත්තේය.

11 පර්යාය ශබ්දයෙන් පැහැදිලි කරන ලද්දාවූ ඒ ධර්මයන්ගේ ප්‍රභේද වශයෙන් ප්‍රඥප්තිය සුකර වේනුයි වේවචන හාරයට අනතුරුව ප්‍රඥප්ති හාරය සංවර්ණනා කළ යුත්තේය.

12 ප්‍රභව පරිඥා ආදී ප්‍රඥප්ති විභාග මුඛයෙන් ප්‍රතීත්‍ය සමුත්පාද සත්‍යාදී ධර්ම විභාගය කළ කල්හි සූත්‍රයෙහි ආ ධර්මයන්ගේ ප්‍රතීත්‍ය සමුත්පාදාදී මුඛයෙන් සලකා ගැනීම හැක්කේනුයි ප්‍රඥප්තියට අනතුරුව ඔතරණ හාරය සංවර්ණනා කළ යුත්තේය.

13 ධාතු ආයතනාදීන්හි ඔතාරිතවූ සූත්‍රාගත පදාර්ථයන්ගේ පෘච්ඡාරම්භ විශොධනය පහසුවේනුයි. ඔතරණයට අනතුරුව සොධන හාරය සංවර්ණනා කළ යුත්තේය.

14 සූත්‍රයෙහි පදාර්ථයන් විශොධිතවූකල එහිලා වන්නාවූ සාමාන්‍ය විශෙෂ භාවය සුවසේ කළ හැක්කේනුයි සොධනයට අනතුරුව අධිට්ඨාන හාරය සංවර්ණනා කළ යුත්තේය.

15 සාමාන්‍ය විශෙෂවූ සාධාරණ අසාධාරණ ධර්මයන් පැවසූ කල පරිස්කාර සංඛ්‍යාත ප්‍රත්‍යයභෙදය සුව ස් දතහැක්කේනුයි. අධිට්ඨානහාරයට අනතුරුව පරික්ඛාර හාරය සංවර්ණනා කළ යුත්තේය.

16 හෙතු ප්‍රත්‍යයන් දක්වූ කල්හි පදස්ථාන වෙවචනයන්ගේ මාර්ගයෙන් භාවෙතව්‍ය ප්‍රහාතව්‍ය ධර්මයන්ගේ භාවනා ප්‍රහාණයන් උපුටා දක්වනු ලබන කල්හි මැනවින් සූත්‍රාවබොධය පිණිස පවතීනුයි පරිෂ්කාරයට අනතුරුව සමාරොපන හාරය සංවර්ණනා කළ යුත්තේය.

මේ සොළොස් හාරයන්ගේ පිළිවෙළයි.

මෙයින් පිටත් සූත්‍ර වර්ණනා ක්‍රමයෝ නැත්තාහ. යත්තකාහි- සුත්තස්ස සංවණ්ණනා විසෙසා සබ්බෙතෙ නෙත්ති උපදෙසා යත්තාසි කී හෙයින් සෙසු වර්ණනා ක්‍රමයෝද මේ සොළොසයෙහිම ඇතුළත් වෙති.

**වෙනත් සංවර්ණනා ක්‍රම**

සූත්‍රයාගේ සමුට්ඨානය කියයුතුයි අදහස පැහැදිලි කළ යුතුයි පදාර්ථ වර්ණනා කළ යුතුයි. විධි අනුවාද දෙක දතයුත්තේය විරොධය සමථය කළයුත්තේය. අනු සන්ධියට අනුරූප නිගමනය දක්විය යුතුයි යනු එක් සංවර්ණනා ක්‍රමයකි.

එහි සමුට්ඨාන නම් දෙසනා නිදානයයි එය චතුබ්‍යූහ හාරයෙන් දක්වේ. අදහසද එයින්ම දක්වේ. පදාර්ථය දෙසනා හාරයෙන් දක්වේ. විධි අනුවාදදෙසා විභත්තිහාරයෙන් දක්වේ. විරොධය පරිවර්තන හාරයෙන් දක්වේ.

නිගමනය විචය යුක්ති හාරයෙන් දක්වේ. සූත්‍රයාගේ ප්‍රයෝජනය පිණ්ඩාර්ථය පදාර්ථය අනුසන්ධිය චොදනා පරිහාරය කිය යුතුයි. යනු එක් සංවර්ණනා ක්‍රමයකි.

**මෙය දෙසනාහාර චතුබ්‍යූහ හාර විචයහාර යුක්තිහාරයන්ගෙන් දක්වේ.**

**එසේම** සූත්‍රයාගේ උපොද්ඝාටය පදවිග්‍රහ පදාර්ථ චලනාව හා ප්‍රත්‍යුපස්ථානයන් කිය යුතුයි යනු තවත් ක්‍රමයකි.

එහි **උපොද්ඝාටය** නම් නිදානය **මැයි**. පදාර්ථ චලනාව නම් **චෝදනාව මැයි**. පච්චුපට්ඨාන නම් **පරිහාරය** මය තවද **එකනාලිකා චතුරස්සා නිඝනනවත්තනිකා** යි ක්‍රම තුනක්ද වෙති. එහි **එකනාලිකා** නම් පදයක් පාසා අර්ථ කථනයයි.

ප්‍රතිපක්ෂය දක්වා ඊට උපමාවක් ගෙනහැර කීම හා සපක්ෂය දක්වා ඊට උපමාවක් ගෙනහැර කීම **චතුරස්ස** කථාවයි.

**මෙය ආවත්ත පරිවත්ත හාරයන්ගෙන්** දක්වේ.

විසභාග ධර්ම වශයෙන් කෙළවරට ගොස් නැවත සභාග ධර්ම වශයෙන් කෙළවරට පැමිණීම **නිඝනන වත්තනිකා** නමි.

මෙයද ආවර්තන පරිවර්තනයන්ගෙන් දක්වේ තවද **හෙද සාධා සාධ සාධා පයෝජ්‍ය වචන** යන මෙයින් සූත්‍රය **සංවර්ණනා** කළයුත්තේ යනුද එක් ක්‍රමයකි. මෙය **විභක්ති දෙසනා වෙවචන හාරයන්ගෙන් දක්වේ.**

මෙසේ නොයෙක් සූත්‍ර සංවර්ණනා ක්‍රමයෝ මේ සොළස හාරයන් හිම ඇතුළත් වෙති යි දත යුත්තේය.

**සොළස හාර සම්පාත වර්ණනාව නිමි.**

---

**පඤ්චනය.**

සූත්‍රයාගේ ව්‍යඤ්ජන විචාරණය පිළිබඳවූ සොළොස් හාරයන් දක්වා **ඉක්බිති** අර්ථ විචාරණය පිළිබඳ **පඤ්චනය** දක්වනු ලැබේ. ධර්මකථිකයන් විසින් සූත්‍රයාගේ අර්ථ ප්‍රවිචය පිණිස දක්වනු ලැබේනුයි **නය** නම්වේ.

මාර්ගඥනයට ගෙනයයි පමුණුවානුයි හෝ **නය** නම් වේ. **නන්දියා** වට්ට **තිපුක්ඛල සීහවික්කීළිත දිසාලෝචන අඞ්කුස** යයි නය පසකි.

එහෙයින් කියන ලදී නෙත්තිප්පකරණයෙහි.

පඨමො නන්දියාවට්ටො දුතියො ච තිපුක්ඛලො
සීහවික්කීළිතො නාම තතියො නය ලඤ්ජනො
දිසාලොචන් මාහංසු චතුත්ථං නය මුත්තමං
පඤ්චමො අඞ්කුසො නාම සබ්බෙ පඤ්චනයා ගතාති.

නය සමුට්ඨානයෙහි මූල පද අටළොස්වන්නාහුය. ඔහු කුසල පක්ෂය අකුසල පක්ෂයයි ද්විවිධ වෙති. ව්‍යවදාන පක්ෂය සංක්ලේශ පක්ෂය යනුද මීටම නම් වෙත්. ඉන්ද්‍රිය භූමි කෙලශභූමි යනුද එසේම මීටම නම් වෙත්. තෘෂ්ණා අවිද්‍යා ලොභ ද්වේෂ මොහ සුභ සංඥා සුඛ සංඥා නිත්‍ය සංඥා ආත්ම සංඥා යි අකුසල පක්ෂයෙහි මූලපද නවයෙකි. සමථ විදර්ශනා අලොභ අද්වේෂ අමොහ අසුභ සංඥා දුක්ඛ සංඥා අනිත්‍ය සංඥා අනාත්ම සංඥායි කුසල පක්ෂයෙහි මූලපද නවයකි.

අටළොස් මූල පදයන් දක්වීමේදී සුඛ සංඥා නිත්‍ය සංඥා සුභසංඥා ආත්ම සංඥා යන සතරට සතර විපර්‍යාස ධර්මයයිද අසුභ සංඥා දුක්ඛ සංඥා අනිත්‍ය සංඥා අනාත්ම සංඥා යන සතරට සතර සතිපට්ඨානයයිද සමහර තැනක සඳහන්වී තිබේ.

කායානුපස්සනා වෙදනානු පස්සනා චිත්තානු පස්සනා ධම්මානු පස්සනා යන සතර සතිපට්ඨාන ධර්මයන්ගෙන් පිළිවෙලින් අසුභ සංඥා ආදිය පහළ විය යුතු හෙයිනැයි හඟිමු එහෙයින් කියන ලදී.

නෙත්තිප්පකරණයෙහි

තණ්හාච අවිජ්ජාපි ච ලොභො දොසො තථෙව මොහො ච
චතුරො ච විපල්ලාසා කිලෙස භූමි නව පදානි.

සමථො ච විපස්සනා ච කුසලානි ච යානි තීනි මූලානි
චතුරො සතිපට්ඨානා ඉන්ද්‍රිය භූමී නව පදානි.

නවහිච පදෙහි කුසලා නවහිච පදෙහි යුජ්ජන්ති අකුසල පක්ඛා
එතෙ ඛො මූලපදා භවන්ති අට්ඨාරස පදානි; ති.

සොළස හාරයන්ගෙන් සංවර්ණිතවූ සූත්‍රයෙහි මේ අටළොස් මූල පද සොයා බලා චතුඃ සත්‍යයන් හා යොදා දක්වීම නය සංවර්ණනාවයි.

නය පස අතුරෙන් අර්ථ සංවර්ණනාවෙහි උපයෝගී වනුයේ නන්ද්‍යාවර්ත්ත තිපුක්ඛල සිංහ වික්‍රීඩිත යන තුනයි දිශාලෝචන අඞ්කුශ යන දෙක කර්ම නය හෙවත් ව්‍යවහාර නයයි කියනු ලැබෙති.

නය සමුට්ඨානයෙහි පුද්ගලාධිෂ්ඨාන ධර්මාධිෂ්ඨාන වශයෙන් ක්‍රමදෙකක් වෙති. අර්ථ නය ත්‍රය ඔවුනොවුන් ඔවුනොවුන්කෙරෙන් විනිර්ගම වන්නෝද වෙති.

එබැවින් සොළස හාරයන් මෙන් නය යන් උද්දෙස ක්‍රමයෙන් දක්විය යුතු බවක් නැත්තේය.

පුද්ගලාධිෂ්ඨාන වශයෙන් ගන්නා කල නන්දියාවට්ට නයින් සීහවික්කීළිත නයද සීහවික්කීළිත නයින් තිපුක්ඛල නයද තිපුක්ඛල නයින් නන්දියාවට්ට නයද සම්භව වන්නේය.

අපි මෙහි ධර්මාධිෂ්ඨාන වශයෙන් නය සමුත්ථානය දක්වන්නෙමු පළමු කොට පුද්ගලයන් දක්වන්නෙමු.

**පුද්ගලයෝ නම්:-**

තථාගත ධර්මය අසා අවබෝධ කිරීමට භව්‍යවූ විනෙය පුද්ගලයෝය නන්දියාවට්ටයෙහි තෘෂ්ණා චරිත දෘෂ්ටි චරිතයයි චරිත වශයෙන් පුද්ගලයෝ දෙදෙනෙකි. ඔහු දෙදෙන ඉන්ද්‍රිය භේදයෙන් සතරදෙනෙක් වෙත්.

එනම්:-

තෘෂ්ණා චරිත මෘද්වින්ද්‍රිය
තෘෂ්ණා චරිත තීක්ෂ්ණෙන්ද්‍රිය
දෘෂ්ටි චරිත මෘද්වින්ද්‍රිය
දෘෂ්ටි චරිත තීක්ෂ්ණෙන්ද්‍රිය වශයෙනි.

මොහු සතරදෙන සීහවික්කීළිත නයෙහි විනෙය පුද්ගලයෝයි. මොහු සතරදෙන විනෙය කෘත්‍ය වශයෙන් උද්ඝටිතඥ විපඤ්චිතඥ නෙය්‍ය යයි තුන්දෙනෙක් වෙති.

තෘෂ්ණා චරිත මෘද්වින්ද්‍රිය පුද්ගලයා නෙය්‍ය නම් වේ. තෘෂ්ණා චරිත තීක්ෂ්ණෙන්ද්‍රිය පුද්ගලයාද දෘෂ්ටි චරිත මෘද්වින්ද්‍රිය පුද්ගලයාද විපඤ්චිතඥ නම් වේ.

දෘෂ්ටි චරිත තීක්ෂ්ණෙන්ද්‍රිය පුද්ගලයා උද්ඝටිතඥ නම් වේ. මොහු තුන්දෙන තිපුක්ඛල නයෙහි විනෙය පුද්ගලයෝය. ධර්ම නම් දිසා භූත ධර්මයෝය ඔහු සූත්‍රාගතයෝය.

විශේෂයෙන් වෙය්‍යාකරණ අඩංගුව අයත් සූත්‍රාන්තයි කියන ලද කුසල කුසලා කුසල ධර්මයෝය.

දිසා නම් ඒ ඒ පුද්ගලයන්ගේ සංක්ලේශයට හා ව්‍යවදානයට හේතුවූ ධර්මභාගයයි.

සීහවික්කීළිත නයෙහි එක් එක් දිසාවෙහි ධර්ම දසය බැගින් වෙත්. එක් එක් නයෙහි සංක්ලේශ ව්‍යවදාන වශයෙන් පක්ෂවයක් ඇති බව යට කියන ලදී. එහෙයින් සීහවික්කීළිත නයෙහි ප්‍රථම පුද්ගලයාවූ තෘෂ්ණා චරිත මෘද්වින්ද්‍රිය පුද්ගලයාගේ සංක්ලේශයට පිළිවෙළින් හේතුවූ අකුශල ධර්ම දශය සීහ වික්කීළිත

සංකෙලශ පක්ෂයෙහි ප්‍රථම දිසාවයි. එහි දෙවන පුද්ගලයාවූ තෘෂ්ණා චරිත තීක්ෂණෙන්ද්‍රිය පුද්ගලයාගේ සංක්ලෙශයට පිළිවෙළින් හේතුවූ ධර්ම දශය එම විතීය දිසාවයි.

තුන්වන දෘෂ්ටි චරිත මෘද්වින්ද්‍රිය පුද්ගලයාගේ සංක්ලෙශයට පිළිවෙළින් හේතුවූ ධර්ම දශය තුන්වන දිසාවයි.

සතරවන දෘෂ්ටි චරිත තීක්ෂණෙන්ද්‍රිය පුද්ගලයාගේ සංකිලෙසයට පිළිවෙලින් හේතුවූ ධර්ම දශය එම සතර වන දිසාවයි

මෙකී පුද්ගලයන්ගේ ව්‍යවදානයට පිළිවෙලින් හේතුවන්නාවූ ධර්ම දශකා සතර ව්‍යවදාන පක්ෂයෙහි දිසා සතර නම් වන්නේය. ප්‍රථම පුද්ගලයාගේ ව්‍යවදානයට හේතුවූ ධර්ම දසය ප්‍රථම දිසාවයි.

දෙවන පුද්ගලයාගේ ව්‍යවදානයට හේතුවූ ධර්මදශය දෙවන දිසාවයි.

තුන්වන පුද්ගලයාගේ ව්‍යවදානයට හේතුවූ ධර්ම දශය තුන්වන දිසාවයි.

සතර වන පුද්ගලයාගේ ව්‍යවදානයට හේතුවූ ධර්මදශය සතර වන දිසාවයි.

මෙසේ සීහවික්කීළිතයෙහි දිසා අටකි. ධර්ම අසූවකි.

---

# සීහ වික්කීළිත නය.

## සංක්ලෙශ පක්ෂය.

| | 1. දිසාව. | 2. දිසාව. |
|---|---|---|
| 1 | කබලිඞ්කාරො ආහාරො | ඵස්සො ආහාරො |
| 2 | සුභවිපල්ලාසො | සුඛ විපල්ලාසො |
| 3 | කාමූපාදානං | සීලබ්බතු පදානං |
| 4 | අභිජ්ඣා කාය ගන්ථො | භව යොගො |
| 5 | කාම යොගො | ව්‍යාපාද කාය ගන්ථො |
| 6 | කාමාසවො | භවාසවො |
| 7 | කාමොඝො | භවොඝො |
| 8 | රාගසල්ලං | දෙස සල්ලං |
| 9 | රූපූපගා විඤ්ඤාණට්ඨිති | වෙදනූපගා විඤ්ඤාණට්ඨිති |
| 10 | ඡන්දාගති ගමනං | දොසාගති ගමනං |

| | 3. දිසාව. | 4. දිසාව. |
|---|---|---|
| 1 | මනො සඤ්චෙතනාහාරො | විඤ්ඤාණා හාරො |
| 2 | අත්ත විපල්ලාසො | නිච්ච විපල්ලාසො |
| 3 | දිට්ඨුපාදානං | අත්තවාදුපාදානං |
| 4 | දිට්ඨියොගො | අවිජ්ජා යොගො |
| 5 | පරාමාස කාය ගන්ථො | ඉදං සච්චාභිනිවෙස කාය ගන්ථො |
| 6 | දිට්ඨාසවො | අවිජ්ජාසවො |
| 7 | දිට්ඨො ඝො | අවිජ්ජො ඝො |
| 8 | දිට්ඨිසල්ලං | මොහ සල්ලං |
| 9 | සඤ්ඤූපගා විඤ්ඤාණට්ඨිති | සඞ්ඛාරූපගා විඤ්ඤාණට්ඨිති |
| 10 | භයා අගති ගමනං | මොහා අගති ගමනං |

## ව්‍යවදාන පක්ෂය.

| | 1. දිසාව. | 2. දිසාව. |
|---|---|---|
| 1 | දුක්ඛා පටිපදා දන්ධා භිඤ්ඤා | දුක්ඛා පටිපදා ඛිප්පා භිඤ්ඤා |
| 2 | පඨමජ්ඣානං | දුතියජ්ඣානං |
| 3 | කායානු පස්සනා | වෙදනානු පස්සනා |
| 4 | දිබ්බො විහාරො | බ්‍රහ්ම විහාරො |
| 5 | අනුප්පන්නානං පාපකානං ධම්මානං අනුප්පාදාය වායාමො | උප්පන්නානං පාපකානං ධම්මානං පහානාය වායාමො |
| 6 | මානප්පහානං | ආලය සමුග්ඝාතො |
| 7 | සච්චාධිට්ඨානං | චාගාධිට්ඨානං |
| 8 | ඡන්ද සමාධි | චිත්ත සමාධි |
| 9 | ඉන්ද්‍රිය සංවරො | තපො |
| 10 | මෙත්තා | කරුණා |

## වොදාන පක්ෂය.

| | 3. දිසාව. | 4. දිසාව. |
|---|---|---|
| 1 | සුඛාපටිපදා දන්ධා භිඤ්ඤා | සුඛා පටිපදා ඛිප්පා භිඤ්ඤා |
| 2 | තතියජ්ඣානං | චතුත්ථජ්ඣානං |
| 3 | චිත්තානු පස්සනා | ධම්මානු පස්සනා |
| 4 | අරියො විහාරො | ආනෙඤ්ජො විහාරො |
| 5 | අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය වායාමො | උප්පන්නානං කුසලානං ධම්මානං භිය්‍යො භාවාය වායාමො |
| 6 | අවිජ්ජා පහාණං | ඝවුප සමො |
| 7 | පඤ්ඤාධිට්ඨානං | වූපසමාධිට්ඨානං |
| 8 | විරිය සමාධි | වීමංසා සමාධි |
| 9 | බුධි | සබ්බූපධි පටිනිස්සග්ගො |
| 10 | මුදිතා | උපෙක්ඛා |

# ප්‍රථම දිසාව.

## පක්ෂ ප්‍රතිපක්ෂ යොජනා.

| | සංක්ලෙශ. | ව්‍යවදාන. |
|---|---|---|
| 1 | කබලිඞ්කාරො ආහාරො | දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා |
| 2 | අසුභෙ සුභන්ති විපල්ලාසො | පඨමජ්ඣානං |
| 3 | කාමුපාදානං | කායානුපස්සනා |
| 4 | කාමයොගො | දිබ්බො විහාරො |
| 5 | අභිජ්ඣා කාය ගන්ථො | අනුප්පන්නානං පාපකානං ධම්මානං අනුප්පාදාය වායාමො |
| 6 | කාමාසවො | මානප්පහානං |
| 7 | කාමොඝො | සච්චාධිට්ඨානං |
| 8 | රාගසල්ලං | ඡන්ද සමාධි |
| 9 | රූපූපගා විඤ්ඤාණට්ඨිති | ඉන්ද්‍රිය සංවරො |
| 10 | ඡන්දාගති ගමනං | මෙත්තා |

# ද්විතීය දිසාව.

| | සංක්ලෙශ. | ව්‍යවදාන. |
|---|---|---|
| 1 | ඵස්සාහාරො | දුක්ඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා |
| 2 | දුක්ඛෙ සුඛන්ති විපල්ලාසො | දුතියජ්ඣානං |
| 3 | සීලබ්බතුපාදානං | වෙදනානුපස්සනා |
| 4 | භව යොගො | බ්‍රහ්ම විහාරො |
| 5 | ව්‍යාපාද කායගන්ථො | උප්පන්නානං පාපකානං ධම්මානං පහානාය වායාමො |
| 6 | භවාසවො | ආලය සමුග්ඝාතො |
| 7 | භවොඝො | චාගාධිට්ඨානං |
| 8 | දොස සල්ලං | චිත්ත සමාධි |
| 9 | වෙදනුපගා විඤ්ඤාණට්ඨිති | තපො |
| 10 | දොසා අගති ගමනං | කරුණා |

# තෘතීය දිසාව.

| | 1. සංක්ලෙශ. | 2. ව්‍යවදාන |
|---|---|---|
| 1 | මනොසඤ්චෙතනාහාරො | සුඛා පටිපදා දන්ධාභිඤ්ඤා |
| 2 | අනත්තනි අත්තාති විපල්ලාසො | තතියජ්ඣානං |
| 3 | දිට්ඨුපාදානං | චිත්තානුපස්සනා |
| 4 | දිට්ඨියොගො | අරියො විහාරො |

| | | |
|---|---|---|
| 5 | පරාමාස කායගන්ථො | අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදය වායාමො |
| 6 | දිට්ඨාසවො | අවිජ්ජාපහානං |
| 7 | දිට්ඨොඝො | පඤ්ඤාධිට්ඨානං |
| 8 | දිට්ඨි සල්ලං | විරිය සමාධි |
| 9 | සඤ්ඤූපගා විඤ්ඤාණට්ඨිති | බුද්ධි |
| 10 | භයා අගති ගමනං | මුදිතා |

# චතුත්ථ දිසාව.

## පක්ෂ ප්‍රතිපක්ෂ යොජනා.

| | **සංක්ලේශ.** | **ව්‍යවදාන.** |
|---|---|---|
| 1 | විඤ්ඤාණාහාරො | සුඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා |
| 2 | අනිච්චෙ නිච්චන්ති විපල්ලාසො | චතුත්ථජ්ඣානං |
| 3 | අත්තවාදුපාදානං | ධම්මානුපස්සනා |
| 4 | අවිජ්ජා යොගො | ආනෙඤ්ජා විහාරො |
| 5 | ඉදං සච්චාභිනිවෙස කායගන්ථො | උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා භාවාය වායාමො |
| 6 | අවිජ්ජාසවො | සබ්බූපසමො |
| 7 | අවිජ්ජොඝො | උපසමාධිට්ඨානං |
| 8 | මොහ සල්ලං | වීමංසා සමාධි |
| 9 | සඞ්ඛාරූපගා විඤ්ඤාණට්ඨිති | සබ්බූපධිපටිනිස්සග්ගො |
| 10 | මොහා අගතිගමනං | උපෙක්ඛා |

සූත්‍රයෙහි **ආ ධර්ම** ලේසින් සතර දිසාවකට අයිතිදැයි සලකා බැලීම **දිසාවිලොචනය** නම් වන්නේය.

ඒ ධර්මය එම දිසාවට හරවා නය සංවර්ණනාවෙහි යෙදීම **අඞ්කුස**නම් වන්නේය. ඒ ධර්මය මෙහි සඳහන් සංක්ලේශ පක්ෂයෙහි ප්‍රථම දශකයට අයිති වීනම් සුභ සඤ්ඤා නම් මූල පදයෙහි අඩංගුවේ.

ද්විතීය දශකයට අයිතිවීනම් සුඛ සඤ්ඤා නම් මූල පදයෙහි අඩංගුවේ.

තෘතීය දශකයට අයිතිවීනම් අත්තසඤ්ඤා නම් මූලපදයෙහි අඩංගුවේ.

චතුර්ථ දශකයට අයිතිවීනම් නිච්ච සඤ්ඤා නම් මූල පදයෙහි අඩංගුවේ.

**ව්‍යවදාන පක්ෂයෙහි**

ප්‍රථම දශකයට අයිති වීනම් අසුභ සංඥා නම් මූලපදයෙහි අඩංගුවේ.

ද්විතීය දශකයට අයිති වීනම් දුක්ඛ සඤ්ඤා නම් මූලපදයෙහි අඩංගුවේ.

තෘතීය දශකයට අයිති වීනම් අනත්ත සඤ්ඤා නම් මූලපදයෙහි අඩංගුවේ.

චතුර්ථ දශකයට අයිති වීනම් අනිච්ච සඤ්ඤා නම් මූල පදයෙහි අඩංගුවේ.

මෙහි ප්‍රථම දිශාවට අයිති දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා මාර්ගයෙන් තෘෂ්ණා චරිත මෘදින්ද්‍රිය පුද්ගලයාද.

ද්විතීය දිශාවට අයිති දුක්ඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා මාර්ගයෙන් තෘෂ්ණා චරිත තීක්ෂ්ණෙන්ද්‍රිය පුද්ගලයාද.

තෘතීය දිශාවට අයිති සුඛා පටිපදා දන්ධාභිඤ්ඤා මාර්ගයෙන් දෘෂ්ටි චරිත මෘදින්ද්‍රිය පුද්ගලයාද.

චතුර්ථ දිශාවට අයිති සුඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා මාර්ගයෙන් දෘෂ්ටි චරිත තීක්ෂ්ණෙන්ද්‍රිය පුද්ගලයාද නිවන් ලබයි.

සීහ වික්කීළිත නයෙහි ගැනෙන යථොක්ත පුද්ගලයන් සතරදෙන තිපුක්ඛල නයෙහිදී තුන්දෙනෙක් වෙති. මේ කාරණෙන්ම උභය පක්ෂයෙහි දිශා සයක් වෙති.

එක් දිශාවකට ධර්ම දශය බැගින් ගත් කල උභය පක්ෂයෙහි ධර්ම සැටක් වෙති.

## තිපුක්ඛලනය.

### සංක්ලෙශ පක්ෂය

| | 1. දිසාව. | 2. දිසාව. | 3. දිසාව. |
|---|---|---|---|
| 1 | ලොභො අකුසල මූලං | දොසො අකුසල මූලං | මොහො අකුසල මූලං |
| 2 | සුඛවෙදනීයො ඵස්සො | දුක්ඛ වෙදනීයො ඵස්සො | අදුක්ඛමසුඛ වෙදනීයො ඵස්සො |
| 3 | සුඛා වෙදනා | දුක්ඛා වෙදනා | අදුක්ඛමසුඛාවෙදනා |
| 4 | සොමනස්සූපවිචාරො | දොමනස්සූපවිචාරො | උපෙක්ඛූප විචාරො |
| 5 | ලොභො | දොසො | මොහො |
| 6 | ලොභානුසයො | දොසානුසයො | මොහානුසයො |
| 7 | කාම විතක්කො | ව්‍යාපාද විතක්කො | විහිංසා විතක්කො |
| 8 | රාගජො පරිළාහො | දොසජො පරිළාහො | මොහජො පරිළාහො |
| 9 | උප්පාදො | ඨිති | වයො |
| 10 | දුක්ඛ දුක්ඛතා | විපරිනාම දුක්ඛතා | සංඛාර දුක්ඛතා |

## ව්‍යවදාන පක්‍ෂය.

| | 1. දිසාව. | 2. දිසාව. | 3. දිසාව. |
|---|---|---|---|
| 1 | අලොභො | අදොසො | අමොහො |
| 2 | සුතමයී පඤ්ඤා | චින්තාමයී පඤ්ඤා | භාවනාමයී පඤ්ඤා |
| 3 | සවිතක්ක සවිචාර සමාධි | අවිතක්ක අවිචාර මත්තො සමාධි | විතක්ක විචාරොසමාධි |
| 4 | අධිසීල සික්ඛා | අධිචිත්ත සික්ඛා | අධිපඤ්ඤා සික්ඛා |
| 5 | සමථ නිමිත්තං | පග්ගහ නිමිත්තං | උපෙක්ඛා නිමිත්තං |
| 6 | නෙක්ඛම්ම විතක්කො | අව්‍යාපාද විතක්කො | අවිහිංසා විතක්කො |
| 7 | අනඤ්ඤාතං ඤස්සාමීති ඉන්ද්‍රියං | අඤ්ඤින්ද්‍රියං | අඤ්ඤාතාවින්ද්‍රියං |
| 8 | සොමනස්සු පවිචාරො | දොමනස්සු පවිචාරො | උපෙක්ඛු පවිචාරො |
| 9 | කාමෙසනා | භවෙසනා | බ්‍රහ්ම චරියෙසනා |
| 10 | සීලක්ඛන්ධො | සමාධික්ඛන්ධො | පඤ්ඤාක්ඛන්ධො |

පක්‍ෂ ප්‍රතිපක්‍ෂ යොජනාව සිහවික්කිළිත නයෙහි දැක්වූ අනුසාර යෙන් යෙදිය යුත්තේය. මේ දිසා ධර්ම දසකයන්හි මුලපටන් අඛක පටිපාටියෙන් එක් ධර්මයක් ඊලඟ සඳහන් අනික් ධර්මයාගේ පරිපූර්තියට උපකාරවේ.

සංක්ලෙශ පාක්‍ෂික දසකත්‍රයෙහි පිළිවෙළින් කවර ධර්මයක් වුවද ලොභ දෙස මොහ යන මූල පදයන්හි අඩංගුවේ.

එසේම ව්‍යවදාන පාක්‍ෂික දශකත්‍රයෙහි පිළිවෙළින් කවර ධර්මයක් වුවද අලොභ අදෙස අමොහ යන මූල පදයන්හි අඩංගුවේ.

සූත්‍රාගත ධර්මයන් කවර මූල පදයක අඩංගුවේදැයි බැලීම දිසා විලොචනයයි.

ඒ ධර්මය එම දිසාවට හරවා නය සංවර්ණනාවෙහි යෙදීම අඞ්කුස නයයි සිහවික්කිළිත නයෙහි සතර දිසාවට අයත්වූ ධර්මයන් තිපුක්ඛල නයෙහි තුන් දිසාවට යොදා ගැණීමද තිපුක්ඛලනයෙහි තුන් දිසාවන්ට අයත්වූ ධර්මයන් නන්දියාවට්ටනයෙහි දෙදිසාවන්ට යොදා ගැනීමද අඞ්කුස නම් වන්නේය.

යම්සේ ඇත්ගොව්වා විසින් අකුස්සෙන් ඇතු තමා අභිමත දිශාවට හරවා ගනු ලැබේද. එසේම ධර්ම දෙශකයා විසින් අඞ්කුස නයින් සූත්‍රාගත ධර්ම නයත්‍රයාන්තගීත ඒ ඒ දිශාවන්ට හරවාගනු ලැබේ.

තිපුක්ඛලනයෙහි ප්‍රථම දිසාවේ අවසානය අප්‍රණිහිත විමොක්ෂයයි ද්විතීය දිසාවේ අවසානය සුඤ්ඤත විමොක්ෂයයි තෘතීයදිසාවේ අවසානය අනිමිත්ත විමොක්ෂයයි පෙටකොපදෙශයෙහි තිපුක්ඛල නයෙහි සංක්ලෙශ පක්ෂයෙහි ධර්මත්‍රික නවයක්ද ව්‍යවදාන පක්ෂයෙහි ධර්මත්‍රික දශයක්ද දක්වන ලදහ. ඒ මෙසේයි.

## සංක්ලෙශ පක්ෂය.

| | 1. දිසාව. | 2. දිසාව. | 3. දිසාව. |
|---|---|---|---|
| 1 | ලොභො අකුසල මූලං | දොසො අකුසල මූලං | මොහො අකුසල මූලං |
| 2 | සුඛවෙදනීයො ඵස්සො | දුක්ඛ වෙදනීයො ඵස්සො | අදුක්ඛම සුඛ වෙදනීයො ඵස්සො |
| 3 | සුඛා වෙදනා | දුක්ඛා වෙදනා | අදුක්ඛම සුඛා වෙදනා |
| 4 | සොමනස්සො පවිචාරො | දොමනස්සො පවිචාරො | උපෙක්ඛා පවිචාරො |
| 5 | රාගො | දොසො | මොහො |
| 6 | කාම විතක්කො | ව්‍යාපාද විතක්කො | විහිංසා විතක්කො |
| 7 | රාගජො පරිළාහො | දොසජො පරිළාහො | මොහජො පරිළාහො |
| 8 | උප්පාදො | ඨිති | වයො |
| 9 | දුක්ඛවෙදනා | විපරිනාමවෙදනා | සංඛාර වෙදනා |

## ව්‍යවදාන පක්ෂය.

| | 1. දිසාව. | 2. දිසාව. | 3. දිසාව. |
|---|---|---|---|
| 1 | අලොභො කුසල මූලං | අදොසො කුසල මූලං | අමොහො කුසල මූලං |
| 2 | සුතමයී පඤ්ඤා | චින්තාමයී පඤ්ඤා | භාවනාමයී පඤ්ඤා |
| 3 | සවිතක්ක සවිචාරො සමාධි | අවිතක්ක විචාර මත්තො සමාධි | අවිතක්ක අවිචාරො සමාධි |
| 4 | අධිසීල සික්ඛා | අධිචිත්ත සික්ඛා | අධිපඤ්ඤා සික්ඛා |
| 5 | සමථ නිමිත්තං | පග්ගහ නිමිත්තං | උපෙක්ඛා නිමිත්තං |
| 6 | නෙක්ඛම්ම විතක්කො | අව්‍යාපාද විතක්කො | අවිහිංසා විතක්කො |
| 7 | අනඤ්ඤාතඤ්ඤස්සාමීති ඉන්ද්‍රියං | අඤ්ඤින්ද්‍රියං | අඤ්ඤාතාවින්ද්‍රියං |

| | | | |
|---|---|---|---|
| 8 | සොමනස්සො පරිවාරෙ | දොමනස්සො පරිවාරෙ | උපෙක්ඛා පරිවාරෙ |
| 9 | කාමෙසනා | භවෙසනා | බ්‍රහ්ම චරියෙසනා |
| 10 | සීලක්ඛන්ධො | සමාධික්ඛන්ධො | පඤ්ඤාක්ඛන්ධො |

නෙත්තිප්පකරණයෙහි උභය පක්ෂයෙහි ත්‍රික දොළස බැගින් දක්වන ලදහ. ඒ මෙසේයි.

## සංක්ලේශ පක්ෂය.

| | 1. දිසාව. | 2. දිසාව. | 3. දිසාව. |
|---|---|---|---|
| 1 | ලොභො අකුසල මූලං | දොසො අකුසල මූලං | මොහො අකුසල මූලං |
| 2 | කාය දුච්චරිතං | වචී දුච්චරිතං | මනො දුච්චරිතං |
| 3 | කාම විතක්කො | ව්‍යාපාද විතක්කො | විහිංසා විතක්කො |
| 4 | කාම සඤ්ඤා | ව්‍යාපාද සඤ්ඤා | විහිංසා සඤ්ඤා |
| 5 | නිච්ච සඤ්ඤා | සුඛ සඤ්ඤා | අත්ත සඤ්ඤා |
| 6 | සුඛා වෙදනා | දුක්ඛා වෙදනා | අදුක්ඛම සුඛා වෙදනා |
| 7 | දුක්ඛ දුක්ඛතා | විපරිණාම දුක්ඛතා | සඞ්ඛාර දුක්ඛතා |
| 8 | රාගග්ගි | දොසග්ගි | මොහග්ගි |
| 9 | රාගසල්ලො | දොස සල්ලො | මොහ සල්ලො |
| 10 | රාග ජටා | දොස ජටා | මොහ ජටා |
| 11 | අකුසල කාය කම්මං | අකුසල වචීකම්මං | අකුසල මනො කම්මං |
| 12 | සීල විපත්ති | දිට්ඨි විපත්ති | ආචාර විපත්ති |

## වොදාන පක්ෂය.

| | 1. දිසාව. | 2. දිසාව. | 3. දිසාව. |
|---|---|---|---|
| 1 | අලොභො කුසල මූලං | අදොසො කුසල මූලං | අමොහො කුසල මූලං |
| 2 | කාය සුචරිතං | වචී සුචරිතං | මනො සුචරිතං |
| 3 | නෙක්ඛම්මවිතක්කො | අව්‍යාපාද විතක්කො | අවිහිංසා විතක්කො |
| 4 | සවිතක්ක සවිචාරො සමාධි | අවිතක්ක විචාර මත්තා සමාධි | අවිතක්කො අවිචාරො සමාධි |
| 5 | නෙක්ඛම්ම සඤ්ඤා | අව්‍යාපාද සඤ්ඤා | අවිහිංසා සඤ්ඤා |
| 6 | අනිච්ච සඤ්ඤා | දුක්ඛ සඤ්ඤා | අනත්ත සඤ්ඤා |
| 7 | කුසලං කායකම්මං | කුසලං වචීකම්මං | කුසලං මනොකම්මං |
| 8 | [illegible]වෙය්‍යං | වචීසො වෙය්‍යං | මනොසො වෙය්‍යං |
| 9 | සීල සම්පත්ති | සමාධි සම්පත්ති | පඤ්ඤා සම්පත්ති |

| | | | |
|---|---|---|---|
| 10 | අධිසීල සික්ඛා | අධිචිත්ත සික්ඛා | අධිපඤ්ඤා සික්ඛා |
| 11 | සීලක්ඛන්ධො | සමාධික්ඛන්ධො | පඤ්ඤාක්ඛන්ධො |
| 12 | සුඤ්ඤතං විමොක්ඛ මුඛං | අනිමිත්තං විමොක්ඛ මුඛං | අප්පනිහිතං විමොක්ඛ මුඛං |

නෙත්තිප්පකරණයෙහි සඳහන් දෙලොස් ත්‍රිකයන් අතුරෙන් රාග සල්ලං දෝස සල්ලං මොහ සල්ලං යන ත්‍රිකය හැරදමා සෙසු එකොළොස නෙත්ති රතනාකරයෙහි දක්වා තිබේ. ව්‍යවදාන පක්ෂයෙහි නෙත්තිප්පකරණයෙහි දක්වූ දෙළොස් ත්‍රිකයන් එසේම දක්වා තිබේ. මෙහි සල්ල ත්‍රිකය අතහැරීම ප්‍රමාදයකින් වූවකැයි හඟිමු.

සීහ වික්කීළිත නයෙහි ගැණෙන පුද්ගලයන් සතරදෙන තිපුක්ඛල නයෙහිදී තුන්දෙනෙකුන් වන්නාසේම තිපුක්ඛල නයෙහි ගැණෙන උද්ඝටිතඤ්ඤ විපඤ්චිතඤ්ඤ නෙය්‍ය යන පුද්ගලයෝ තුන්දෙන නන්දියාවට්ට නයෙහිදී තෘෂ්ණා චරිත දෘෂ්ටි චරිත වශයෙන් දෙදෙනෙක් වෙති. ඒ කාරණෙන්ම උභය පක්ෂයෙහි දිසා සතරෙකි. එක් දිසාවට ධර්ම දශය බැගින් ගතහොත් උභය පක්ෂයෙහි ධර්ම සතළිසෙකි.

සීහවික්කීළිත නයෙහි එක් එක් දිසාවට ධර්ම දශය බැගින් ධර්ම අසූවක් වූහ. තිපුක්ඛල නයෙහිදි ඔව්හු එක් එක් දිසාවට ධර්ම දශය බැගින් ධර්ම සැටක් තුළ ප්‍රවෙශවූහ.

ඒ ක්‍රමයෙන් නන්දියාවට්ටනයෙහිදී ඔව්හු එක් එක් දිසාවට ධර්ම දශය බැගින් ධර්ම සතළිසක් තුළ ප්‍රවෙශවිය යුතු නමුත් නෙත්තිප්පකරණ පාලියෙහි අදහමට එසේ වන බවක් නොපෙනේ නමුත් නෙත්ති අටුවාවෙහි සතළිසක් කොටම දක්වා තිබේ.

## නන්දියා වට්ටනය.

| සංක්ලෙශ පක්ෂය. | | ව්‍යවදාන පක්ෂය. | |
|---|---|---|---|
| 1. දිසාව. | 2. දිසාව. | 3. දිසාව. | 4. දිසාව. |
| අවිජ්ජා | තණ්හා | සමථො | විපස්සනා |
| අහිරිකං | අනොත්තප්පං | විජ්ජා | චරණං |
| අසති | අසම්පජඤ්ඤං | සති | සම්පජඤ්ඤං |
| නීවරණානි | සංයොජනානි | හිරි | ඔත්තප්පං |
| අජ්ඣොසානං | අභිනිවෙසො | අහඞ්කාරප්පහාණං | මමඞ්කාරප්පහාණං |
| අහඞ්කාරො | මමඞ්කාරො | සම්මා වායාමො | යොනිසො |
| අසංවරං | දොවචස්සතා | | මනසිකාරො |

| | | | |
|---|---|---|---|
| කොසජ්ජං | අයොනිසො මනසිකාරො | සම්මා සති | සම්මා සමාධි |
| | | පස්සද්ධි | නිබ්බිදා |
| විචිකිච්ඡා | අභිජ්ඣා | සමාපත්ති | සද්ධම්ම සවණං |
| අසද්ධම්ම සවණං | අසමාපත්ති | සොමනස්සං | ධම්මානු ධම්ම පටිපත්ති |

මෙසේ අටුවාවෙහි ධර්ම සතළිසක් දක්වා තිබෙන නමුත් සිහළාක්ෂ-ලිත තිපුස්කොළ දෙකයෙහි මෙන් පක්ෂ ප්‍රතිපක්ෂනයෙහි ලා බලනවිට උද්දිෂ්ට ක්‍රමයෙන් යෙදෙන බවක් නොපෙනේ. දිසා පිළිවෙළින් යෙදෙන බවද නොපෙනේ. මෙසේ මේ සංක්ලේශ ව්‍යවදාන ධර්මයන්ගේ අවුල් බවක් ඇති හෙයින් මෙයට නන්දියාවට්ටයයි නම් කරණ ලද බැව් ඇතැම් ඇදුරන්ගේ මතයකි.

නෙත්ති අටුවාචාර්යයන් විසින් ගරුකොට සලකන ලද්දවූද නෙත්තිප්පකරණයට වඩා පැරණිවූද පෙටකොපදෙශයෙහි නන්දියාවට්ටනයෙහි දක්වන ලද ධර්ම සතළිස නෙත්ති අටුවාවෙහි එසේ ම සඳහන්ව තිබේ.

මුද්‍රිත නෙත්ති අටුවාවෙහි අභිජ්ඣා යනු අවිජ්ජායයි සඳහන්ව ඇත. එය අප පාඨයකැයි ගනිමු.

නෙත්ති විභාවිනී නම් ටීකාවෙහි නන්දියාවට්ටනයෙහි සංක්ලේශ පක්ෂයෙහි ප්‍රථම ද්විතීය දිසා වශයෙන් අවිජ්ජා තණ්හාදී පසළොස් ද්වකයන් වෙතියි කියන ලද නමුදු නෙත්තිප්පකරණ පෙළෙහි පෙනෙන්නේ ප්‍රථම දිසාවෙහි ධර්ම තුදුසක් හා දෙවන දිසාවෙහි ධර්ම පසළොසකි. **ඒ මෙසේයි.**

## සංක්ලේශ පක්ෂය.

| 1. දිසාව. | 2. දිසාව. |
|---|---|
| 1 තණ්හා | 1 අවිජ්ජා |
| 2 අහිරිකං | 2 අනොත්තප්පං |
| 3 අසති | 3 අසම්පජඤ්ඤං |
| 4 අයොනිසො මනසිකාරො | 4 කොසජ්ජං |
| 5 අහඞ්කාරො | 5 දොවචස්සතා |
| 6 අසද්ධා | 6 මමඞ්කාරො |
| 7 අසද්ධම්ම සවණං | 7 පමාදො |
| 8 අභිජ්ඣා | 8 අසංවරො |
| 9 නීවරණානි | 9 ව්‍යාපාදො |
| 10 කොධො | 10 සංයොජනානි |

| | | | |
|---|---|---|---|
| 11 | මක්ඛො | 11 | උපනාහො |
| 12 | ඉස්සා | 12 | පලාසො |
| 13 | මායා | 13 | මච්ඡරියං |
| 14 | සස්සත දිට්ඨි | 14 | සාඨෙය්‍යං |
| | | 15 | උච්ඡෙද දිට්ඨි |

එසේම එම ටීකාවෙහි ව්‍යවදාන පක්ෂයෙහි දිසා දෙක්හි සමථ විපස්සනාදී වශයෙන් දුක එකුන් විස්සක් වෙතියි කියන ලද නමුත් නෙත්තිප්පකරණ පෙළෙහි පෙණෙන්නේ අටළොස් දුකයකි. ඒ මෙසේයි.

## ව්‍යවදාන පක්ෂය.

| | 1. දිසාව. | 2. දිසාව. |
|---|---|---|
| 1 | සමථො | විපස්සනා |
| 2 | හිරි | ඔත්තප්පං |
| 3 | සති | සම්පජඤ්ඤං |
| 4 | යොනිසො මනසිකාරො | විරියාරම්භො |
| 5 | සොවචස්සතා | ධම්මෙ ඤාණං |
| 6 | අත්ථෙ ඤාණං | ඛයෙ ඤාණං |
| 7 | අනුප්පාදෙ ඤාණං | සද්ධා |
| 8 | අප්පමාදො | සද්ධම්මසවණං |
| 9 | සංවරො | අනභිජ්ඣා |
| 10 | අව්‍යාපාදො | රාග විරාගා චෙතො විමුත්ති |
| 11 | අවිජ්ජා විරාගා පඤ්ඤා විමුත්ති | අභිසමයො |
| 12 | අප්පිච්ඡතා | සන්තුට්ඨිතා |
| 13 | අක්කොධො | අනුපනාහො |
| 14 | අමක්ඛො | අපලාසො |
| 15 | ඉස්සාපහාණං | මච්ඡරිය පහාණං |
| 16 | විජ්ජා | විමුත්ති |
| 17 | සඞ්ඛතාරම්මණො විමොක්ඛො | අසඞ්ඛතාරම්මණො විමොක්ඛො |
| 18 | සඋපාදිසෙසා නිබ්බාණ ධාතු | අනුපාදිසෙසා නිබ්බාණ ධාතු |

“තණ්හා අවිජ්ජාචාති ආදිනා සංකිලෙසපක්ඛෙ තණ්හා විජ්ජා දුකාදීනං පණ්ණරසන්නං දුකානං වීසන්නං තණ්හා චරිත දිට්ඨි චරිතානං පුග්ගලානං සංකිලෙසොති විභාවන මුඛෙන යානි ධාරණා කතා” සමථොච විපස්සනාචාති. ආදිනා වොදානපක්ඛෙ සමථ විපස්සනා දුකාදීනං එකූන

විසතිද්දසානං චීනානං තණ්හාවරිත දිඨිචරිතානං පුග්ගලානං වොදනභාගි
වීභාවන මූබෙන යානිඹාරණා සතා අයං චතනපපකාරා නන්දියාවටටසස
නයසස භූමීතිපි. නිහරිතබ්බායොජෙතබ්බා" – නෙතනි විභාවනි.

නෙතතිරතනාකරයෙහි නන්දියාවටට සංකෙලශ පක්ෂය නෙතතිප්ප
කරණයෙහි මෙනි. ව්‍යවදාන පක්ෂයෙහි බමය සඳණං යන්න අතහැර
දමා තිබේ. එය ප්‍රමාදයකින් වූවකැයි හගිමු.

**මූල පදයන්ගේ අනු ප්‍රවේශය.**

**නන්දියාවටටයෙහි** සංකෙලශ පක්ෂයෙහි **තණ්හා** අවිජ්ජාසිද
ව්‍යවදාන පක්ෂයෙහි **සමථො විපසසනාසිද** මූල පද සතරෙකි.
මේ පද සතරෙහි අටළොස් මූල පදයෝ ඇතුළත් වෙත්.

කෙසේදයත්:-

**තණ්හා ලොභ දෙස සුභසඤ්ඤා සුඛසඤ්ඤා** යන අකුසල පක්ෂ
යෙහි මූල පද පස **තෘෂ්ණා** වෙහිම ඇතුලත් වෙති. **අවිද්‍යා මෝහ
නිච්ච සඤ්ඤා අත්තසඤ්ඤා** යන අකුසල පක්ෂයෙහි මූල පද සතර
**අවිද්‍යාවෙහිම** ඇතුලත් වෙති.

**සමථ අලොභ අදෙස අසුභසඤ්ඤා දුක්ඛසඤ්ඤා** යන කුසල
පක්ෂයෙහි මූලපද පස **සමථයෙහිම** ඇතුලත් වෙති.

**විදර්ශනා අමෝහ අනිච්චසඤ්ඤා අනත්ත සඤ්ඤා** යන කුසල පක්ෂ
යෙහි මූලපද සතර **විදර්ශනාවෙහිම** ඇතුලත් වෙති.

මෙසේ කුසල් නව පදය **සමථ විදර්ශනා** දෙක්හිද – අකුසල් නව
පදය තෘෂ්ණා අවිද්‍යා දෙක්හිද ඇතුලත්වීමට යෙත්.

මෙසේ **තිපුක්ඛල**නයද **සීහවික්කීළිත**නයද **නන්දියාවටට**නයෙහිම
අනුප්‍රවේශවන **පරිදි** දතයුත්තේය.

තිපුක්ඛලනයෙහි සංකෙලශ පක්ෂයෙහි **ලොභ දෙස මොහසිද**
ව්‍යවදාන පක්ෂයෙහි **අලොභ අදෙස අමොහසිද** මූලපද සයෙකි.
අටළොස් මූලපදයෝ මේ සයෙහි ඇතුලත් වෙත්.

කෙසේදයත්:-

**ලොභ තණ්හා සුභසඤ්ඤා සුඛසඤ්ඤා** යන අකුසල පක්ෂයෙහි
මූලපද සතර ලොභයෙහිම ඇතුලත් වෙති.

**අවිද්‍යාමොහ නිච්ච සඤ්ඤා අනත්තසඤ්ඤා** යන අකුසල පක්ෂයෙහි
මූලපද සතර මොහොයෙහිම ඇතුලත් වෙති. **දෙසය දෙසයමැයි**

**විපසසනා අමොහ අනිච්ච සඤ්ඤා අනත්ත සඤ්ඤා** යන කුසල
පක්ෂයෙහි මූලපද සතර අමොහයෙහිම ඇතුලත් වෙති.

සමථ අලෝභ අසුභසඤ්ඤා දුක්ඛ සඤ්ඤා යන කුසල පක්ෂයෙහි මූලපද සතර අලෝභයෙහිම ඇතුළත් වෙති. අදෝසය අදෝසය මැයි.

මෙසේ අකුසල් නව පදය ලෝභ දෝස මෝහ යන තුනෙහිද කුසල් නව පදය අලෝභ අදෝස අමෝහ යන තුනෙහිද ඇතුළත් වීමට යෙත්. මෙසේයින් නන්දියාවට්ට නයද සීහවික්කීළිත නයද තිපුක්ඛල නයෙහිම අනුප්‍රවේශ වන පරිදි දතයුත්තේය.

සීහවික්කීළිත නයෙහි සංක්ලේශ පක්ෂයෙහි සුභසඤ්ඤා සුඛ සඤ්ඤා නිච්චසඤ්ඤා අත්තසඤ්ඤාසිද ව්‍යවදාන පක්ෂයෙහි අසුභසඤ්ඤා දුක්ඛ සඤ්ඤා අනිච්ච සඤ්ඤා අනත්ත සඤ්ඤාසිද මූලපද අටකි. අටලොස් මූල පදයෝ මේ අටෙහිම ඇතුළත් වෙති.

සංක්ලේශ පක්ෂයෙහි තෘෂ්ණා සුභසංඥා යන දෙක සුභසඤ්ඤාවෙහිම ඇතුළත් වෙති. ලෝභ සුඛසඤ්ඤා යන දෙක සුඛසඤ්ඤාවෙහිම ඇතුළත් වෙති.

අවිද්‍යා නිත්‍ය සංඥා යන දෙක නිත්‍ය සංඥාවෙහිම ඇතුළත් වෙති. දෝස මෝහ අත්තසඤ්ඤා යන තුන අත්තසඤ්ඤාවෙහිම ඇතුළත් වෙති.

ව්‍යවදාන පක්ෂයෙහි සමථ අසුභ සඤ්ඤා යන දෙක අසුභ සඤ්ඤාවෙහිම ඇතුළත් වෙති.

අලෝභ දුක්ඛසඤ්ඤා යන දෙක දුක්ඛ සඤ්ඤාවෙහිම ඇතුළත් වෙති.

විදර්ශනා අනිත්‍යසංඥා යන දෙක අනිත්‍ය සංඥාවෙහිම ඇතුළත් වෙති

අදෝස අමෝහ අනත්ත සඤ්ඤා යන තුන අනත්ත සංඥාවෙහිම ඇතුළත් වෙති.

මෙසේ අකුසල් නවපදය විපර්යාස සතරෙහිද කුසල් නව පදය සතිපට්ඨාන සතරෙහිද ඇතුළත් වීමට යෙත්. මෙසෙයින් සීහවික්කීළිත නයෙහි තිපුක්ඛල නයද නන්දියාවට්ට නයද ඇතුළත් වන පරිදි දත යුත්තේය.

මේ අනුප්‍රවේශයෙහි දෝස අදෝසයෝ මුද්‍රිත නෙත්තිප්පකරණ අටුවාවෙහි අතහැර දමා තිබෙන නමුත් අකුසල් නව පදය විපර්යාස සතරෙහිද කුසල් නව පදය සතිපට්ඨාන සතරෙහිද ඇතුළත් වෙතියි කියා තිබේ.

දෝසය අත්තසඤ්ඤාවටද අදෝසය අනත්ත සඤ්ඤාවටද අපගේ මතයෙන් ඇතුළත් කරනලදහ. ධම්ධරයෝ විමසා බලාගනිත්වා. විතීගීම නයේහි සංක්ලේශ පක්ෂයෙහි- තෘෂ්ණා අවිද්‍යාවන් ලෝභ දෝස මෝහ

වශයෙන්ද ව්‍යවදාන පක්ෂයෙහි සමථ විදර්ශනාවන් අලෝභ අද්වේෂ අමෝහ වශයෙන්ද බෙදීයාමෙන් නන්දියාවට්ට නයින් තිපුක්ඛල නය තිගීම වන්නේය. තවද සංක්ලේශ පක්ෂයෙහි ලෝභය සුභසඤ්ඤා සුඛසඤ්ඤා වශයෙන් බෙදීයාමෙන්ද ද්වේෂය හා මෝහය නිච්ච සඤ්ඤා අත්තසඤ්ඤා වශයෙන් බෙදීයාමෙන්ද ව්‍යවදාන පක්ෂයෙහි අලෝභය අසුභසඤ්ඤා දුක්ඛ සඤ්ඤා වශයෙන් බෙදීයාමෙන්ද තිපුක්ඛල නයින් සීහවික්කීළිත නය තිගීම වන්නේය. සංක්ලේශ පක්ෂයෙහි තෘෂ්ණාව සුභසඤ්ඤා, සුඛසඤ්ඤා වශයෙන්ද අවිද්‍යාව නිත්‍යසංඥා, ආත්මසංඥා, වශයෙන්ද ව්‍යවදාන පක්ෂයෙහි සමථය අසුභ සඤ්ඤා දුක්ඛසඤ්ඤා වශයෙන්ද විදර්ශනාව අනිත්‍ය සංඥා අනාත්ම සංඥා වශයෙන්ද බෙදීයාමෙන් නන්දියාවට්ට නයින් සීහවික්කීළිත නය තිගීම වන්නේය. එක් එක් නයක කුසල ධර්මය හෝ අකුසල ධර්මය දැනගත් කල්හි ප්‍රතිපක්ෂ ධර්මය සෙවිය යුත්තේය ප්‍රතිපක්ෂය සොයා ඒ නය දැක්විය යුත්තේය. එක් එක් ධර්මයක් දැනගත් කල්හි සියළු ධර්මයෝ දැනගත්තාහු වෙති.

මේ තුන් නයයන් අතුරෙහි සීහ වික්කීළිත නයෙහි කෙළවර සතර ඵලයෝයි. ප්‍රථම දිසාවෙහි ප්‍රථම ඵලයද දෙවන දිසාවෙහි දෙවන ඵලයද තුන්වන දිසාවෙහි තුන්වන ඵලයද සතර වන දිසාවෙහි සතර වන ඵලයද පර්‍යවසානය වන්නේය.

තිපුක්ඛලනයෙහි කෙළවර ත්‍රිවිධ විමෝක්ෂයයි. ප්‍රථම දිසාවෙහි අප්‍රණිහිත විමෝක්ෂයද දෙවන දිසාවෙහි සුඤ්ඤත විමෝක්ෂයද තුන් වන දිසාවෙහි අනිමිත්ත විමෝක්ෂයද පර්‍යවසානය වන්නේය.

නන්දියාවට්ටනයෙහි කෙළවර චතෝවිමුක්තීවයකි. ප්‍රථම දිසාවෙහි චේතො විමුක්තියද දෙවන දිසාවෙහි ප්‍රඥා විමුක්තියද පර්‍යවසානය වන්නේය. මේ තුන් නයෙහි අටළොස් මූල පදයන් සලකා බැලීම දිසාලෝචන නය නම් වේ. එසේ බලා කුසල පක්ෂයෙහිද අකුසල පක්ෂයෙහිද මේ ධර්මය තෙමේ මෙනම් ධර්මය භජනය කෙරේයයි දැනගෙන යෙදීම අඞ්කුසනය නම් වන්නේය.

— මෙසේ නය පස දතයුත්තේය —

දැන් ඉහත සඳහන් කළ සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො යනාදී ගාථාවෙහි නය සංවර්ණනාව දැක්විය යුතු වන්නේය.

නරොස පඤ්ඤො යනුවෙන් දක්වන ලද විනෙය පුද්ගලයා තෘෂ්ණා චරිත හෝ වන්නේය. දෘෂ්ටි චරිත හෝ වන්නේය. ඔහු දෙදෙන නැවත මන්ද උදත්ථ වශයෙන් විවිධ වෙත්. තෘෂ්ණා චරිත මන්ද පුද්ගලයා දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා වෙන්ද, තෘෂ්ණා චරිත උදත්ථ පුද්ගලයා දුක්ඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා වෙන්ද දෘෂ්ටි චරිත මන්ද

පුද්ගලයා සුඛා පටිපදා දන්ධාභිඤ්ඤාවෙන්ද දෘෂ්ටි චරිත උදඝටිතඥ පුද්ගලයා සුඛා පටිපදා ඛිප්පාභිඤ්ඤාවෙන්ද විනෙය වෙත්.

සීලෙ පතිට්ඨාය යනුවෙන් දක්වන ලද සීලය ඉන්ද්‍රිය සංවරය හා තපසද වෙයි. එය පිළිවෙළින් කායානුපස්සනා, වෙදනානුපස්සනා, සතිපට්ඨානයන්හි ඇතුළත් වෙති.

එය තෘෂ්ණා චරිත මන්ද උදඝටිත පුද්ගලයන් දෙදෙනාගේ විනය නය උපාය වූ පළමු වන දෙවන ප්‍රතිපදාවෝයි.

චිත්ත භාවනාව නම් චිත්තානුපස්සනා සතිපට්ඨානයයි.

ප්‍රඥා භාවනාව නම් ධම්මානුපස්සනා සතිපට්ඨානයයි.

ඒ දෙක දෘෂ්ටි චරිත මන්ද උදඝටිත දෙදෙනාගේ විනය නය උපායවූ තුන්වන සතර වන ප්‍රතිපදාවෝයි. මේ චතුර්විධ ප්‍රතිපදාවන්ගේ පයඊවසානවූ සතර ඵලය නිරොධ සත්‍යයයි. සතර ප්‍රතිපදාවෝ මාර්ග සත්‍යයයි සතර සතිපට්ඨානයන්ගෙන් ප්‍රහීණ කරණු ලබන්නාවූ සතර විපයඊාස ධර්මයෝ සමුදය සත්‍යයයි. විනෙය පුද්ගලයෝ සතරදෙන දුක්ඛ සත්‍යයයි. මේ ජටා සූත්‍රය පිළිබඳ සීහ වික්කීළිත නම් නයයි.

තරොසපෙක්ඛ යනුවෙන් දක්වන ලද විනෙය පුද්ගලයා උදඝටිතඥ විපඤ්චිතඥ නෙය්‍ය යි ත්‍රිවිධවේ.

සීලෙ පතිට්ඨාය යනුවෙන් දක්වන ලද අධි ශීලය නෙය්‍ය පුද්ගලයාගේ විනය නය උපායයි චිත්තං භාවයං යනුවෙන් දක්වන ලද අධිචිත්ත ශික්ෂාව විපඤ්චිතඥ පුද්ගලයාගේ විනයනය උපායයි. පඤ්ඤං භාවයං යනුවෙන් දක්වනලද අධිප්‍රඥා ශික්ෂාව උද්ඝටිතඥ පුද්ගලයාගේ විනයනය උපායයි. අධිශීල ශික්ෂාව අලොභ කුසල මූලයයි අධිචිත්ත ශික්ෂාව අදෙ‍ස කුසල මූලයයි අධිප්‍රඥා ශික්ෂාව අමොහ කුසල මූලයයි ත්‍රිවිධ කුසල මූලයන්ගේ පයඊවසානවූ ත්‍රිවිධ විමොක්ෂයෝ නිරොධ සත්‍යයයි. කුසල මූලයෝ මාර්ග සත්‍යයයි. කුසල මූලයන්ගෙන් ප්‍රහිය මානවූ අකුසල මූලයෝ සමුදය සත්‍යයයි. විනෙයවූ ත්‍රිවිධ පුද්ගලයෝ. දුක්ඛ සත්‍යයයි. මේ ජටා සූත්‍රය පිළිබඳවූ තිපුක්ඛල නම් නයයි. තරොසපෙක්ඛ යනුවෙන් දක්වන ලද විනෙය පුද්ගලයා තෘෂ්ණා චරිත දෘෂ්ටි චරිත වශයෙන් ද්විවිධවේ. චිත්තං භාවයං යනුවෙන් දක් වන ලද සමථය තෘෂ්ණා චරිතයාගේ විනය නය උපායයි. පඤ්ඤං භාවයං යනුවෙන් දක්වන ලද විදර්ශනාව දෘෂ්ටි චරිතයාගේ විනය නය උපායයි. සමථ විදර්ශනාවන්ගේ පයඊව සානවූ චෙතොවිමුත්ති පඤ්ඤාවිමුත්තීහු නිරොධ සත්‍යයයි. සමථ විදර්ශනාවෝ මාර්ග සත්‍යයයි. තෘෂ්ණාදෘෂ්ටීහු සමුදය සත්‍යයයි. තෘෂ්ණා චරිත දෘෂ්ටිචරිත පුද්ගලයෝ දුක්ඛ සත්‍යයයි.

ජටා සූත්‍රය පිළිබඳ වූ නන්දියාවට්ට නම් නයයි.

පාවචන න්‍යායයෙහි

— න්‍යාය විභාග නම් වූ ද්විතීය විභාගය නිමි. —

හදයෙ සුතිපුණ්ණසාර
ඤාව ගාහිය බුද්ධිනා
වායා මෙතෙව පත්තබ්බො
සො විභාගො පදස්සිතො.

චිරං පාවචනං සෙට්ඨං සුද්ධං සම්මා පවත්තතු.
නරාමරානං හිතදං අසෙසානය මණ්ඩිතං.
සබ්බෙ සත්තා සුඛිහොන්තු සදා පාවචනානුගා
සබ්බදෙසා සුභික්ඛාව හොන්තු ධම්මෙන පාලිතා.



